# MAYŪRA SANDESAYA.

**A SINHALESE POEM**

COMPOSED BY

## PANDIT KAVISWARA

*A GRAND-SON OF ACHARYA GURULUGOMI*

# මයූරසන්දේශය.

ආචාර්ය්‍ය වැලිඅමුණුවිල

දීපඞ්කරසථවිරසවාමීන් විසින්

කරවදල

අභිනව පදව්‍යාඛ්‍යානයෙන්

සංකාශීකෘතයි.

PRINTED AT

VIDYASAGARA PRINTING WORKS

**COLOMBO.**

**1910**

මිල සත 50 යි. PRICE 50 CENTS.

# MAYŪRA SANDESAYA.

*A SINHALESE POEM*

COMPOSED BY

PANDIT KAVISWARA

*A GRAND-SON OF ACHARYA GURULUGOMI*

AND

EDITED WITH A PARAPHRASE BY

Rev. W. DEEPANKARA SWAMI

AT THE REQUEST

OF

JOHN DE SILVA ESQ.

*Proctor; S. C.*

**COLOMBO.**

*PUBLISHED*

BY

**H. B. E. JINADASA**

OF

KOTAHENA, COLOMBO.

PRINTED AT

VIDYASAGARA PRINTING WORKS, COLOMBO.

**1910**

පූජ්‍යාචාර්ය ගුරුළු ගෝමීන්ගේ නප්තෘවූ

කවිකුලතිලකායමාන

# කවීශ්වරනම් කවිහු විසින්

රචනාකරනලද

# මයූර සන්දේශය.

---

කොළඹ

**සුප්‍රිම් උසාවියේ නීතිඥධුරන්ධර**

පශ්චිම සෛංහලීය සඞ්ගීත ශාස්ත්‍රාචාර්ය

ජෝර්ජ් ද සිල්වා නීතිඥමහාශ්‍රීපාදයන් විසින්

ව්‍යාපාරිත වූ

**ආචාර්ය වැලිපටන්විල**

දීපඞ්කරස්ථවිරස්වාමීන්වහන්සේ

විසින්

කාලාන්තරසඤ්ජාතදෝෂාපහරණයෙන් සංශෝධිතව

ලියනලද

**අභිනව පදව්‍යාඛ්‍යානයෙන්**

සමුපලක්ෂිතයි.

---

කොළඹ කොටහේනේ

එච්. බි. ඊ. ජිනදාස මහතා විසින්

මුද්‍රණයකරවනලදී.

කොළඹ

*විද්‍යාසාගරයන්ත්‍රාලයෙහි*

මුද්‍රිතයි.

**ශ්‍රී. බු. ව. 2454.**

# දැ න් වී ම යි.

ලක්දිව ශ්‍රේෂ්ඨපණ්ඩිතයන් විසින් පූජ්‍යස්ථානයෙහි තබන ලදුවවැජඹෙන සියලුකාව්‍යරසයෙන් පරිපූර්ණවූ කවියෙන් තැනූ සකල සන්දේශගත්ගේ පූර්වරූපයක්වන සුප්‍රසිද්ධ මයූරසන්දේශයට සිංහල ව්‍යාඛ්‍යානයක් ප්‍රාර්ථනාකෙරෙමින් වසන අතර අපගේද සව්‍යාකරණ සිංහල භාෂොද්‍රග්‍රහණයෙහි කලක් ආචාර්‍ය්‍යත්වයෙහි තබා පුදනුලැබූ උගත් **ආචාර්‍ය්‍ය වැලිපටන්විල දීපඞ්කර ස්ථවිර ස්වාමීන්වහන්සේ** විසින් නිපදවා වදාළ ප්‍රශස්තතර ව්‍යාඛ්‍යානය දකින්ට ලැබූයෙන් සියබස පුහුණුකරන්නන්ට මෙයින් ලදහැකිවූ විපුලාර්ථයම ආභොගකළමමද මෙය සත්නකතීෘත්වහන්සේ වෙතින් ලැබගෙන ලොකානුග්‍රහබුද්ධියෙන් මේවර මෙසේ මුද්‍රණය කරවීමි, මෙහි මුද්‍රණය පටන්ගත්පසු මීට භාවසත්නයක්ද උව මනාසේ වැටහිගියෙන් මවිසින්ම විස්තර භාවසත්නයක් දැනට ලියාගෙන යනු ලැබේ, ඒ ද මීට අනතුරුව මුද්‍රණය කරවන බැවිහා මේ සත්නකතීෘතුමන් වහන්සේ විසින් නිපදවා වදාළ තවත් පොත් කීපයක් අප කීපදෙනෙකුන් විසින් මුද්‍රණයකරවීමට අදහස්කළ බැවිද ශාස්ත්‍රාභිලාෂීන් හමුවෙහි සැලකරම්හ.

මෙම ව්‍යාඛ්‍යානය දෙවෙනි වාරයෙක මුද්‍රණය කරවනු කැමැත්තන් විසින් සත්නකතීෘත්වහන්සේගේ අවසර පරිදිව කළයුතු බවත් ප්‍රකාශකරම්හ.

මෙම පොත ලබාගනු කැමැති භවතුන් විසින් කොළඹ වේල්ලවීදියේ නො. 31 දරණ කේ. ඞී. පෙරේරාමහතාගේ පොත් ශාලාවෙන් හා දෙවෙනි මරදානේ නො. 142 දරණ ඇම්. ඇම්. පී. විජයරත්න මහතාගේ පොත් ශාලාවෙන්ද ලැබගතයුතුයි.

මේවගට, ශාස්ත්‍රාභිලාෂී

**එච්. බී. ඊ. ජිනදාස.**

*H. B. E. Jinadasa.*

වර්ෂ 1910 ජූලි මස 25 වෙනිදින
කොළඹ කොටහේනේබ්ලූමන්ඩෝල්
වීදියේ නො; 65 දරණ නිවසෙහිදීය.

# INTRODUCTION.

It is not necessary to write a long and elaborate preface for an old classical Sinhalese Poem of celebrity, such as, Mayúra Sandeseya, which is, being interpreted, "An Epistle by a Peacock." Although the modern students of Sinhalese Classics derived benefit from the editions previously published by Mr. B. Gunasekara, Mudaliyar of the Colombo Museum in 1881, and by Mr. K. W. P. Dharmasena, the learned Pandit of Dodanduwa in 1902, yet I cannot concede they have done full justice to the old work. The publishers might undoubtedly have taken pains to rectify the errors committed by copyists in old Manuscripts. Nevertheless both of them seemed to have failed to some extent as regards that point. Knowing the intrinsic value of the original Poem which may be regarded as the prototype of Sinhalese Stanzas and seeing the defects which subsequently crept into it, my friend, Mr. John De Silva, Proctor S. C. Colombo, Oriental Scholar and expert in Native Music, requested me to revise its text and prepare a commentary for it and thus do some good to the Sinhalese Language at this period of its high advancement.

My laborious researches enabled me to procure about 16 Mss copies both from the High aud Low Countries; they did not however agree when compared with one another. But some of them, I must admit, being so well transcribed, served to remove the greater part of my doubts which lurked in my mind in the absence of any glossary of words or commentary thereto, and also to enable me to trace out the author's name and descent.

**Kawiswara** (*Great in Poesy*) as the author styled himself was a grandson of **Gurulugomi**, the most distinguished Professor of Buddhist Doctrines and 'Tri Sinhalese' and author of "Dharmap. pradípiká" and "Amàwatura."

Arduous and important as is the task I have taken in hand, I leave it to the Ceylon Literati to judge with an unbiassed mind the amount of labour and thought that is entailed in bringing before the public Mayúra Sandesaya, which has undergone many changes and modifications, all for the worse, soon after it passed the hands of its author about 523 years ago. This was during the reign of

the Sinhalese Monarch, Buwaneka Bahu, who took Gampola for his capital. I, as Commentator, think, therefore, that it is my duty briefly to say something here on its merits. Of the three classes of messengers as prescribed in Sanskrit Books, the bearer of this Poem falls under the last head, viz; Sandesa Háraka, meaning, the deliverer of the message. Unlike other 'Poetic Letters,' such as those carried by a pigeon by a cuckoo, by a swan, by a parrot, etc, this 'Poetic Letter' carried by a peacock, has its verses embellished by numerous homonyms simultaneously expressing the author's shades of thought and displaying a perspicuity combined with admirable brevity. On many points of imagery and elegance, too, it differs from other Standard Elu Poetical Works, now extant, with the exception of one, by name, " **Polonnaru Pura Warnanà**," which is a descriptive Poem by the same author.

Vivid is the originality of thought in the delineation of dusk and twilight, and graphic are the descriptions of respective towns, thoroughfares, rivers and streams which existed all along the then public road from Gampola, in Kandy District to Dondra near Matara. Instinctively one pauses in the course of reading to think of the old poet with awe and admiration. Not only in this Poem does this rare instance of dissimilarity in imagery and diction to other old poems exist, but also, in the Sanskrit Literature, the same distinction to exist may be observed.

The poem " Magha, " or otherwise called, " Sisupâlabadha " does not bear comparison with others in these respects.

On the face of these facts, would anyone take exception to the addition of the epithet " Wâgiswara " ( *Great in Words* ) to the name of Kawiswara in consideration of the phraseology employed throughout his Poems?

I am well aware that a work published in any Eastern Language, especially in Sinhalese is liable to much criticism, and I trust that my critics will be fairminded in their comments on this work.

*30th. April, 1909,*
*Colombo.*

**W. Deepankara**

විඥප්ති.

# මයූරසන්දේශය.

ශ්‍රී මද්විද්වජ්ජනකුලාවතංස සමස්ත කවිජනසම්භාව්‍ය සුලලිත කෝමල මධුරපදවල්‍යාදීන් සනාථීකෘත කාව්‍යරසාස්වාදන තත්පරකවිජනකුමුදවන විකාශයට කෞමුදීසංකාශවූ මෙම කාව්‍ය රත්නය මයූරපක්ෂියකු දූතකාර්‍ය්‍යයෙහි යෙදූ අයුරු පෙන්නා කළහෙයින් මයූරසන්දේශ නමින් ව්‍යවහෘතයි, අභීෂ්ටාර්ථනිෂ්පාදනයෙහිලා නියෝජ්‍යවූ දූතයෝ තෙදෙනෙකි.

මේ කීහු ශ්‍රීවිශ්වනාථ කවිරාජයෝ:-

"නිසෘෂ්ටාර්ථෝ මිතාර්ථශ්ච තථා සන්දේශහාරකඃ,
කාර්‍ය්‍යප්‍රේෂ්‍ය ස්ත්‍රිධා දූතෝ දූත්‍යශ්චාපි තථාවිධාඃ.

උභයෝර්භාවමුන්නීය ස්වයං වදති චෝත්තරම්,
සුශ්ලිෂ්ටං කුරුතේ කාර්‍ය්‍යං නිසෘෂ්ටාර්ථ ස්තු ස ස්මෘතඃ.

මිතාර්ථභාෂී කාර්‍ය්‍යස්‍ය සිද්ධිකාරී මිතාර්ථකඃ,
යාවද්භාෂිතසන්දේශහාරඃ සන්දේශහාරකඃ."

කාර්‍ය්‍යයෙහි ප්‍රේෂ්‍යවූ දූතතෙමේ නිසෘෂ්ටාර්ථය-මිතාර්ථය-සන්දේශහාරකයයි ත්‍රිවිධය, දූතීහුද මෙසේයි. අදහස්දන්නාය ලැබියුත්තාය යන දෙදෙනාගේ ආශය තමාසිතනබාගෙන අවිරුද්ධවනසේ උතුරුපිළිතුරුදෙමින් කාර්‍ය්‍යසිද්ධිය මනාසේ කරන දූතතෙමේ "නිසෘෂ්ටාර්ථ" නම්, කියූ වචනමාත්‍ර ප්‍රකාශකෙරෙමින් කාර්‍ය්‍යසිද්ධිය කරනදූතතෙමේ "මිතාර්ථ" නම්, ගලපා දුන් සන්දේශය ගෙණගොස් දීම්පමණක් කරනදූතතෙමේ "සන්දේශහාරක" නම්, මේ ත්‍රිවිධදූතයන්අතුරෙන් මේ කාව්‍යයෙහිලා යෙදූ දූතතෙමේ සන්දේශහාරකනම් වෙයි.

කාව්‍යශාස්ත්‍රාර්ණවාවතීර්ණසමස්තසාධුසම්භාව්‍ය එතත්කාව්‍යරත්නාවතාහි විශිෂ්ටශිෂ්ටසම්මතයෙහිලා ප්‍රතීක්ෂ්‍යසමස්තකාව්‍යප්‍රාණයෙන් උද්දීප්තවූවද වැඩියක්ම කාව් අනුප්‍රාසරසපරිපූර්ණ හෙයින් මෙම කාව්‍යයකළකවිවරයා අනුප්‍රාසරසාස්වාදනයෙහි රිසියෙන්හෙබුබැව් පෙණේ, මෙහි දෘශ්‍යමානවූ නගර-ග්‍රාම-නරපති-දිවා-රාත්‍ර්‍යාදියගැන කරනිබෙනවර්ණනාවිලාසයද අන්‍ය සෛංහලියකාව්‍යයෙක දක්නාලැබෙතත් අතිශයින්ම විරලවයි,

මේ කාව්‍යයද අශේෂසංස්කෘත කාව්‍යයන්ට රචනාවිලාසයෙන් අසමානවූ ශිශුපාලබධ (මාඝ) නම් සංස්කෘතමහාකාව්‍යයමෙන් අනික් සිංහලකාව්‍යයකට අසමාන රචනාවිලාස ඇත්තේමය, නුමුත් පොළොන්නරුපුරවර්ණනා කාව්‍යයෙහි පැණෙන 30. 51. 55. 60. 75. 83. 91. 98. කවිවලට මෙනි 9. 11. 40. 54. 57. 58. 60. 100. වෙනි කවි අදහසින් පමණක් සමවෙතිලෙබ්, මෙහි දෘශ්‍යමාන රස-රසාභාස-භාව-භාවාභාස යන කාව්‍යරසයෙනුත් රසාභාස භාවාභාසයන් අවශ්‍යයෙන්ම චමත්කාරජනකබැවි ආලඞ්කාරිකයන්ගේ සවීකාරයට හෙතුවෙකි.

## ග්‍රන්ථනිර්මාණකාලය.

මෙම කාව්‍යයෙහි ගඞ්ගාශ්‍රීපුර (ගම්පලපුර) වරාධීශ්වරභුවනෙකබාහුනරේශ්වරයාන කෙනෙක්ද කාව්‍ය නායකත්වයෙහිලා වර්ණිතයහ, මේ නරේන්ද්‍රයෝ නම් ශ්‍රිබුද්ධවර්ෂ 1894 වත් 1912 වත් අතර කාලයෙහි ලඞ්කාමහිමණ්ඩලමණ්ඩනායමානව වැජඹුනු විජයබාහු මහරජ මහාවිතෝ දෙස්රජු විසින් මායම් පෙන්නා ජීවග්‍රාහයෙන් අල්ලාගෙනගියවිට ලඞ්කාභිෂෙකයට පත්වූ එම විජයබාහුරජුගේ වීරබාහු* නමින් සිටි සුලු පියානෝයි, රාජ්‍යාභිෂෙකයෙන් පසු මේ වීරබාහුවද සපුමල්කුමරුවමෙන්ම පෙරපැවති නාමය අත්හැර (**පස්වෙනි**) **භුවනෛකබාහු** යන නාමය ව්‍යවහෘත බැවි කරුණුසහිතව පෙණේ, මේ කාලයෙහිම රයිගම්පුරවරයෙහි රජබලය පෙන්නා රජයකළ නෛකතෙජබලපරාක්‍රමයෙන් අග්‍රෙසරවූ අලගෙශ්වරයන් යටිදූත්වූ භුවනෛකබාහුරජුහාසමග එකදිවිසේ වෙසෙමින් ජයවර්ධනකොට්ටය ගොඩනගා ත්‍රිසිංහලයද එක්සත්කොට චොරජනාකල්ගි සම්‍යජනානතාරයෙහි සඤ්ජාත තෘණජාතයක්සේ නිර්මලසම්බුද්ධශාසනයෙහි හටගත් දුඃශීලශ්‍රමණගණයාගෙන් බුදුසසුනට ඇතිවතුබුණුඋවදුරු දුක සසුන්වැඩ කැමැතිවූ අලගෙශ්වරයන් නෛකගුණගණවිභූෂණවිභූෂිතවූ ශරදිණ්ඩුප්‍රතිභාගකීර්තිශ්‍රී ඇති ධර්මකීර්තිමහාස්වාමීන් ප්‍රමුඛ මහාසඞ්ඝයා රැස්කරවා ශාසනාභ්‍යුදකර ශ්‍රමණප්‍රතිරූපකයන් ශාසනයෙන් නෙරපා සම්බුද්ධ පරිනිර්වාණයෙන් 1912 දී ශාසනශුද්ධියක් කරවූබැවි ශාසනාවතාරාදියෙහි පෙණේ, මෙසේ සම්බුද්ධශාසනයට සුභයක්කළ අලගෙශ්වරයන්ටහා භුවනෙකබාහුරජුටද ධර්මකීර්ති මහාස්වාමීන්ටද නිරුපද්‍රතාපෙක්ෂකව සෙත්ශාන්තිපතා මෙම කාව්‍යය විරචිතයයි සාමාන්‍යයෙන් හඟිමු, මේ ශාසනශුද්ධියම

* ඇතැම්තැන "වික්‍රමබාහු" කියාද පෙණේ-මේහි පැණෙන වර්ෂයගේ වෙනසක්ද පොත්වල දක්නාලැබේ.

නිශ්චිතකොටගෙන මීට ආසන්නතරකාලයෙක්හි කළසේ යටකී ලෙස නොසිතියයුතුවූයේද මේ රජහු රජයකල විසිවර්ෂයතුළ වියයුතුමහෙයින් 1929 වන බුද්ධවර්ෂයට පෙර කරන්ටම ඇත, මෙසේ සලකනවිට මෙයින් 523 වර්ෂයකින් මත්තෙහිම කාව්‍ය නිර්මාණකාලය විය යුත්තේයි.

## කර්තෘසංදර්ශනය.

මෙහි කර්තෘභූතකවිවරයෝ අසවල්හුයයි නිශ්චයකිරිමට තරම් හෙතුනොපෙණීමෙන් ලක්දිව උගත් උතුමන් සමහරුන් මේ සඳහා උත්සාහ දැරීම කාකදන්තපරීක්ෂණන්‍යාය වැන්නේයයි සිතා නිශ්ශබ්දවූවාසේ හැඟුණේය, අප එය එසේ පිළිනොගෙණ නොයෙක් පලාත්හි සෙවීමෙහි නිරතව වසන අතර (මෙහි පිටු අටක් මුද්‍රණයවූවාටත්පසු) සපරගමුදිශාවේ ගම්සබාවිනිශ්චය ධුරීව සිටි කරුණාතිලක සෙනෙවිරත්න මුදලිඳුන්ට හා බී. ගුණසේකර මුදලිඳුන්ටද ලැබීතුබුණු පැරණිපිටපත්දෙකක් ගැන ප්‍රාප්තවීමෙන් කර්තෘ ගැන නිශ්චයකරගැනීමට හැකිවීම අපගත් උත්සාහයෙහි ඵලයයි හඟිමු, එහි කාව්‍ය සමාප්තිපරිදීපක කවෙහි හා කර්තෘසංදර්ශිත කවෙහින් එකහැටිවම පෙණුනු ඌනත්ව හා ආකුලත්වයද ඌනපූරණයෙන් හා නිරාකුලත්වයෙන් සකස්කෙළෙමු, කර්තෘසංදර්ශිත කවෙහි එනාහි "ගුරුළුදම්*" යි ආපාඨය අපපාඨයක් හැටියට සලකනලදහෙයින් අපි "ගුරුළුගැමි" යියෙදුවෙමු, මේ කාව්‍ය නිර්මාණය කළ **කවිශේඛර** නම් කවිවරයා ධර්මප්‍රදීපිකා අමාවතුරයන ග්‍රන්ථයන් නිපදවූ සුප්‍රසිද්ධ පූජ්‍යාචාර්ය්‍ය ගුරුළුගෝමීන්ගේ පරම්පරාගත මුනුබුරෙක්, මේ කිවිවරයා ගැන යම්කිසි පොතපතක මීටපළමු කිසිවක් දැනගන්ට නොලැබුණේද මේ සඳහා කරුණුසෙවීමේදී මදක්දුර දැනගත්තාලදී මේ උත්තමයන් විසින්ම කරනලද "**පොළොන්නරුපුරවණ්නා**" වෙක්ද අපට ලැබුණා, ඒ ද රම්‍යතරකාව්‍යගුණයෙන් සරසනලද කවි 200 කින් යුක්තවූවක්වෙයි, කාලාන්තරගතදෝෂාන්තරයෙන් හා ඇතැම් කවිහි ඌනත්වයෙන් උපද්‍රැතවද තිබේ, ඒ කාව්‍යයද මේකිවිවරයාගේ ප්‍රාගංස්‍යකවිත්වයෙහි ප්‍රාමාණ්‍යය හඟවයි.

## උද්‍යොගඵලයක්.

මේ සම්බන්ධව ධාරිතවූ උද්‍යොගයෙහි විශිෂ්ටඵලයක්සෙයින් **මෞද්ගල්‍යායන ඡන්දොවිකාශිකාව**ද අපගේ හස්තප්‍රාප්තවීම සාධුන්වද ප්‍රමොදජනක යයි හඟිමු, එහි සමහරතැනෙක පත්‍ර දිරීමට

* ඇතැම් නිකාය ගැඹුන පිටපත්වලද "ගුරුළුදම්" යි ආපේය.

යාමෙන් මදමද ඌනතා දක්නාලැබේ, වැඩි ඌනත්වයකට පෙණෙන්නේ "ගි" දරණ පත්‍රය පටන් "ගෘ" දරණ පත්‍රය දක්වා පත්‍රයන්ගේ අභාවයයි.

## ග්‍රන්ථගෞරවය.

පූර්වකවිවරේණ්‍යයන් බෙහෙවින් ගරුකොට පවත්වාගෙන ආ ගිබන්ධනයෙන් කවිතැනීම වෙනස්කොට කවිබන්ධනයෙන් පවත්ගත්තෝ තොටගමුවේ මහාකවි ෂඩ්භාෂාපරමේශ්වර ශ්‍රී රාහුල මාහිමියානෝ යයි ඇතැම් ප්‍රමාතෲන්ගේත් මතයි, මේ මයූරසන්දේශය කළ කාලය තොටගමුකාලයටත් පෙර බැව් නිශ්චයවීඇත, හිසර-හංස-කොකිල-සැළලිහිණි-පරෙවි-ගිරා-යන සන්දෙශ මීට ආසන්නවූ පසුකාලයෙක නිපදවූවෝයි, දුන් මේ මයූරසන්දේශය සකල සන්දේශයන්ගේ පූර්වරූපයවූ අනූන කාව්‍යලක්ෂණවිභූෂණවිභූෂිත සත්කවිසම්මතියෙහි විවෘධ වෘඩතරයෙකැයි තීන්දුකරමු, මීට පෙර කවිවලින් තැනූ අනික් සන්දේශයක් මේතාක් අප්‍රකටහෙයිනි. **"මොනඹිඳු එකල්හි පුල්සලගණවාගණි-කාලඹන්බිඟු මහත්වන ගිරුහත්වක"** යන සිද්ධාන්තසංග්‍රහාගත ලක්ෂ්‍යානු සාරයෙන් මයූරසන්දේශ නම් පොතක් පුරාණ පැවැතිබැව් පේණනුමුත් දූතව භාව මාත්‍රාව ශිෂ්ටයි *.

## සිංහලකාව්‍යරචනාව.

ලක්දිව කිවිහු හෙළුබසින් කවිතැනීම ක්‍රමක් අවලම්බනය කොට පවත්ගත්තාහුද? යනුත් විමසියයුත්තකි, සිංහල භාෂාවත් හින්දි භාෂාදියමෙන්ම ප්‍රාකෘත භාෂාඞ්ගයක්, හින්දි සහ ද්‍රවිඩ භාෂායෙන් කවිරචනාකරන ආකාරයට සිංහල භාෂායෙන්ද විරචිතවිය, මොවුන්ගේ සාම්‍යාවගමය පිණිස යථොක්ත භාෂාව යෙන් විරචිත කාව්‍යවයක් මෙහි බහාලමු.

### හින්දි

හය්ගා ආයේ ගය්ගා ආයේ කහකෝ භ්‍රාත! මිල තෝ ජෝ
දජීතෝ සරලූහසෝ කපටේ ගිතනූභන සි ලූ තෝ ජෝ
සමේ මේං ඛාලරිගා පංචෙටල් සේවක හි ල තෝ ජෝ
පුරස්කාර පාපාකෝ අපනේ දිලූ මේං සබකි ල තෝ ජෝ

---

* මාතර දික්වැල්ලේ වැලිරුකන්හල සුදර්ශනාරාම විහාරාධිපතිවසිපු හරු: වැලිගිටියේ වජිරඥාණාලඞ්කාර ශිරිසුම්භාහියස මහාස්ථවිරයන් වහන්සේ විසින් කවි 210 කින් යුක්තකොට ශකවර්ෂ 1781 දී රචිත අභිනව මයූර සන්දේශයක්ද දුටුමු, මේ වනාහි රචිත කාලය ගැනත් සලකනවිට සම්භාව්‍ය රචනාවෙක් බැව් කියයුතුය.

## ද්‍රවිඩ-(දෙමල)

ඇල් මු ඩු යා වරහඉලේංගෙජබා නෙයි නා රේ
මේල් පා ඩු සොල්මුඩියා එන්ඩවායි වා රේ
නල් තෙ ඩු යා වාරාකල් අවඩතිරෙන් නී රේ
මේල් පා ඩු පාමුඩියා මැරිය කරව ගී - රේ

මේ හින්දි ද්‍රවිඩ කවිරචනය ගැන සලකනවිට සිංහල භාෂායෙන්ද කවිතැනීම හින්දි භාෂාවය හෝ ද්‍රවිඩ භාෂාවය කාව්‍ය රචනය අවලම්බනයඃකොට පවත්ගෙණ තිබෙනබැව් පිළිගත යුත්තේමය.

## ප්‍රතිසංස්කරණාන්තරයක්.

ඒ මේ සම්භාව්‍යකාව්‍යරත්නයවූකලී කාලාන්තරාගත අපාඨ ව්‍යත්‍යාදිදොෂදුෂ්ටවූ කාව්‍යාඞ්ගවෛකල්‍යයෙන් නිඃශ්‍රීකවූයේම පසින් වැසුණු අනගිමිණිරුවනක්සේ පැවැත්තේය, ක්‍රිස්තවබ්ද 1890 වැන්නෙහි ගරු: බී. ගුණසේකර මුදලින්දුයන්ගේද * 1902 වැන්නෙහි විවත්පුරෙහවූ දෙඩන්දුවේ ආචාර්ය්‍ය ධර්මසෙන සූරීන්ගේද ප්‍රතිසංස්කරණයෙන් මුද්‍රිතවූ ලක්දිව පළවූයෙන් කාව්‍යරසාස්වාදනයෙහි ලොල්වූ උතුමන්ට එයින් මදක් ප්‍රයොජනලද හැකිවිය, මෙහි අනර්ඝතා සැලකූ සමීක්ෂ්‍යකාරී මේ උගත් දෙපලම මෙම කාව්‍යයෙහි ශුද්ධියක් දැකීමට අනල්ප පරිශ්‍රමදරා තිබෙනබැව්නා තත් සංශොධනයද අපගේ සෘනිසෙහිලා මදක් පිරිවහල්වූබවත් කියම්හ.

## ව්‍යාඛ්‍යානකරණය.

මීට ව්‍යාඛ්‍යානයක් නිපදවා ලොකානුග්‍රහයක් සලසාලුව මනායයි මෙකල සිංහල භාෂාතත්වවිජානනාභිලාෂී පශ්චිම සෙංහලීයසඞ්ඝිනශාස්ත්‍රාචාර්ය්‍යත්වයෙන් බැබලෙන කොළඹ සුපිරිම් උසාවියේ නීතිඥ ධුරඛරවූ අසමද්ධිනෙති ජෝන් ද සිල්වා නීතිඥ මන්ත්‍රීන්දුයන්ගෙන් අපට කීපවාරයක්ම ආරාධනය ලැබුණේය, මේ ශාස්ත්‍රාභිලාෂී ප්‍රාමාණික උතුමන්ගේ අයැදුම පිළිගත් අප විසින්ද මේකාව්‍යයෙහිදී ඉසිලියයුතුප්‍රයාසය බාරදූර දුෂ්කර තර නුමුත් මෙයින් ලොකයාට සඵලභාවූ එළයම ගිණිකොට ගෙන වැලිපටින්විල ප්‍රලිනතලාරාමාධිපති අසමත්ප්‍රව්‍රජ්‍යාචාය්‍ය සරණතිස්සාභිධාන මහාසථවිරයන් වහන්සේගේ සප්‍රණයාවයරයත් ලැබ මීට ව්‍යාඛ්‍යානයක් කවැපිව රුහුණු–මාතර–මහ

---

* මීට පසුකාලයෙක මෙතුමාට ලැබුනුවුණු පිටපත වැඩියක් යහපති.

නුවර ආදිපලාත්වලින් ඉතා පැරණි පත් පොත් 16 ක් ලැබගෙන කරන්ට ආරබ්ධවිය, මෙසින් රුහුණු මාතර සබරගමු පලාත් වලින් ලැබුණු ලිපි සැලකියයුතු පාඨවලින් යුක්තයි, බොහෝ ලිපිවල පෙණෙන්නේ අශුද්ධ පාඨමය, ඇතැම් කවි ගී ලෙසද ගී කවිලෙසද ආකුලව්‍යාකූලව දකින්ට ලැබෙණ බැවිහා ඇතැම් කවි මුද්‍රිත පොත්හි හා වැඩියක් ලිපිවලත් පෙරලි වැටීතිබෙණ බවත් පණ්ඩිතාග්‍රගණ්‍ය තුඩාවේ පණ්ඩිත ගුණවර්ධන මුහන්දිරම් මැතිතුමන්ගේ භාවිතාවයෙහි පැවති පිටපත අනික් පිටපත්වලට වඩා මනාබවත් සැලකිය යුත්තක් මෙසේ නෛකදෝෂශවිත්‍රයෙන් සකලංකවද හුමාත්‍රාවශිෂ්ටව විසිරගිය මුතුවැලක්සෙයින්ද පැවැති එතත් කාව්‍යරත්නයට සන්නයක් හෝ ගැටපදයක් නොඉපදවූ යෙන් හා පත් පොත් පවා දුර්ලභ බැවින්ද වෙසෙසින්ම සැළලිහිණි අස්නාදියමෙන් ශිෂ්‍යප්‍රශිෂ්‍යශාඛාපරම්පරාහි අවිච්ඡින්න පරිශීලනභාවයෙන් යුක්තනුවූ බැවින්ද මේ සඳහා දරන්ටවූ උද්‍යෝගයෙහිදී අපට වැටහුණේ සාධනශක්තිවිරහිතව සවහසනයෙන් පමණක් මාණික්‍යාකරයක් සාරා නෛකවිධමාණික්‍යසාරයන් ගෙණහැර පානාක්ෂමනි, අභ්‍යවප්‍රාප්තියට අත්‍යාසන්නවම තුබුණු මෙහි අවසන් කවිදෙකද නයම.ත්‍රයක් අල්ලාගෙන යොද අවසන්කෙළෙමු-මෙහි 149 වන කවෙහි "දහම් දන්වා" යන් නට පැණෙන "ධම්සදූන" යන ව්‍යාඛ්‍යාන පදය අත් හැර "ධර්මය (සත්වයන්ට) ප්‍රකාශනොට; ධර්මිෂ්ටව යන අර්ථ"යි කියා යොදගතයුත්තේයි.

## ආචාර්‍යවිවරණසමරණය.

මේ ව්‍යාඛ්‍යානයද දෙඩන්දූවේ ශෛලබිම්බාරාමාධිපති සව දේශ විදේශයන්හි විඛ්‍යාත සත්කීර්තිකදම්බ විජෘම්භිත බෞද්ධ සිද්ධාන්තාචාර්‍ය අසමදෘචාර්‍ය ශ්‍රී ශීලස්කන්ධාභිධාන මහාස්ථවිර ස්වාමිපාදයන්වහන්සේද යථාවකාශයෙන් බලාදුන්බව සලකත්වා.

## උපකාරිසමරණය.

අපගේ මෙම සඳුද්‍යෝගයෙහිදී ඇතැම්දුබෝධස්ථාන පරිශොධනයට අසම්භිතකාමී ගින්තොට පිටිවැල්ලේ ජයවර්ධනාරාමාධිපති ගෞරවාහි ආචාර්‍ය ශ්‍රී ධර්මකීරත්‍යභිධාන ස්ථවිරපාදයන් වහන්සේගේ විශිෂ්ට විනිශ්චයාවලම්බනයත් පිටිවහල්වූ බැවිහා නොයෙක් පලාත්වලින් පැරණි පිටපත් සපයාදීමෙහි පරිශ්‍රම දරමින් හිරණාගම සුනන්දාරාමාධිපතිව වැඩසිට සවර්ගස්ථවිවදල

ගෞරවාහි සිරිපවර සඞ්ඝානුඥාත මහාස්ථවිරපාද-ගාල්ලේ ගල්වඩුගොඩ පරම විචිත්‍රානන්ද විහාරවාසී ගරු-පඤ්ඤාරංසි ස්ථවිර-තංගල්ලේ ඇත්තැපිටියේ ජයසුමනාරාමාධිපති ප්‍රියශීලි සාරානන්ද ස්ථවිර-යන උතුමන් හා පානදුරේ පණ්ඩිත ඩී. ඇම්. ඇස්. ඇස්. කවිරාජ-තංගල්ලේ පී. ඇස්. වණිකුලසූරිය-යන මහත්වරුද විශිෂ්ටාධාරකළබව සමරණීය කෙරෙමින් මේ උතුමන් කෙරෙහි අපගේ සතුහිපූර්වක තුෂ්ටිප්‍රාභෘතය පුද කෙරෙමු.

ප්‍රේක්ෂාපූර්වකාරීන්ට මේ කෘතියෙහි යම් කිසිතැනෙක් සන්දේහයේ දෘශ්‍යමානනම් එහිදී අසත්පථාවතීර්ණ නොව සච්චරිත්‍ර යම භජනාය කෙරෙත්වා.

> "අනිරාකෘත තාප සම්පදං
> ඵලහීනාං සුමනොභි රුජ්ඣිතාම්,
> ඛලතාං ඛලතා මිවා සතිං
> ප්‍රතිපද්‍යෙත කථං බුධො ජනඃ"–ශ්‍රීවාස.

> "කවිඃ කරෝති පද්‍යානි ලාලයත්‍යුත්තමො ජනඃ
> තරුඃ ප්‍රසූතෙ පුෂ්පාණි මරුද්වහති සෞරභම්"–රත්නාවලී.

ශුභම්

ශ්‍රී. බු. ව. 2452 වන්නෙහි
වෙසක්මස පුරදසවක් තිබ්දින
කොළොම්පුරයෙහි දීය.

මීට විධ්‍යජනකෘපාකාංක්ෂී
වැලිපටන්විල **දීපඞ්කර ස්ථවිර.**

සන්න සහිත

# මයූර සන්දේශය.

1. සැරද මියුරිඳු සඳ—මියුරස නදින් නදනා,
සඳැස්පිල් කැල කැළුමින්-පිණවන සඳැස් දුටුවන්.

---

ශ්‍රීමච්ඡ්‍රීඝන චරණවර පඞ්කජ සමුල්ලසිතමකුටමණි මරීචි කදම්බ සමුජ්ජ්වලිත ශ්‍රීලඞ්කාධීශ්වර ගභාශ්‍රී පුරවරාධිවාසී භුව නෛකබාහු නරේශ්වරයන්ගේ රාජ්‍යපරිපාලනය චිරස්ථායිවනු සඳහා අසදෘශ කීර්තිප්‍රතාප ප්‍රදානයෙන්ද, සුපරිශුද්ධ බුද්ධශාසන ශ්‍රීභාරධාරී ප්‍රවරොදාර කීර්තිකදම්බශ්‍රී විජෘම්භිත ධර්මකීර්තිස්වාමීන් ප්‍රමුඛ සඞ්ඝයාවහන්සේගේ පස්වාදහසක් සම්බුද්ධශාසන පරිපාල නය නිරුපද්‍රැත වනු සඳහා ගුණනුවන ආයුරාරෝග්‍ය ප්‍රදාන යෙන්ද, මේඋතුම් පින්වත් දෙපලට සෙත්ශාන්තිප්‍රදානයකළමැන වයි දෙවිනුවර පුරප්‍රවරයෙහි විජෘම්භමාණ උත්පලවර්ණ දිව්‍ය රාජයාවෙත මයූරපක්ෂියකු සන්දේශහාරක දූතක්‍රියාවෙහි යොදා සුලලිත කොමල මධුරපදාවලින් සමුපලක්ෂිතකොට හෙළුබසින් පද්‍යාත්මක කාව්‍යසන්දේශයක් යැවියැව්වූ ආචාර්‍ය්‍යපාදයෝ "ආශිර් නමස්ක්‍රියාවස්තු නිර්දේශොවාපි තන්මුඛම්"යි ශාස්ත්‍රොක්ත ත්‍රිවිධ කාව්‍යමුඛයන් අතුරෙන් ආශීර්මුඛයෙන් කාව්‍යබන්ධනය කටැටි වූවෝ ස්වාභීෂ්ටකාර්‍ය්‍යසාධන තත්පරවූ මයූරපක්ෂියාහට නිරු පද්‍රැතාපෙක්ෂකව **"සැරද මියුරිඳුසඳ"** යනාදි පද්‍යය උපන්‍යාශ කොළෝ.

1. **"මියුරිඳුසඳ! සැරද"** යනු මෙහි වාක්‍යයොජනායි, මියුරිඳුසඳ!, මයූරේන්ද්‍ර චන්ද්‍රය!; (යුෂ්මත්තෙම) සැරද, චිරකාලයක් ජීවත්වෙතිවා; (කුමකින් විශිෂ්ටවූ මයූරේන්ද්‍රචන්ද්‍රයෙක්දයත්?) මියුරසනදින්, මධුර රසාන්විතනාදයෙන්; නදනා, (ලෝවැස්සන්) සන්තුෂ්ටියට පමුණු වන්නාවූද; පිල්කැල, (මොනර) පිල්වැටියෙහිවූ; සඳැස්, චන්ද්‍රාක්ෂීන් ගේ; කැළුමින්, කාන්තිභාරයෙන්; දුටුවන්, දර්ශනයකළවුන්ගේ; සඳැස්, චන්ද්‍රනෙත්‍රයන්; පිණවන, ප්‍රීණනයකරවන්නාවූද; මියුරිඳු සඳ!, මයූරේන්ද්‍රචන්ද්‍රය!; සැරද, චිරකාලයක් ජීවත්වෙතිවා.

2 සඳයුරු මිතුරු සඳ!—සිය සඳ කුමුදු නදදෙන්
මුලුලෝ සනසමින් එන ගනරදහු වෙ ත
තුටුරැව් මඟුල් ගීනගමින් රැඟුම් ග ත
සිරිගිරි අසුන්පත්—සිරිමත් කෙළිමතින් වැඩි *
සොඳ ගුණකඳ කඳදෙව් කදිනි උසුල නා
තුබු තෙදියත දෙව්විකුමැති † කුලෙකි ම නා
සොබමන් මෙවන් සිරිතැතියන්ගේ දූකු ම
දෙවියන් යැදත් හැකිවෙසි නොදූනේ නිය ම
අමුතුව අප පණෙව් ලත්සැප කියනු කි ම
අපසිරි අනා අත්පත්වූ වැනි දූන් ම

මෙසේ යහ ගීයෙන් දූතයාහට මඞ්ගලාශීර්වාද කොට තද නන්තරව දූතයාගේ ප්‍රශස්තතර මිත්‍රගුණය හා වික්‍රමාතිශයද සවා භීෂ්ටකාර්‍ය්‍යනිෂ්පාදනයෙහි සාමර්ථ්‍යයද ප්‍රකාශකටැව්වූවෝ **“සඳ සුරු මිතුරුසඳ”** යනාදිය කියති.

**2.** **සඳයුරු**, චන්ද්‍රයාපරිද්දෙන්; **සියසඳ**, ඇහින්ගේසිත්නැමැති; **කුමුදු**, කෛරවයන්ට; **නදදෙන**, ආනන්දදානයකරන්නාවූ; **මිතුරු සඳ !**, මිත්‍රොත්තමය !;—**මුලුලෝ**, සමස්තලෝකය; **සනසමින්**, අස්වසමින්; **එන**, ආගමනයකරන්නාවූ; **ගනරදහුවෙත**, මෙඝරාජයා කෙරෙහි; හෙවත් මෙඝරාජයාහට; **තුටුරැව්**, තූර්‍ය්‍යරාවනැමැති; **මඟුල් ගී**, මඞ්ගල්‍යගීතිකාවන්; **නගමින්**, ප්‍රකාශකෙරෙමින්; **රැඟුම්ගන**, නෘත්‍යග්‍රහණයකළාවූ;–**සිරිගිරි**, ශ්‍රීපර්වතශිඛරනැමැති; **අසුන්**, ආසන යට; **පත්**, ප්‍රාප්තවූ; **සිරිමත්**, ශ්‍රීමතුන්ගේ; හෙවත් රජ්ජුන්ගේ හා ධන වතුන්ගේ; **කෙළිමතින්**, ක්‍රීඩා චිත්තයෙන්; නොහොත් චිත්තානුකූල ක්‍රීඩායෙන් හෝ ක්‍රීඩාමදයෙන්; **වැඩි**, වර්ධිතවූ–**සොඳගුණකඳ**, මනා ගුණසමූහයක්ඇති; **කඳදෙවි**, ස්කන්දදෙවයා; හෙවත් කතරගමදෙවියා; **කදිනි**, (තමාගේ) දෙහයෙන්; **උසුලනා**, (වාහනභාවයෙහි සිට) උවහනයකරන්නාවූ; (එහෙසින්ම) **තුබ**, යුෂ්මත්හු; **තෙදියත**, ජගත්‍රයෙහි; **දෙව්විකුමැති**, දිව්‍යවික්‍රමඇත්තාවූ; **මනාකුලෙකි**, ප්‍රශස්තවංශඇත්තෙකි;—**සොබමන්**, ශොභමානවූ; **මෙවන්**, උක්ත ප්‍රකාරවූ; **සිරින්ඇතියන්ගේ**, (ශ්‍රෙෂ්ඨතර) චරිත්‍රඇත්තන්ගේ; **දූකුම**, දර්ශනයනෙම; **දෙවියන්යැදත්**, දෙවියන්වයාච්ඤාකොටත්; **හැකි වෙසි**, හැකිවන්නේයසි; **නොදූනේ**, ජනනයනොවන්නේය; **නියමා**, (මේ) නිශ්චයයි; (ඒ මතුද) **අප**, අස්මතුන්විසින්; **අමුතුව**, අභිනව යෙන්; **පණඑව්**, ප්‍රාණයක්මෙන්; **ලත්**, (යුෂ්මත්හුගේ දර්ශනයෙන්)

* “වව”-ඇතැම්. † “දියව්කුමැති”-ඇතැම්.

3 ය  ස  ග  පුරණ ගුණ මිතුරන්ට කළ ත  මා
එ  ස  ග  උවත් ඉන්* අත්පත්වේය ඇ  මා
නි  ස  ග  පුරුදු තමහට ඉන් කියනු කි  මා
අ  ස  ග  මදක් මනෙපල තා සවන්යො  මා

4 ස  ව්  දිගුබිත කිරණෙව් යස. උදු  ල්  ව  න
සැ  ව්  බලපෑ එදිනෙව් බුදු මගු  ල්  ව  න
දෙ  ව්  නුවරෙහි දෙව් රජහට උපු  ල්  ව  න
දෙ  ව්  මෙහසුන් සව් සිරි මතු විපු  ල්  ව  න

---

ලද්දාවූ; සැප, සැපය; කියනුකිම, කියන්නේකුමටද?; අප, අසම තුන්ට; අනාසිරි, අසම්ප්‍රාප්තවූ හෝ අනාගතවූසම්පත්තියෙක්; නො හොත් අනාසිරි, (මෙසවයෙහි අසමතුන්ගේ චිත්තයෙහි නිරතුරුව ප්‍රවර්තනයවනඅභිලාෂය සිඬකිරීමෙන්ලභ්‍යවූ) අනාගත සම්පත්තිය; දූන්ම, මේ වෙලෙහිම; අත්පත්වූ වැනි, හස්තප්‍රාප්තවූයසි හඟිමි.

3. අග, ශ්‍රෙෂ්ඨවූ; යස, කීර්තිය; පුරණ, පූරණයකරන්නාවූ; නොහොත් වර්ධනයකරන්නාවූ; මිතුරන්ට, මිත්‍රයන්ට; ගුණ, (සවකීය) මිත්‍රගුණය; කළ, ප්‍රකාශකළහොත්; ඉන්; ඒ හෙතුකොටගෙන; තමා, තමන්ට; (තමාගේ උතුම් මිත්‍රයන්ගැන කළයුතු වැඩෙහි නියුක්තව සහායවූවන්ට යන අදහසි) ඇමා, සියලු; එසගඋවත්, ඒ සවගියනමුත්; අත්පත්වේය, හස්තප්‍රාප්තවන්නේය; ඉන්, එහෙ යින්; නිසග, නිසගියෙන්; පුරුදු, (මිත්‍රයන්ට තමාගේ මිත්‍රගුණය ප්‍රකාශකිරීමෙහිම) පරිචිතවූ; තමහට, තමන්ට; නොහොත් ඔබට; කියනුකිම, (සවගිසම්පත්ප්‍රතිලාභය) කථනයකරන්නේ කුමටද?; (එහෙයින්) තා, යුෂ්මත්තෙම; මදක්, සවල්පයක්; සවන්යොමා, ශ්‍රවණාවනතකොට; මනෙපල, මාකියන්නක්; අසග, ශ්‍රවණයකර.

මෙසේ දූතයා සමග ප්‍රියසම්භාෂණය කිරීමෙන් ඉක්බිති දූතයා විසින් කළයුතු කාර්‍ය්‍ය ප්‍රකාශකරන්නෝ "සව්දිගුබිත" යනාදිය කිහු.

4. සව්දිගු බිත, සකලදිග්ලක්ෂණභිත්තීන්හි; කිරණ එව්, රශ්මියෙන් මෙන්; යස, කීර්තිකදම්බයෙන්; උදුල්වන, උජ්ජ්වලිත වන්නාවූ; බුදුමගුල්වන, බුඬමඞ්ගල්‍යයවූ; එදින එව්, ඒදවස්හි මෙන්; නොහොත් අපබුදුන් බුදුවූ දවස්හිමෙන්; සැව්බල, චාපබලය; පෑ, ප්‍රකාශකළාවූ; දෙව්නුවරෙහි, දිව්‍යනගරයෙහි; උපුල්වන්දෙව් රජහට, උත්පලවර්ණදෙවේන්ද්‍රයාහට; නොහොත් ශ්‍රී විෂ්ණුදිව්‍යරාජයාට; මතු, අනාගතයෙහි; සව්සිරි, සකලශ්‍රිය; විපුල්වන, මහත්වන්නාවූ; (අනාගතයෙහි මහත්සෙත් ශාන්තියක්ගෙනදෙන්නාවූ යන අදහසි;) මෙහසුන්, මේ සන්දේශය; දෙව්, ප්‍රදානයකරව්.

---

* "එසග සැපත් උත්"-ඇතැම්.

5 මි යු රු සඳ! මි යු රු—බස් අස්න මතු පවසමි,
දූත්මෙතොප නිකුත්වන-පුරවරවෙසෙස අසතොස.

6 තුඟු සුලකල පහ පැහැනර තර පව ර
සැදි දෙරදෙර බිඟිදෙර දද අඹලඹ ර
සෙන් සිව්රඟ වේමග මඟුලෙන් නිතො ර
දනු පිරිසිරි ගහසිරි පුරවර මො ත ර

7 ද ව ග ත් හයන් කුරරොන් නැගෙන නුබව සා
සි ය ප ත් පොබයවන රිවිකැළුම එනනි සා
ම හ ව ත් අරණමෙන් සෙද අතපසින් ග සා
පැහැ පත් පහග දද එහි පෙණෙනවන උ සා

---

5. මියුරුසඳ!, මධුරචන්ද්‍රය!; මියුරුබස්, මධුරවචනඇත්තාවූ; හෙවත් කාව්‍යසුභාෂිතාදි අලඞ්කාරවාක්‍ය විශෙෂයෙන් යුක්තවූ; අස්න, (උත්පලවර්ණදෙවෙන්ද්‍රයාටදෙව්යයි මවිසින්කියනලද) සන්දෙශය; මතු, පැසුලුව; පවසමි, ප්‍රකාශකරෙමි; දූත්, මේකාලයෙහි; මෙතොප, මේ යුෂ්මත්හු; නිකුත්වන, (සන්දෙශග්‍රහණයකොට) නිෂ්ක්‍රාන්තවන්නාවූ; පුරවර, පුරප්‍රවරයෙහි; වෙසෙස, විශෙෂය; තොස, සන්තොෂයෙන්; අස, ශ්‍රවණයකර.

ඉක්බිති හසුන්ගෙණනික්මියයුතු නගරය වර්ණනාකරන්නෝ **"තුඟුසුලකල"** යනාදිය කියති.

6. පැහැනර, මහත්ප්‍රභාඇති; නර, විශාලවූ; පවර, උත්තමවූ; තුඟු, උත්තුඞ්ගවූ; සුලකල, සවලඞ්කෘතවූ; පහ, ප්‍රාසාදයන්ගෙන්ද; දෙරදෙර, වාරයක්වාරයක්පාසා; සැදි, සජ්ජිතවූ; බිඟිදෙර, බහිවාරයන්ගෙන්ද; අඹර, ආකාශයෙහි; අඹල, (පවහිත්) ආවෘතවූ; දද, ධ්වජයන්ගෙන්ද; වේමග, වීථිමාර්ගයෙහි; (ඇවිදුනාවූ) සිව් රඟසෙන්, චතුරඞ්ගිනිසෙනාවගේ; මඟුලෙන්; මඞ්ගලලීලාවෙන්ද; නිරතුරු, අනවරතනැත්නාවූ; පිරිසිරි, පරිපූර්ණශ්‍රීසම්පත්තියෙන් යුක්තවූ; ගහසිරිපුරවර, (මහවැලිගඟඅසබඩකලහෙයින් ගඟයසිද ශ්‍රීදෙවියගේ වාසභවනහෙයින් සිරිපුරයසිද කියනුලබන ශබ්දයුගලය ගැළපීමෙන් ව්‍යවහෘතවූ;) ගඞ්ගාශ්‍රීපුරප්‍රවරය; දනු, ජානනයකර.

7. එහි, ඒගඞ්ගාශ්‍රීපුරයෙහි; පැහැපත්, ප්‍රභාප්‍රාප්තවූ; උසාවන, උත්තුඞ්ගවන්නාවූ; පහ, ප්‍රාසාදයන්ගේ; අග, අග්‍රයෙහි; (යොදන ලද) දද, ධ්වජයෝ (කෙවැනිද?) දවගත්, ධාවනයකළාවූ; හයන්, සෛන්ධවයන්ගේ; කුරරොන්, කුරගැටීමෙන් හටගත් දූවිලි; නුබවසා, අහස්තලප්‍රතිච්ඡන්නකොටගෙන; නැගෙන, උද්ගතවන

8 දිසි නිල්මිණි සඳලුය ලියවත කම ල
දැක නොමලන පුල්පියුමැයි කරු කුහු ල
සඳපිළිබිඹු තරුසෙන් සමඟින් සක ල
උදුරණලොබින් බටවැනි බට පියුම් අ ල

9 එපුරෙහි සරණ අබිසරුලිය සොර බැවි නි
සොබමන් විමන්දෙර මිණිපහණ වසම් නි
මල්දම් සුඹුලුකරුගත සලගත් අති නි
දිලුම්නිපැමිණි පණිදෙව්ගත් එගහම් නි *

කල්හි; සියපත්, ශතපත්‍රයන්; පොබ්‍යවන, ප්‍රබොධවන්නාවූ; රිවි කැළුම, සූර්‍ය්‍යරශ්මිය; එනනිසා, ආගමනයකරනහෙයින්; (සූර්‍ය්‍ය රශ්මියගේ පැමිණීමටය යන අර්‍ථයි) සෙද, දූඹිව; අතපයින්, හස්ත යෙන් හා පාදයෙන්; ගසා, ප්‍රහාරදනයකොට; මහවත්, මහාමාර්‍ගය; අරණමෙන්, විවෘතකරන්නාක්මෙන්; හෙවත් ආවරණයවලකන් නාක්මෙන්; (අසුන්ගේකුරගැටීමෙන් උද්ගතවන ධූලිපහකොට මාර්‍ගය ඉඩහරවන්නාක්මෙනැයිසේයි) පෙණෙන, දෘශ්‍යමානවෙති.

8. නිල්මිණි, නීලමාණික්‍යමයවූ; සඳලුය, චන්ද්‍රිකාශාලාවන්හි; දිසි, දෘශ්‍යමානවූ; සඳපිළිබිඹු, චන්ද්‍රප්‍රතිබිම්බයතෙම; (කෙවැනිද?) ලිය, පුරස්ත්‍රීන්ගේ; වනකමල, වක්ත්‍රපද්මයන්; දැක, දර්ශනයකොට; නොමලන, මලානනොවන්නාවූ; පුල්පියුමැයි, ප්‍රඵුල්ලපද්මයෝයයි; කුහුලකරු, කුහුල්සිත්උපදවා; බටපියුම් අල, හටගත් පද්මමෘණා ලයන්; උදුරණලොබින්, උඬරණය කරනඅභිලාෂයෙන්; හෙවත් උගුලනඅදහසින්; සකලතරුසෙන් සමඟින්, සියළු තාරකාසේනාව හා සමගව; බටවැනි, අවතීර්ණවූයයි හඟිම්.

9. එපුරෙහි, ඒ නගරයෙහි; සොබමන්, ශොභමානවූ; විමන් දෙර,විමානවාරසන්නයෙහි; (යුක්තකළාවූ) මිණිපහණ, (දීප්තිමත්) මාණික්‍යපාෂාණපඞ්ක්තිය; ගත, ශරීරයෙහි විලඞ්ඝනයකරනලද; මල්දම්, පුෂ්පදාමයන්; සුඹුලුකරු, මුෂ්ටිකකොටගෙන; (පුෂ්පදාමයන් වලයාකාරයෙන් සාදාගෙන යන අර්‍ථයි) සලගත්, චඤ්චලතාග්‍රහණය කළාවූ; අතිනි, හස්තයෙන්; වසම්නි, ඡාදනයකෙරෙමින්; සොර බැවිනි, චෞරභාවයෙන්; සරණ, සඤ්චාරණයකරන්නාවූ; අබිසරු ලිය, අභිසාරිකාස්ත්‍රීහු; (කෙවැනිවෙත්ද?) දිලුම්නි, දීප්තියෙන් යුක්තව; පැමිණි, උද්ගතවූ; එගහම්ණි, ඒග්‍රහමණිහු; හෙවත් සූර්‍ය්‍යයා; ගත්, ග්‍රහණයකළාවූ; පණිදුළුව්, ඵණීන්ද්‍රයාවැන්නෝය; හෙවත් රාහුවැන්නෝය.

* "සිදුම්ණි පැමිණි තිරිදෙකුගත් එකගවැනි"-ඇතැම්.

10 රිවි රිය හයන් ගෙන්වන යන සැකසිනි නී
සඳ සියරුස් රුසිනෙකිනෙක තොරණම් නි
පඬුරට යුවරදුට දුන් කැළුමන් ලෙසි නී
රන්කොත් දිලිණි රුදවල්සෙ කරමි නි

11 ස ත ර දිගට සලසා රන්දුල සක ස
ප ත ර සත්*මහල් කුළුගේ සඳලු උ ස
මෙ ත ර මෙකල් පහයසෙ සුරලොවේමි ස
අ ත ර නරලොවේ කොතනැත මේ වෙසෙ ස

12 ලි යා ලකල පබුලුය වැම්පෙල මහ ල
සො යා පතර පලබිතු පිරියම්නුදු ල
අ යා නයන දූක දූක රිසි නොයන ක ල
කි යා පහය සිරි අභවනු කෙලෙසබ ල

---

10. (එහි, ඒ නගරයෙහි;) පහ, ප්‍රාසාදමස්තකයෙහිවූ; රන්කොත්, සෞවර්ණශෘඞ්ග පඞ්ක්තිය; (කෙවැනිද?) රියහයන්, (තමාගේ) රථයෙහි යොදනුලබන අශ්වයන්; ගෙන්වනයන, (යුවරජහු) ආහරණයකරවනයන; සැකසිනිනි, ශඞ්කාචිත්තයෙන්; රිවි, සූර්‍ය්‍ය විසින්ද; එකින්එකතොරණ, (නගරයෙහි තන්හි තන්හි යොදනලද) එක්එක්තොරණයක්හුගේ; මිණ්රුසිනි, මාණික්‍යකාන්තිය කරණකොටගෙන; සියරුස්, ස්වකීයරශ්මිය; හෙවත් චන්ද්‍රරශ්මිය; ගෙන්වනයන, (යුවරජහු) ගෙන්වන්නේය යන; සැකසිනිනි, ශඞ්කා චිත්තයෙන්; සඳ, චන්ද්‍රයාවිසින්ද; යුවරදුට, යුවරජයාට; පඬුරට දුන්, (යටදක්වූනියායෙන් හිඟිප්‍රාප්තව) ප්‍රාභෘතකොට ප්‍රදානයකළාවූ; කැළුමන්ලෙසිනි, (සූර්‍ය්‍යචන්ද්‍ර දෙදෙනාගේ) කාන්තිපුඤ්ජයසෙයින්; රැ, රාත්‍රිභාගය; දවල්සෙ, දිවාභාගයමෙන්; කරමිනි, ප්‍රකාශකෙරෙමින්; දිලිණි, ජ්වලිත වී.

11. සතරදිගට, චතුර්දිශාවෙහි; සකසා, මනාකොට; රන්සලසා, ස්වර්ණයෙන්තනා; දුල, ජ්වලිතවූ; උසා, උන්නතවූ; සඳලු, චන්ද්‍රිකාශාලාඇති; පතර, මහත්වූ; සත්මහල්, සප්තමාලකයෙන් යුක්තවූ; කුළුගේ, කූටාගාරයෙක් (ඇති;) මෙකල්, මේ කාලයෙහි; මෙතර, මේතරම්වූ; පහයසෙ, ප්‍රාසාදයටසමවූයේ; සුරලොවේමිස, දිව්‍යලොකයෙහි පහයක්මුත්; නරලොව අතර, මනුෂ්‍යලොකයතුළ; කොතන, කතරස්ථානයෙක්හි; මේ වෙසෙස, මේ විශේෂය; ඇත, විද්‍යමානවන්නේද? (නොවන්නේ මැයි.)

12. මහල, මාලකයෙහි; පබුලුය ලියා, ප්‍රවාලයන් ඔබ්බා; ලකල, අලඞ්කාරකළාවූ; වැම්පෙල, ස්තම්භපඞ්ක්තියද; සොයා ,සෙවිලිකොට

---

* "සතරපෙර"-ඇතැම්.

සබඳ! එපුරේශ්වර නරේශ්වරයාගේ කිත්ප්‍රතාප *
විශේෂ ශ්‍රවණයකර.

13 සිරි සි ය බා තෙලෙ ඔලඹා† රැඳි නිතො ර
රුපු ගජ බා මුල් නොතබා ගත් කෙස ර
ලක ඔල ඹා සිරි සුල බා කළ මෙපු ර
දින මහ බා බුවනෙක බා රජ පව ර

14 ස ව න් ගුණ දහම සද නා ස ව න් මි ණි
ලෙ ව න් රිසියවත් දෙව නා දෙ ව න් මි ණි
ගු ව න් මිණි කුලග ගුවනා ගු ව න් මි ණි
මෙ ව න් රජ මිණිව දුල නා මු දු න් මි ණි

---

(අලඞ්කාරකරනලද්දවූ); පතර, මහත්වූ; පල, ඡදනයන්ද; පිරියමින්, පරිකර්මයෙන්; හෙවත් සුඥපිරියමින්; උදුල, උජ්ජ්වලිතවූ; බිතු, භිත්තින්ද; නයනඅයා, නෙත්‍රව්‍යාදනයකොට; දුක දුක, දර්ශනය කරමින්; හෙවත් දර්ශනයෙන්; රිසි, දර්ශනාභිලාෂය; නොයන කල, පහනොවනකල්හි; පහ්‍යසිරි, (අශේෂ) ප්‍රාසාදයාගේශ්‍රීවිලාසය; තියා, කථනයකොට; අගවනු, ඇඟවීමකරන්නේ; කෙලෙස, කොයි ලෙසින්දුසි; බල, අවලොකනයකර; හෙවත් චින්තනාකර.

නගරවර්ණනාවට ඉක්බිත්තෙන් නරේන්ද්‍රවර්ණනාව කරනු කැමැත්තෝ " **සිරිසියබා** " යනාදිය ප්‍රකාශකරන්නාහ.

සබඳ !, මිත්‍රය !; එපුරේශ්වර, ඒ ගඟාශ්‍රීපුරයට අධිපතිවූ; නරේශ්වරයාගේ, රජහුගේ; කීර්තිප්‍රතාපවිශෙෂ, යසස් තෙජස් දෙදෙනාගේ විශෙෂප්‍රවෘත්තිය; ශ්‍රවණයකර, අසනුමැන.

13. සිරි, ශ්‍රීදේවිය; නිති, නිරතුරුව; සියබාතෙලෙ, ස්වකීය බාහුතලයෙහි; ඔලඹා, එල්බී; රැඳි, රඤ්ජිතවූ; කෙසර, සිංහ යකුගේ; රුපු, ශත්‍රූන්නැමැති; ගජ, හස්තීන්ගේ; බා, බලය; හෙවත් ශක්තිය; මුල්නොතබා, මූලශෙෂ්‍යනොකොට; හෙවත් නිර්මූලකොට; ගත්, ග්‍රහණයකළාවූ; ලක, ලඞ්කාව; ඔලඹා, අවලම්බනයකොට; හෙවත් අත්පත්කොට; සිරි, සම්පත්තිය; සුලබා කළ, සුලභ්‍යකළාවූ; (ලක්දිව අත්පත්කොට සම්පත් සුලභකළාවූ යන අර්ථයි) මහබා, මහාභාග්‍ය ඇති; පවර, උත්තමවූ; බුවනෙකබාරජ, භුවනෛකබාහුනරේන්ද්‍රය !; (තුඹවහන්සේ) මෙපුර, මේ නගරයෙහි; දිනා, ජයග්‍රහණය කරන් නෙහි වා.

14. සවන්මිණි ගුණ, ශ්‍රෙෂ්ඨබුද්ධගුණයෙන්හා; දහම, ධර්මයෙන්; සවන්, (නමාගේ) ශ්‍රවණද්වය; සදනා, සරසන්නාවූ; (නො

---

* "කීර්තිප්‍රකාශ"-සම්හර. † "පොලඹා"-ඇතැම්.

15 සොබම න් යොවුන් මත් යොන් සැපි අදුන් ව න
දෙන ම න් රුව න් වින් දන මන නදු න් ව න
ඉසු රෙ න් අ මි න් පුන්*දසසත් නු ව න් ව න
නි රි දු න් මෙව න් දන් ලෝසත මු දු න් ව න†

16 නුබ මිණි කුල කිරුළු අගරඟ මිණෙවි යෙ දූ
නව මිණි දෙරණිසුරු රජකුමරුවන් ල දූ
ගුණ මිණි අනගි අබරණ පැළඳි පිරිසි දූ
ලිය මිණි බිසෝහිමි රජකුල සිරින් සැ දූ

---

හොත්) සවන්, සර්වඥයන්වහන්සේගේ; ගුණදහම, ගුණයෙන් හා ධර්මයෙන්; සවන්, (තමාගේ) ශ්‍රවණවය; මිණි, මාණික්‍යකුණ්ඩලාභරණයකින් මෙන්; සදනා, සරසන්නාවූ; ලෙවන්, ලොකවාසීන්ට; රිසියවන්, රිසියෙන්නක්; දෙවනා, දානයකරවන; දෙවන් මිණි, චින්තාමාණික්‍යයක් බඳුවූ; ගුවන්මිණි කුල, සූර්යවංශනැමැති; අග ගුවනා, ශ්‍රෙෂ්ඨවූ ආකාශයට; ගුවන් මිණි, නභොමණිහුවැනිවූ; හෙවත් සූර්යයාවැනිවූ; මුදුන්මිණි, ශිරොමණිවූ; හෙවත් සියල්ලන්ට ශ්‍රෙෂ්ඨවූ; මෙවන්රජ, මේ ආකාරනරෙන්ද්‍රයා; මිණිව, මාණික්‍යයක්වැනිව; දුලනා, ජ්වලිතවන්නේය.

15. සොබමන්, ශොභමානවූ; යොවුන්, යෞවනයෙන්; මත් යොන්සැපි, අනඞ්ගවිලාසය; අදුන්වන, සඤ්ජානනයකරන්නාවූද; දන, (යාචකභාවයෙන් පැමිණි) ජනයන්ට; දෙන, (ඉල්ලූදෑ) ප්‍රදානය කරන්නාවූද; (එහෙයින්ම) මනනදුන්වන,මනොනන්දනයවන්නාවූ; මන්රුවන් වන්, චින්තාමාණික්‍යයක් වැනිවූ ද; පුන්, පරිපූර්ණවූ; හෙවත් අනූනවූ; අමින්, ප්‍රමාණනැත්තාවූ; ඉසුරෙන්, ඓශ්වර්යයෙන්; දසසතනුවන්වන, සහස්‍රනයනයාවැනිවූ ද; හෙවත් ශක්‍රයා බඳුවූද; මෙවන්, මේඋක්තප්‍රකාරයෙන්; ලෝසන, ලොකසඞ්ඝයන්ට; මුදුන්වන, ශිරොභූතවූ; නිරිදුන්, භුවනෛකබාහුනරෙන්ද්‍රයා; දන්, ජනනයකරව; හෙවත් අදුනව.

නරෙන්ද්‍රවර්ණනානන්තරව බිසෝවර්ණනාව කරන්නෝ "නුබ මිණිකුල" යනාදිය ප්‍රකාශකෙරෙති.

16. නුබමිණිකුල, සූර්යවංශනැමැති; කිරුළු, කිරීටයෙහි; යෙදූ, යුක්තකළාවූ; අග අග්‍රවූ; රඟමිණිඑවි, ජ්‍යොතිරඞ්ගමාණික්‍යයක්බඳුවූ; නවමිණි, අවනතවූ; දෙරණිසුරු, පෘථිවීශ්වරවූ; නොහොත් නව මිණිදෙරණිසුරු, නවරත්නනායකවූ; රජකුමරුවන්, රාජකුමාරයන්;

---

* "පුන්-පූන්"-බොහෝ. † "අදුනවලෝ මුදුන්වන"-ඇතැම්.

17 වැඩි සිරි නත් ඇති වන් නෙත් මන්ලෙස ට
රිසි සිරි දන දෙනු යෙන් කප්ලියෙව් තු ට
ජය සිරි දූන් වඩි නෙත් මේ පුරවර ට
ජය සිරි නම්. මෙබිසෝමයි මෙසමය ට

18 ලෙවන් බැලුම් ඉඳු දිගු නිල් යොත් ලුව ද
නුවන් යුවල මින් යුවලය එනි නොබ ද
මෙවන් ගුණෙන් රැඳි එබිසෝ ලදුන් සො ද
උවන් සහස යුත නත මිස වණනු කො ද

තවද ඒ පුරප්‍රවරයෙහි විරාජමාන යුවරාජ පදප්‍රාප්ත
ධරණීශ්වරයාගේ ප්‍රතාප ශ්‍රවණයකර.

---

ලදූ, ලද්දාවූ; පිරිසිඳු, පරිශුද්ධවූ; ගුණමිණි, ශ්‍රේෂ්ඨගුණනැමැති; අනගි මිණිඅබරණ, අනර්ඝවූ මාණික්‍යාභරණයන්; පැලඳී, පිලන්ධනයකලාවූ; රජකුලසිරින්, රාජකුලාංගනසම්පත්තියෙන්; සැදූ, සජ්ජිතවූ; නොහොත් රජකුල, රාජකුලය; සිරින්, රූපසෞන්දර්‍ය්‍යයෙන්; සැදූ, දීප්තිමත්කලාවූ; (මෙයින් රූපලාවණ්‍යයාගේ උත්කෘෂ්ටභාවය ප්‍රකාශිතයි) ලියමිණි, ස්ත්‍රීරත්නයක්වූ; බිසෝ නම්, උත්තමමහේෂිකාව; (දනු, ඡානනයකර).

17 මන්ලෙසට, සිත්වූපරිද්දෙන්; වැඩි, වෘද්ධිප්‍රාප්තවත්නාවූ; නත්සිරි, නානාශ්‍රීන්; ඇතිවන්නෙත්, විද්‍යමානවනහෙයින්ද; කප්ලියෙව්, කල්පලතාවක්මෙන්; දන, ජනයන්ට; රිසිසිරි, රුචිවූ සම්පත්තින්; තුට, සන්තොෂයෙන්; දෙනුයෙන්, දානයකරනහෙයින්ද; දූන්, මෙවර්තමානකාලයෙහි; ජයසිරි, විජයශ්‍රීය; මේපුරවරට, මේ පුරප්‍රවරයට; වඩිනෙත්, සම්ප්‍රාප්තවන හෙයින්ද; මෙසමයට, මේ කාලයෙහි; ජයසිරිනම්, ජයශ්‍රීනම්; මෙබිසෝවයි, මේමහේෂිකාවමය.

18. ලෙවන්, ලොකවාසීන්ගේ; බැලුම්, දෘෂ්ටිපාතනැමැති; ඉඳු, සෘජුවූ; දිගු, දීර්ඝවූ; නිල්, නීලවර්ණවූ; යොත්, රජ්ජුන්; ලුවද, ප්‍රක්ෂෙපකරනලද්දේද; නුවන්යුවල, නෙත්‍රයුගලනැමැති; මින්යුවලය, මත්ස්‍යයුගලය; එනි, ඒ ලොකවාසීන්ගේ දෘෂ්ටිපාතසඞ්ඛ්‍යාත රැහැණෙහි; නොබද, බඩනොවේද; මෙවන්ගුණෙන්, මේ උත්තම ප්‍රකාරගුණයෙන්; රැඳි, රඤ්ජිතවූ; සොද, සුන්දරවූ; එබිසෝලදුන්, ඒ උත්තම මහේෂිකාව; උවන්සහසයුත, වක්ත්‍රසහස්‍රයෙන් යුක්තවූ; අනන්තමිස, අනන්තනාමිනාගරාජයාමුත්; වණනු, වර්ණනාකරන්නේ; කොද, කවරෙක්ද?.

තවද, පැසුලුවත්; ඒ පුරප්‍රවරයෙහි, ඒ ගඞ්ගාශ්‍රීපුරවරයෙහි; විරාජමාන, භ්‍රාජමානවූ; යුවරාජපදප්‍රාප්ත, යුවරාජපදවියට පැමිණියාවූ; ධරණීශ්වරයාගේ, නරෙන්ද්‍රයාගේ; ප්‍රතාප, තෙජොවර්ණනාව; ශ්‍රවණයකර, ඇසුවමැනව.

19 දස සත පා අ ළ සත පා තෙද දිමු ත
පෙරකඳ පා ව න් ස ද පා යොවුන් ග ත
නවපිණි පා ව න් පි ණි පා කරන ස ත
දි න ඈ පා හි මි සි රි පා තඹර ප ත

20 ලො ව ට උතුම් කුලසිරි නුවන ගුණ රැ සා
අ ව ට පැහිරි යසතෙද අණ සක සක සා
රූ ව ට මෙඇම යෙන්*මවමින් උවිදු ලෙ සා
හි ව ට මෙහිමි කෙළෙ ලකරජ සිරි පිණි සා

21 කොකුම් වැ කු ම් වත්තෙද දිගඹුවන් ග ත
වි කුම් එ කු ම් යසි තෙවිකුම් වණන ස ත
දූ කුම් ඈ කු ම් කළරූරැසඟනන් නෙ ත†
රැ කුම් තැ කුම් ලොව ඔහු බැබලිණි සත ත‡

---

19. දිමුත, දීප්තිමත්වූ; තෙද, සූර්ය්‍යතෙජසින්; සතපා, සතනාප ඇත්තාවූ; දසසතපා, සහස්‍රරශ්මීහු; අළ, පහකළාවූ; හෙවත් නෙජස්නැත්තකුකළාවූ; සදපා, දවීසහිතවූ; පෙරකඳපාවන්, පූර්ව මලවිශෙදියාපරිද්ඡෙදන්; යොවුන්, තරුණභාවිය; ගත, ග්‍රහණය කළාවූ; නවපිණිපාවන්, (දශ්නියවිලාසයෙන්) ප්‍රෘණීවතුයාබඳුවූ; සත, සත්ත්වයන්විසින්; පිණිපාකරන, ප්‍රණිපාතකරනුලබන්නාවූ; සිරිපාතඹරපත, ශ්‍රීපාදපද්මපත්‍රයක්ඇති; ඈපාහිමි, ආදිපාදස්වාමිය !; (යුෂ්මත්නෙම) දින, ජයග්‍රහණයකරත්නෙහිවා.

20. ලොවට, ලොකයාහට; උතුම්, ශ්‍රෙෂ්ඨවූ; කුලසිරි, කුල චාරිත්‍රය; නොහොත් කුල, වංශය; සිරි, ශ්‍රිය; නුවන, ඥානය; ගුණ රැසා, ගුණරාශිය; අවටපැහිරි, හාත්පසප්‍රසෘතරිතවූ; යස, කීර්තිය; තෙද, තෙජස; අණසක, ආඥචක්‍රයත; මෙඇමයෙන්, මෙසියල් ලෙන්යුක්තකොට; සකසා, සකස්ව; හිවට, බ්‍රහ්මතෙම; මෙහිමි, මේ ස්වාමියා; උවිදුලෙසා, විෂ්ණුහුපරිද්ශෙදන්; රූවට මවමින්, දශ්නිය විලාසයෙන් නිර්මාණයකෙරෙමින්; ලකරජසිරිපිණිසා, ලඞ්කාරාජ්‍යශ්‍රිය පිණිස; කෙළේ, කෙළේය; හෙවත් සැලැස්මී.

21. දිගඹුවන්, දිග්ලක්ෂණකානතාවන්ගේ; ගත, ශරීරයෙහි; වැකුම්වන්, ආලිම්පිනවූ; කොකුම්, කුඞ්කුමාඞ්ගරාගයක්වැනිවූ; තෙද, තෙජසින්ද; තෙවිකුම්, ත්‍රිවික්‍රමයාහා; හෙවත් ශ්‍රීවිෂ්ණුහා; එකුම් යසි, ඒකාකාරයසි; සත, සත්ත්වයන්විසින්; වණන, වර්ණනාකරනු

---

* "මෙඇමගෙණ"-ඇතැම.
† "පුත"-සිද පාඨයි. ‡ "බැමළිශයත්පත"-ඇතැම්.

22 උ දා වෙමින්*නිතිවැඩ පබසරන් ර දා
ර දා †දෙමින් සියසෙන් තඹුරු කැන්සෙ දා
සෙ දා ඉවත රුප ඳුරු තෙද රසින් ස දා
ස දා දියත නුබමිණිමෙන් මෙහිමි ස දා

23‡සු ර පු ර හරණ පිරිසිරි සරයෙ න් කල න
පු ර යු ර අලක නිරතුරු§දනකැ න් රඳ න
මෙම යු ර මියුර! බලමින් පුරම න් ලෙසි න
බ ඹ ව ර සඳැස් ඇස් නොකෙලෙ න් නොවළර න

---

ලබන; විකුම්, වික්‍රමයෙන්ද; දැකුම්, දර්ශනයෙහි; අඟනන්නෙත, අඞ්ගනාවන්ගේනෙත්‍රයන්; ඇකුම්කළ, ආක්‍රමණයකළාවූ; හෙවත් භ්‍රමණයකළාවූ; (බැලීමෙන් තෘප්තියට නොපැමිණිවූ යන අපීපි) රුරුස, රූපකාන්තියෙන්ද; ලොව, ලොකයාසම්බන්ධවූ; රැකුම්නැකුම්, රක්ෂණාභිලාෂයෙන්දයුක්තව; ඔනු, ඒරජනු; සතත, නිරන්තරයෙන්; බැබලිණි, භ්‍රාජිතවී.

22. නිතිවැඩ, (සත්‍යන්සම්බන්ධව) නිත්‍යාභිවෘද්ධියෙහි; පබසරන් රදා, ප්‍රභාශ්වරනායකව; උදාවෙමින්, උද්ගතවෙමින්; නොහොත් පබසරන්රදා, උත්කෘෂ්ටතෙජස්සමූහයෙන් යුක්තව; උදාවෙමින්, ප්‍රකාශවෙමින්; සියසෙන්, සූර්‍ය්‍යබිම්බවනියාවූ; තඹුරුකැන්, පද්මසමූහයාට; සෙදා, ශීඝ්‍රව; රදාදෙමින්, රඤ්ජමාන භාවය දානයකෙරෙමින්; නොහොත් සියසෙන්, ස්වකීයසේනානැමැති; තඹුරුකැන්, තාමරසසමූහයාට; සෙදා, වහා; රදාදෙමින්, රඤ්ජමානභාවයදානයකෙරෙමින්; තෙදරසින්, තෙජොරශ්මියෙන්; සෙදා, දෘඪව; රුපඳුරු, ශත්‍රුභූතඅන්ධකාරය; ඉවතසදා, බාහිරයටයවා; නොහොත් තෙදරසින්, තෙජොලක්ෂණරශ්මියෙන්; රුපදුරු, ශත්‍රුලක්ෂණඅන්ධකාරය; සෙදා, සතතව; ඉවතසදා, දූරීභූතකොට; නුබමිණිමෙන්, සූර්‍ය්‍යයා පරිද්දෙන්; මෙහිමි, මේ ස්වාමීතෙම; දියත, ලොකය; සදා, සැම කල්හි; සදා, සජ්ජිතකරයි.

මෙසේ පූර්වවර්ණනානන්තරව ස්වාභීෂ්ටසන්දේශග්‍රහණයකොට ප්‍රයාණයකරනු කැමැති දූතයා පුරප්‍රවරයෙන් ප්‍රෙරණයකටැව්වූ කවිවරයෝ "සුරපුර" යනාදිය කථනය කෙරෙති.

23. කලණ, කල්‍යාණවූ; පිරි, පරිපූර්ණවූ; සිරිසරයෙන්, ශ්‍රීසාරය හෙතුකොටගෙන; සුරපුරහරණ, දිව්‍යපුරශොභාසදෘශවූද; නිරතුරු, අනරනැතිව; රදන, රඤ්ජමානවන්නාවූ; දනකැන්, ජනසමූහයා

---

* "පෙමින්"-ඇතැම්. † "තදා"-බොහෝ.
‡ මේකව මුද්‍රිත මයූරසන්දේශ පෙලෙහි නොආසේය. § "පුරතුර"-ඇතැම්.

24 ගහන් වියත වියෙකෙත සිටි සිටි තැනි නී
වහන් කරන*මල් මුවරද සල්හිසි නි
පහන් සඳෙහි රිවිකැන් † උදයග උඩි නී
පහන් සඳින් වඩු අම්බුලුවා කඩි නී

25 සලත් තලින් සත්කරු රන්වලලු ල න
ලොල් ත් වඩන වරගන නිලුපුල් නුව න
බලත් මෙතොප කප්පිල්ඇස් අදන මෙ න
බුලත් ගමුව බල නවයෝනන් කෙළ න

හෙතුකොටගෙන; අලකපුරයුර, ආලකමන්දානම්පුරයවැනිවූද; පුර, (මේ) පුරප්‍රවරය; (බැලීමපිණිස) වර, උත්තමවූ; සඳැස්, චන්ද්‍රාක්ෂීන්; ඇස්නොකෙළෙත්, (දර්ශනයට කාරණභූත) නෙත්‍රයන් නොකළ හෙයින්; හෙවත් නෙත්‍රයන් නොකෙළේයයි; බබ, බ්‍රහමයාට; උරණනොව, කොපනොවී; මියුර !, මධුරය !; මේමයුර, මේ ආකාරයෙන්; මන්ලෙසින, සිත්වූපරිද්දෙන්; බලමින්, නිරීක්ෂණයකොට:- (මතුකවනාසම්බන්ධයි)

24. ගහන්, ග්‍රහයන්; හෙවත් තාරකාවන්; වියත, ආකාශයෙහි; සිටිසිටිතැනිනි, ස්ථිතස්ථිතස්ථානයෙන්; වියෙකෙත, අසභාවන කල්හි; සල්හිසිනි, වෘක්ෂයන්ගේ මස්තකයෙන්; මල්මුවරද, පුෂ්පමකරන්දයන්ගේ; වහන්, වහනය; හෙවත් වැගිරීම; කරන, කරන්නාවූ; රිවිකැන්; සූර්‍ය්‍යකාන්තිය; උදයගඋඩිනි, උදයපර්වතමස්තකයෙන්; පහන්සදෙහි, පහළවූකල්හි; (හිරුඋදාවූකල්හි යන අර්ථයි) පහන්සඳින්, ප්‍රසන්නචිත්තයෙන් යුක්තව; අම්බුලුවාකඩිනි, අම්බුලුවාකඩනම්ස්ථානයෙන්; වඩු, ප්‍රයාණයකර.

25. රන්වලලුලන, බන්නාලදස්වර්ණවලයාභරණවූ; සල, චඤ්චලවූ; අත්, හස්තයන්ගේ; තලින්, තාලයෙන්; හෙවත් අත්පිඩුනැසීමෙන්; සත්කරු, සංඥාකොට හෝ ශබ්දකොට; ලොලත්වඩන, ලොභචිත්තවර්ධනය කරන්නාවූ; නිලුපුල්, නීලොත්පලසදෘශවූ; නුවන, නෙත්‍රයන්ඇති; වරගන, වරාඞ්ගනාවෝ; නොහොත් නිලුපුල් නුවන, නීලොත්පලසදෘශනෙත්‍රයෙන්; වරගන, වරාඞ්ගනාවෝ; මෙතොප, මේයුෂ්මත්හුගේ; කප්පිල්ඇස්, මයූරපිඤ්ජාක්ෂීන්; අදනමෙන, ආකර්ෂණයකරන්නාක්මෙන්; බලත්, නිරීක්ෂණයකෙරෙති; (මේ ආකාරයෙන්) නවයෝනන්, යොවුන්වියසිටිගැහැණුන්; කෙළන, ක්‍රීඩනයකරනුලබන; බුලත්ගමුව, බුලත්ගමුවනම්ග්‍රාමය; බල, නිරීක්ෂණයකර.

* "කරන"-සී ද පෙරෙණ. † "රිවිරුස්"-බොහෝ.

26 සැ වි යෙන් නඳුනුයන තුරුයව් සැදි සි වි යෙ න්
අ වි යෙ න් ඉන් නොසිට යාගන් **දික්පි වි යෙ න්**

27 උදුසු නි ලා පැහැගෙණ*ගන ව ලා පෙ ලා
විදු ලිය ලා සහ බටනැත් තු ලා ක ලා
තුනුඋ දු ලා යන එන මන ක ලා ලෙ ලා†
මග වි පු ලා වෙලබල **අල ප ලා වෙ ලා**

28 ගෙවුයන් සි රි න් සැදි උයනෙව් පුර න් ද ර
ඉසුරෙන් ද න න් රැඳි ගුණයෙන් නිර න් ත ර
අඟන න් නෙනෙත් දුල‡රත්හසුන සු න් ද ර
යා ග න් නො සි න් දුක **ගුරුගොඩ අර න් දෙ ර**

---

26. තුරුයව්, වෘක්ෂයන්ගේ; සැදිසිවියෙන්, සජ්ජිතවසිටිහෙයින්; සැවියෙන්, ආකාරයෙන්; නඳුනුයන, නන්දනෝද්‍යානයවැන්න; ඉන්, එහෙයින්; අවියෙන්, (ඔවුන්කෙරෙහි) අභිලාෂයෙන්; නොසිට, නොරැඳ; දික්පිවියෙන්, දික්පිවියනම්ග්‍රාමයෙන්; යාගන්, යාත්‍රාග්‍රහණයකර.

27. ගන, සාන්ද්‍රවූ; උදුසුනිලාපැහැ, උදක්අභිනීලවර්ණීය; ගෙණ, ග්‍රහණයකොට; (අතිශයින්ම නීලවර්ණවූ යන අර්ථයි) වලාපෙලා, වලාපඞ්ක්තියක්; විදුලියලාසහ, විද්‍යුල්ලතාවහාසමගින්; බටනැත්තුලා, අවකීර්ණස්ථානයක්මෙන්; ලෙලා, ලලිතව; යනඑන, ගමනාගමනයකරන; මනකලා, මනඃකල්‍යවූ; කලා, කාන්තාවන්ගේ; තුනු, දේහයෙන්; උදුලා, උජ්ජ්වලිතවූ; මග, මාර්ගස්ථානයෙහි; අලපලාවෙලා, අලපලාවෙලනම්වූ; විපුලා, විශාලවූ; වෙලා, ක්ෂෙත්‍රය; බල, අවලෝකනයකර.

28. පුරන්දර උයනෙව්, ශක්‍රයාගේ නන්දනෝද්‍යානයසෙයින්; සිරින්, ශෝභාවෙන්යුක්තවූ; ගෙවුයන්, ගෘහෝද්‍යානයන්ගෙන්; සැදි, සජ්ජිතවූද; ඉසුරෙන්, ඓශ්වර්‍ය්‍යසිරියෙන්හා; නිරන්තර, අන්තර නැත්තාවූ; ගුණයෙන්, ගුණයන්ගෙන්යුක්තවූ; දනන්, ජනයන්ගෙන්; රැඳි, රඤ්ජිතවූද; රත්හසුන, සුවර්ණහංසයන්බඳු; නෙනෙත්, පයෝධරයන්ගෙන්; සුන්දර, ශෝභමානවූ; අඟනන්, අඟනාවන්ගෙන්; දුල, ජ්වලිතවූද; ගුරුගොඩ, ගුරුගොඩනම් ග්‍රාමයෙන්වූ; අරන්දෙර, එනම්ප්‍රදේශය; දුක, දර්ශනයකොට; නොසින්, සන්තොෂයෙන්; යාගන්, යාත්‍රාග්‍රහණයකර.

---

* "පැහැගත-සිද පෙළෙක්. † "ලොලා"-හැම. ‡ "කළ-පළ"-බොහෝ.

29 එකිනෙකිනේ මිණි නිදනේ නිදන මෙන
අද අදනේ පියවදනේ පියවද න
ඉටු සකිනේ තුටු සකිනේ නරඹ මි න
දෙරවකිනේ නොවළකිනේ යනු ගම න

30 නෙත් සනහමින් බලමින් බුදුරුව වෙසෙස*
අත් වනතුරුම මොක් බවදුක් නොවනලෙ ස
සිත් තනමින් පතමින් පින්පල විසෙ ස
අත්තනගල්ල නමදුව නමමින් සිර ස

31 රවිකළ මී ලොල් ලේ මී ලොල් ලේ ය
පුල් දෙඹ නා ගොල් ලේ සෙව නැල් ලේ ය
මගආරලි එල් ලේ සුදු වැල් ලේ ය
යවඕපත් ඇල් ලේ සිතු ඇල් ලේ ය

---

29. නිදනමෙන, නිධානාකාරවූ; එකිනෙකිනේ, එකිනෙක; මිණිනිදනේ, මාණික්‍යපතල්ද; අදඅදනේ, චිත්තාකර්ෂණයකරන්නාවූ; පියවදනේ, ප්‍රියමුහුනින්යුක්තවූ; පියවදන, සුමුඛින්ද; හෙවත් මනාකාන්තාවන්ද; ඉටුසකිනේ, ප්‍රියමිත්‍රය !; තුටුසකිනේ, (ඔබගේ) ප්‍රියවයස්‍යයින්; නරඹමින, නිරීක්ෂණයකෙරෙමින්; දෙරවකිනේ, දෙරවකනම්ග්‍රාමයෙන්; නොවළකිනේ, නොරඳ; ගමනයනු, යාත්‍රාකර.

30. බුදුරුව, බුද්ධප්‍රතිමාවගේ; වෙසෙස, විශේෂය; හෙවත් ප්‍රමෝදජනකවිලාසය; බලමින්, නිරීක්ෂණයකෙරෙමින්; නෙත්, නෙත්‍රයන්; සනහමින්, සන්තර්පණයකොට; මොක්, නිර්වාණය; අත් වනතුරුම, හස්තප්‍රාප්තවනතාක්ම; බවදුක්, සංසාරදුඃඛයෙන්; නොවනලෙස, නොලැබෙනපරිද්දෙන්; සිත්, චිත්තය; තනමින්, එකාග්‍රකොටගෙන; විසෙස, විශේෂවූ; හෙවත් ශ්‍රේෂ්ඨතරවූ; පින් පල, පුණ්‍යඵලයන්; පතමින්, ප්‍රාර්ථනාකෙරෙමින්; සිරසනමමින්, ශිරෝවනතයකොට; අත්තනගල්ල, හත්තවනගල්ල නම්වූ විහාරය; නමදු, නමස්කාර කර.

31. මීලොල්ලේ, මීකරඳුලොලතිබයෙන්; මීලොල්ලේය, මධුලොල යන්විසින්; රවිකළ, රවදුන්නාකළාවූ; පුල්, විකසිතවූ; දෙඹ, පුන්නාගවෘක්ෂයන්හා; නාගොල්ලේ, නාගවෘක්ෂසමූහයාගේ; සෙව නැල්ලේය, ඡායාඇත්තාවූ; මග එල්ලේ, මාර්ගයහාත්පස; සුදුවැල් ලේය, ශෝභනවාලුකාහා; ආරලි, හයමාරකවෘක්ෂයන්ඇත්තාවූ; ඕපත්ඇල්ලේය, ඕපත්ඇල්ලනම්ස්ථානයෙන්; සිතුඇල්ලේය, චිත්තාල යෙන්; යම, ප්‍රයාණය කර.

---

* "බුදුරුවත්වෙස"-ඇතැම්.

32 ලිය ලිය ගී කියන හ ඞි න්
මද මද විඳ එමන් ක ඞි න්
පිපි විසිතුරු යටන් බ ඞි න්
යව මොනරිඳු එවැබ ඞි න්

33 කි ර ණ විහිදි පහකුළු තුඟු කොති න් සැ දූ
න ර ණ ලියෙව් පියලන පිය ලිය න් රු දූ
දෙ ර ණ නුසුලතමෙන් සව් සිරි න් යෙ දූ
ක ල ණ මහ කැලණිපුර පිරි සිරි න් ව දූ

34 කියඹුවත උදුල*කැලලොත ල සේ කර
පැලඳි ඹරඳි මලිගිය මලි නි සේ කර
ලියෙව් ලියන් කැලු මලු ලපලු සේ කර
තොදකු නොපටු සිතිවිලි සිත තො සේ කර

32. ලිය, කාන්තාවන්විසින්; හඬින්, ශබ්දනැගීමෙන්; කියන, කථනයකරනුලබන්නාවූ; ලියගී, ලයානුගතගීතිකාවන්; මදමද, මදක්මදක්; විද, විඳිනායකොට; හෙවත් ශ්‍රවණයකොට; එමන් කඬින්, ඒමාගිවාරාසස්ථානයෙහිවූ; පිපි, පුෂ්පිතවූ; විසිතුරු, විචිත්‍රවූ; යටන්බඹින්, වෘක්ෂයන්ගේසමීපයෙන්ගොස්; එවැබඹින්, වැබඩනම් ඒස්ථානයෙන්; මොනරිඳු!, මයුරෙන්ද්‍රය!; යව, ප්‍රයාණය කර.

33. විහිදිකිරණ, විහිණීරශ්මිඇති; කොතින්, ශෘඞ්ගයෙන්; සැදූ, සජ්ජිතවූ; තුඟු, උත්තුංගවූ; පහකුළු, ප්‍රාසාදකූටයන්ගෙන්ද; නරණ ලියෙව්, මනුෂ්‍යභාර්යාවබඳුවූ; පියලන, සවර්ණයකරන්නාවූ; නොහොත් ප්‍රියභාවයවඩිනායකරන්නාවූ; පියලියන්, ප්‍රියස්ත්‍රීන්ගෙන්ද; රුඳු, රජිතවූ; දෙරණ, ධරණිය; නුසුලතමෙන්, නොදරණතරම්වූ; සව්සිරින්, සකලශ්‍රීසම්පත්තීන්; යෙදූ, යුක්තකළාවූ; සිරින්පිරි, ශ්‍රීපරිපූර්ණවූ; මහකැලණිපුර, මහාකල්‍යාණීපුරයට; කලණ!, කල්‍යාණමිත්‍රය!; වදු, ප්‍රවේශවෙව.

34. කැලල්ඔත, කලඬකාඩිතවූ; හෙවත් ශශලාඤ්ඡනශුභණය කළාවූ; ලසේකර, බාලචන්ද්‍රයාබඳු; කියඹුඋදුල, අලකමාලායෙන් ජ්වලිතවූ; වත, මුහුනින්ද; සේකර, විශේෂකෙරෙති; පැලඳි, පිළන්ධනයකළාවූ; මලිහියමලිනි, මාලතීපුෂ්පයෙන්ද; ඹරඳි, විරාජමානවූ; (එහෙසින්ම) ලපලුසේකර, විශේෂකොටහිසසඤ්ජාතබාලපල්ලවයන්ගේ; කැලුම්, කාන්තියෙන්; අලු, ආලෝකඇත්තාවූ; ලියඑව්, ලතාකෘතිවූ;

* "කියඹුවතඋදුල-කියඹුවතලඹුව"-යි ද පෙළෙකි.

35 රුවදූක  නොමින්* සුරඟනයයි කළ  මා න
දනසක  රදන නවයෝනන් සොබ  මා න
දූකදූක  මෙපුරවර සිරිසර අසම  මා න
බිසරැක  මිසක් නොකියමු සුරපුර  මා න

36 නොලගි  ලොබින් බලමින් එපුරෙහි වෙසෙස  ස
අනගි  නළඟනන් සහ රජගෙට පිවි  ස
නළගි  රඟුම් පුද අනතුරුවූ විග  ස
යසගි  කොකාසන් කරැ සබමැදට බැ  ස

ලියන්, සත්‍රීන්; (මේ පෙදෙත් සත්‍රීන්ගේ ලීලාවත් චඤ්චලභාවය නිදර්ශනයයි) නොපවුසිතිපිලිසිත, බොහෝවිනකීයතිනාවූ (නාගේ) චිත්තය; නොසේකර, සඤ්ඤානාශකොට; නො, යුෂ්මත්තෙව; දකු, දර්ශනය කර.

35. රුව, රූපසෞන්දර්යය; නොමින්දූක, බොහෝසේබලා; සුරඟනායයි, (මේ) දිව්‍යාඞ්ගනාවෝයයි; මානකළ, නිශ්චයකළාවූ හෝ කල්පනාකළාවූ; දන, ජනයන්ගේ; සක, අක්ෂීන්; රදන, රජමාන වන්නාවූ; (ජනයන්විසින් බැලුම්ලබන්නාවූ යන අර්ථයි) නවයෝ නන්, තරුණයුවතීන්ගෙන්; සොබමාන, ශොභමානවූ; සිරිසර, ශ්‍රීසාරයෙන්; අසමාන, අසදෘශවූ; මෙපුරවර, මේපුරප්‍රවරය; නො හොත් සොබමාන, ශොභමානවූ; නවයෝනන්, තරුණයුවතීන් ගේ; රුව, රූපලාවණ්‍යය; නොමින්දූක, බෙහෙවින්දර්ශනයකොට; සුරඟනායයි, (මේ) දිව්‍යාඞ්ගනාවෝයයි; මානකළ, නිශ්චයකළාවූ; දන සක, (සලලාල) ජනසමූහයා; රදන, රඤ්ජමානවන්නාවූ; මෙපුරවර, මේපුරප්‍රවරයෙහි; අසමාන, අසදෘශවූ; සිරිසර, ශ්‍රීසාරය; දූකදූක, බලබලා; සුරපුර, දිව්‍යපුරය; මාන, (මීට) සමානය යන; මිස, නිම; රැකමිසක්, නවත්වාගෙණමුත්; නොකියමු, (අන්ආකාරයකින්) කථනයනොකරමු; (මේපුරප්‍රවරයට දිව්‍යපුරය සමයයි නොකියයුතු මය යනුභාවයි)

36. එපුරෙහි, ඒනගරයෙහි; (විද්‍යමානවූ) වෙසෙස, විශෙෂා ලඞ්කාරය; බලමින්, (උක්තප්‍රකාරයෙන්) නිරීක්ෂණයකෙරෙමින්; ලොබින්, ලොභචිත්තයෙන්; නොලැග, නොරඳා; අනගි, අනර්ඝවූ; නළඟනන් සහ, නාටිකාඞ්ගනාවන් හා සමග; රජගෙට, රාජභවන යට; හෙවත් චින්තාමණිදිව්‍යරාජයාගේ විමානයට; පිවිස, ප්‍රවිෂ්ටව; නළ, නාටිකාවන්ගේ; ගිරඟුම්පුද, ගීතනෘත්‍යොපහාරයට; අනතුරුවූ විගස, අනන්තරවූඇසිල්ලෙහි; සබමැද, සභාමධ්‍යයට; බැස, අවතීර්ණ ව; යසගි, යශොගීතිකාවෙන්; කොකාසන්කර, කොකාධ්වනිකොට:–

* “රුවසැකවෙමින්”- ඇතැම්.

37 විබිෂණසුරවරන—සිරිසරණ වැඳ දත් ව ත්
සි රි න් මු දු න් නිරිඳුන් සහ බිසෝ සඳුන්
ත රි න් බෙ ලෙ න් දිසිතුන් බෑ මෙහිමි සඳුන්
තෙසු රජමැති ඇමති –ඇසෙනගඇම සමගි න්
දස ර ත එ ර ම් නිරිඳුට ජයදුන් ලෙ සි නි
දස අ ත ත ර ම් වැඩි අණසක සලස මි නි
සක සක අත මෙදෙව් ඇම ට
වැඩිසිරි දී රුහි විලස ට
සෙතකර රැකිය කප්හිම ට
යුත මෙපවත කියදෙවිඳු ට

38 කැලුමත් වෙර වෙර ඉසි න් ට
කොඳවන වත පුබුදුව න් ට
බමරුන් මුවරදූර ය න් ට
මදරද දුනුකමට එ න් ට

---

37. විබිසණසුරවරන, විභීෂණනම් සුරෙන්ද්‍රයාණෝ; සිරිසරණ, ශ්‍රීචරණයුග්මය; වැඳ, නමස්කාරකොට; දත්වත්, (මේ වක්ෂ්‍යමාණ ප්‍රවෘත්තිය) සැලකරන්- (කෙසේද?) සිරින්, ශොභාවෙන්; මුදුන්, ශ්‍රෙෂ්ඨවූ; බිසෝ සඳුන් සහ, උත්තම මහෙෂිකාව හා සමග; නිරිඳුන්, නරෙන්ද්‍රයා; තරින්බෙලෙන්, ස්ථිරශක්තියෙන්; දිසි, දෘශ්‍යමානවූ; මෙහිමිසඳුන්, මේ ස්වාමිඋත්තමයාගේ; තුන්බෑ, ත්‍රිභ්‍රාතෘන්ද-තෙසු, අවශෙෂවූ; මැති, මන්ත්‍රිය; රජඇමතිඇ, රාජාමාත්‍යාදිවූ; ඇමසෙනග සමගින්, සකලසෙනාඞ්ගයන් ද සමගව-දසරත, දසරථරජහුගේ පුත්‍රවූ; එරම්නිරිඳුට, ශ්‍රීරාමරජුට; ජයදුන්ලෙසිනි, විජයශ්‍රීප්‍රදානයකළ පරිද්දෙන්; දසඅත, දසදිගුත්හි; වැඩිතරම්, අධිකප්‍රමාණයෙන්; අණසක, ආඥාචක්‍රය; සලසමිනි, (ප්‍රකාශයට) සලසමින්-සක, ශක්‍රය; සකඅත, විෂ්ණුය යන; මෙ දෙවිඇමට වැඩි, මේසියලුදෙවියන්ට අධිකව; සිරි, සම්පත්තිය; රුහිවිලසට, අභිලාෂපරිද්දෙන්; දී, (මේ සැබදෙනාට) ප්‍රදානයකොට; සෙතකර, ශාන්තිකොට; කප්හිමට, කල්පාන්තයදක්වා; රැකියයුත, රක්ෂාකළයුත්තේයයි; (යන) මෙ පවත, මෙප්‍රවෘත්තිය; දෙවිඳුට, විභීෂණදිව්‍යරාජයාට; කිය, (අසවතුන් ගේ වචනයෙන්) කථනය කර.

38. වෙරවෙර, (නාගරිකජනයන්ගේ) ශරීරයක්ශරීරයක්පාසා; කැලුමත්, (වළඳු) කාන්තියගේ; ඉසින්ට, සිඤ්චනයද; කොඳවන, කුන්දවනයන්ගේ; පුබුදුවන්ට, ප්‍රබොධවීමද; මුවරද, පුෂ්ප මකරන්දය; ඇර, ග්‍රහණයකොට; බමරුන්, භෘඞ්ගයන්ගේ; යන්ට, ගමනයකිරී

39 දිලිවිදුලිය නුවනින් බලමින් සොඳි ත*
තතුසුව සැප පිළිවිසිනෙව් ගුම් බසි ත
වෙතසපැමිණි තසබඳගත කුළත්මෙ ත
ලගුතුරු රැව් රැඳි ඉදුමිණි පා මුදු ත

40 බි යෙ න් බිසරුවන් වේමග බැස සර ත
ව ස න් පියන් රසිනලුකළ රුවන් කො ත
ප හ න් වෙනි උන්නොපහන් නොකර ස ත
ල මි න් එදූක අඳ සිකර නුබේ ග ත

---

මද; දුනුකමට, ධනුඃකර්‍මයට; හෙවත් අනඞ්ගසරයෙන්යෞවනයන් පෙළීමට; මදරද, කාමදෙවයාගේ; එත්ට, ආගමනාර්‍ථද; වන, වන කල්හි; (මෙයින් සූර්‍ය්‍යාඅස්තවීමෙන් ශොභාමත් නිශාවනිතාවගේ සම්ප්‍රාප්තියසූචිතයි.)

39. විදුලිය, විද්‍යුල්ලතාසෙයින්; දිලි, උජ්ජ්වලිතවූ; නුවනින්, නෙත්‍රයෙන්; සොඳින, යහපත්වූ; හෙවත් සුපරීක්‍ෂිතව; බලමින්, නිරීක්‍ෂණයකෙරෙමින්; සුව, සුඛප්‍රවෘත්ති; සැප, සම්පත්ප්‍රතිලාභයසම්බන්ධවූ; තතු, (ඔබගේ) තත්ත්වය; ගුම්බසින, ඝොෂාන්විතනාදයෙන්; පිළිවිසිනෙව්, ප්‍රතිපෘච්ඡනාකාරත්නාක්මෙන්; වෙත, (යුෂ්මත්හුගේ) සමීපයට; ගතකුළත්මෙන, මෙඝකූටාකාරයෙන්; සපැමිණි, සම්ප්‍රාප්තවූ; තසබද, තාගේබන්ධුත්වගේ; තුරුරැව්, උත්තමරාවයෙන්; රැඳි, රඤ්ජිතවූ; ඉදුමිණිපා, ඉන්ද්‍රනීලමාණික්‍යමය ප්‍රාසාදයන්හුගේ; මුදුන, මස්තකයෙහි; ලගු, (රාත්‍රිකාලයෙහිවාසයපිණිස) ලගනුමෙව; හෙවත් නවාගනු.

40. වසන්, ප්‍රාසාදයන්ගේ; රුවන් කොත, සෞවර්ණශෘඞ්ගයන්ගේද; පියන්, (සෞවර්ණවූ) ඡදනයන්ගේද; රසින්, රශ්මියෙන්; අලුකළ, ආලොකමත්කළාවූ; වේමග, වීථිමාර්ගයට; අබිසරුවන්, අභිසාරිකාවන්; බැස, අවතීර්ණව; බියෙන්සරන, භීතියෙන්ඇවිදුනා කල්හි; සන, සඞ්ඝයෝ; හෙවත් සල්ලාලජනයෝ; උන්, ඒ ස්ත්‍රීන්; නොපහන්නොකර, ප්‍රසන්නනොවූවන්නොකොට; හෙවත් නො කැමැත්තේ අල්ලාගෙන; පහන්වෙනි, ප්‍රසන්නවෙත්; (මැණික් ආලොකයෙන් දීප්තිමත්ව දහවල්සේ බැබලෙන වීථිමාර්ගයට බැස ලජ්ජාවෙන්යුක්තව ඇවිදුනාස්ත්‍රීන් සල්ලාලයෝ අල්ලාගෙන ඔවුන් අකමැත්තවද තමන්ගේ මනදෙළපුරති යනු භාවයි) එදූක, ඒදශීනය කොට; අඳලමින්, සිත්බඳිමින්; නුබේ, යුෂ්මත්හුගේ; ගත, ශරීරය; සිකර, සිතිල්කරව.

---

* "සෙදිත-ලැදිත" කියි.

41 පාන ගොසින් නැගී වැඳ මුනිවිමන් තො සේ
පාන වෙමින් අදවඩමින් කුසල් රැ සේ
යාන සෙසින් යන පුරඳර පුරය දෙ සේ
මානඹ සින් යාගත් පින් පිඩක් ලෙ සේ

42 මුනි දියනා පෙර දියනා කළ දු ලිය
ඉන් දිවනා තොස දිවනා පුද කෙ ළිය
ගඟ බැස නා මග බැස නා කරගි ලිය
තොදවිසි නා බල විසිනා මස්කෙ ළිය

43 කිත් සිරිමේ වෙහෙරෙහි සෙත් පොද වන ල
සත් ගනකුළුවන් දුම්දුන් වැඳ උදු ල
පත් සා කප්පිල් කලඹින් ඇමද ලෙ ල
අත් පත් කර පින්පල මියුර! මනක ල*

41. පාන, ප්‍රාතඃකාලයෙහි; නැගී, (රත්නස්ථානයෙන්) උත්ථිතවූ; ගොසින්, ප්‍රයාණයකොට; මුනිවිමන්, බුද්ධප්‍රතිමාලය; තොසේ, සන්තෝෂයෙන්; වැඳ, අභිවාදනයකොට; පානවෙමින්, ප්‍රසන්නතායුක්තවෙමින්; අද, හෘදයෙහි; හෙවත් චිත්තයෙහි; කුසල්රැසේ, කුශලරාශියක්; වඩමින්, වර්ධනයකෙරෙමින්; පුරඳරපුරයදෙසේ, ඉන්ද්‍රදිග්භාගයට; යන, ප්‍රයාණයකරන්නාවූ; යානසෙසින්, යානාවක් මෙන්ද; පින්පිඩක් ලෙසේ, පුණ්‍යපිණ්ඩයක් පරිද්දෙන් ද; (ලෝකවාසීන්ට ප්‍රකාශවෙමින්) මානඹසින්, මානඹයනම් ස්ථානයෙන්; යාගත්, යාත්‍රාග්‍රහණය කර.

42. දියනා, ජගන්නායකවූ; මුනි, සර්වඥරාජයා; පෙර, පූර්වයෙහි; දුලිය, ජ්වලිතව; දියනාකළ, ජලස්නානය කළාවූ; ඉන්, එහෙයින් (ම); තොසදිවනා, සන්තෝෂයෙන්ධාවනයකරනා; දිවනා, දිව්‍යනාගයන්ගේ; පුදකෙළිය, පූජෝත්සවයෙන්යුක්තවූ; ගඟ, කල්‍යාණිනදියට; (ය) නාමග, (යුෂ්මත්හු) ගමනයකරනමාර්ගයෙන් (ම); බැස, බැසලා; කිලියකර, නිමග්නව; නා, ජලස්නානයකොට; විසිනා, විචිත්‍රවූ; හෙවත් දර්ශනීයවූ; මස්කෙළිය, මස්කෙළියනම්නදීතිමිය; විසිනා, විචිත්‍රවූ; හෙවත් රූපසෞන්දර්යයෙන් දර්ශනීයවූ; තොද, යුෂ්මතාද; බල, නිරීක්ෂණය කර.

43. සෙත්පොද, ශාන්තිජලබින්දුන්; වනල, වැතුරුණාවූ; කිත්සිරිමේවෙහෙරෙහි, කීර්තිශ්‍රීමේඝනාම්වූ විහාරයෙහි; ගනකුළුවන්,

* "සියනියමකල-පියනිය එකල"-සී ද පෙණෙ.

44 ඇල්ගෙවිලියන් සෙද යන මග දිග දෙපි ට
තගෙසෙබඩකු වියොවටපත් කෙත සක ට
ගබපිහිටන ලෙසවැස ගිම්නිවු ම කො ට
ලමින් කෙකා යන් ඇය කැඳවන ලෙස ට

45 ලෙස ලද් දන සියකුල සියගුණෙන් ස ර
රැ ඳි සද් දන සැදි මහවිදි මනහ ර*
ජ ය වද් දන ගජහයසෙන් රැඳි නිත ර
**ජ ය වද් දන පුර** සිරි සර බල මොන ර

---

**මෙඝකූටාකාරයෙන්; උදුල, උජ්ජ්වලිතවූ; සන්දමිදුන්, සපනඳෑමෙනි යන්; වැඳ, ප්‍රණාමයකොට; පන්සා, පත්‍රාකෘතිවූ; ලෙල, ලීලාමත්වූ; නොහොත් පන්සා, පත්‍රසහිතශාඛාකාරයෙන්; ලෙල, ලීලොපෙතවූ; කප්පිල්කලඹින්, (ඔබගේ) මයුරපිඤ්ඡකලාපයෙන්; ඇමද, (තද්ශාඛා බ්‍යඞ්ගනාය) සම්මාර්ජනයකොට; මනකල, මනඃකල්‍යවූ; මියුර !, මයුරය !; පින්පල, පුණ්‍යඵලයක්; අත්පත්කර, හස්තප්‍රාප්තකරත්.**

**44. ඇල්ගෙවිලියන්, ශාලිගොපිකාඞ්ගනාවන්; සෙද, බෙහෙවින්; යන, ගමනාගමනයකරන්නාවූ; මගදිග, දීර්ඝමාර්ගයාගේ; දෙපිට, උභයපාර්ශ්වයෙහිවූ; කෙත්අසකට, (අභිමත) ක්ෂෙත්‍රාංශයෙක්හි; තගෙ, යුෂ්මත්හුගේ; වියොවටපත්, වියොගප්‍රාප්තවූ; සෙබඩකු, මයුරාඞ්ගනාවක්හුගේ; ගබපිහිටනලෙස, ගර්භප්‍රතිෂ්ඨානයවනපරිද්දෙන්; වැස, වාසයකොට; ගිම්නිවුවකොට, ග්‍රීෂ්මනිර්වාපණයකොට; ඇය, තද්මයුරබෙනුව; කැඳවනලෙසට, කැඳවනපරිද්දෙන්; කෙකා ලමින්, කෙකාධ්වනිප්‍රකාශකෙරෙමින්; යන්, ප්‍රයාණය කරන්.**

**45. ලත්දනලෙස, ලද්ධවූධනයෙන් මෙන්; සියගුණෙන්, ස්වකීය ගුණයෙන්; නොවත් තමනමන්ට අයත් කුලචාරිත්‍රයෙන්; සර, සාරවූ හෝ උත්තමවූ; සියකුල, ශතසඞ්ඛ්‍යාතකුලවලින්හා; සද්දන, සාධු ජනතාවගෙන්; රැඳි, රඤ්ජනවූ; මනහර, (දෘෂ්ටිවිලාසයෙන්) චිත්තාකර්ෂණයකරන්නාවූ; මහවිදි, මහාවීථිපඞ්ක්තියෙන්; සැදි, අලඞ්කෘතවූ; ජයවද්දන, විජයශ්‍රීවර්ධනයකරන්නාවූ; ගජහයසෙන්, හස්ත්‍යශ්වසෙනාව; නිතර, නිරන්තරව; රැඳි, රඤ්ජිතවූ; ජයවද්දන පුර, ජයවර්ධනපුරයෙහි; සිරිසර, ශ්‍රීසාරය; මොනර !, මයුරය !; බල, නිරීක්ෂණය කර.**

---

* "පැහැතර"-ඇතැම්.

46 කුලගිරි තුමුල මේ මෙරගල එන කලය
ඇල නොම ඉපිල ජය ලොබල නදිරිනිලය
නිල පැහැනොවුල කළ අසිතල අත්තලය
බල දෙවිඳු බල තුල යෝබළ බලබලය

47 මද තුල සුවඳ ලොල බිඟුවැල කෙළි වනල
කත්තල පහල කළ සත්කළ ඉඟිලගිල
යුගකෙළ ගිය ඉපිල ගිරිපෙළ පහලකළ
දළ දල උදුල මොළ ගජරළ බල පුවළ

48 අණ සක් පතළ හිම්සඳකළ නියෝවිනි
දන සක් සමග ලක සුලකළ ගන ගලිනී
පුර සක් වළඳ ගල්හිම් පවුරු පෑයෙනී
පර සක් වළක වැනි පරසතුරෝ ඉතිනී

---

46. තුමුල, අතිමහත්වූ; කුලගිරි, කුලපර්වතපඞ්ක්තියද; මේ, මේඝයද; හෙවත් අසනිප්‍රහාරයද; මෙරගල, මහාමේරුපර්වතයද; එනකලය, ආගමනයකරනකලත්; ඇලනොම, පිටුනොපා; ඉපිල, ඉල්පී; හෙවත් උද්දීපනව; ජයලොබ, විජයලොභයෙන්; දිරිනිලය, ධෛර්‍ය්‍යනැමැති චඩ්වාරූනය; ලන, ප්‍රකාශකරන්නාවූ; නිලපැහැනොවු, නීලවර්ණනුවූ; හෙවත් ශ්වෙතවර්ණවූ; අසිතල, ඛඩ්ගතලයෙන්; අත්තලය, (සවකීය) හස්තතලය; ලකළ, අලඞ්කාරකළාවූ; බලදෙවිඳු, බලදෙවයානා; නොහොත් දෙවිඳුබල, දෙවෙන්ද්‍රයාගේ බලයහා; තුලබල, තුල්‍යබලඇති; යෝබළ, යොධභටයන්ගේ; බල, බලය; හෙවත් වික්‍රමය; බල, නිරීක්ෂණයකර.

47. මද, මදජලනැමැති; අතුල, ව්‍යාපනවූ; සුවද, සුගන්ධකල්කයෙහි; ලොල, ලොල්වූ; බිඟුවැල, භෘඞ්ගාවලියගේ; කෙළි, ක්‍රීඩායෙන්; වනල, ව්‍යාපනවූ; කත්තල, කර්ණතලයත්; පහලකළ, ප්‍රහාරදුන්නාකළාවූද; ඉඟිලඉඟිල, උද්ගතවෙමින්; හෙවත් නුත්නැතින් නැගිටනැගිට; සත්කළ, නාදකළාවූද; යුගකෙළ, කල්පාන්තයෙහි; ඉගිලගිය, ඉගිලීගියාවූ; ගිරිපෙල, පර්වතපඞ්ක්තියක්; පහළකළ, ප්‍රකාශකළාවූද; (පර්වතපඞ්ක්තියකට සදෘශවූ ඝන අවිසි) දළදල, ප්‍රෞඪවූදළධාවන්ගෙන්; උදල, උජ්ජ්වලිතවූද; මොළ, චණ්ඩවූද; පුවල, අතිවිශාලවූද; ගජරල, හස්තිසමූහයා; බිල, නිරීක්ෂණය කර.

48. දනසක්සමග, ජනසමූහයා හා සමගින්; ලක, ලඞ්කාව; නියෝවිනී, නියොගයෙන්; හෙවත් ආඥාචක්‍රයෙන්; සුලකල, සවලඞ්කෘතවූ; මෙහිමි, මේසවාමීනු විසින්; කළ, කරනලද්දාවූ; පතළ,

49 වැඩි පිය රම් රජ සීතාවන් ලෙසි නී
බස නො ත ර ම් නොඇසූ තම දිවි හිමි නී
ගු ණ ම න ර ම් ලිය රුදි රන් ලිය ලෙසි නී
ය ව **ස ග ර ම් සල් පිට** වෙල් පිට මගි නී

50 ලෙස නෙ විකු ම් රුපුනොතැකු ම් විකුම් කො ට
තු ගු තු ර ගු ම් බ ල සැ ල සු ම් සෙන් පිහි ට
ලො ව සි රි තු ම් ඇ ම පැ ව තු ම් කළ දිග ට
නි ති ම න ර ම් ව දු **ර සි ග ම් පුර** වර ට

51 එ පුරෙ හි පිළිමිණි පව්රස පිරි දියෙ නී
ඉ නි ර පිරි පිරිලෙල * ඒ මිණි බිතෙ නී
පැ නි ර ඔබින් ඔබ දිසි සේයා කෙවැ නී
ග ඹ ර තර එ දෙක උනුනුත් බලන වැ නී

---

ව්‍යාප්තවූ; අණසක්, ආඥාචක්‍රය; ගනනල්නි, පර්වතගනනාවූ; හෙවත් දුගිමවූ; පුරසක්වලද, (තමා අත්පත්කරගත්) පුරනැමැති චක්‍රවාට යෙහිද; ගල්හිමිඋවුරු, පර්වතසීමා ප්‍රාකාරයන්; පැහැනී, ප්‍රකාශකළ හෙයින්; හෙවත් පර්වතසීමාප්‍රාකාරයන් දක්වා පැහිරගිය හෙයින්; ඉගිනි, ඉඟිකින්; පරසතුරෝ, අන්‍යසතුරු; පරසක්වලකැවැනි, අන්‍ය චක්‍රවාටයෙක්හිවැනි;(වෙති).

49. රම්රජ පිය, රාමරජුගේ භාර්‍යාවූ; සීතාවන්ලෙසිනි, සීතා ප්‍රවේශයිපරිද්දෙන්; වැඩි, (ස්ත්‍රීන්ට අයත් සකලගුණ විශේෂයෙන්) වෘද්ධවූ; තම, තමාගේ; දිවිහිමිනි, ජීවිතාන්තයදක්වා; නොතරම් බස, ප්‍රමාණනොවන්නාවූවචනයක්; නොඇසූ, ශ්‍රවණයනොකළාවූ; ගුණ, ගුණයන්; මනරම්, මනෝරම්‍යවූ; රන්ලියලෙසිනි, ස්වර්ණලතා කාරවූ; ලිය, ස්ත්‍රීන්ගෙන්; රුදි, රජිතවූ; සගරම්සල්පිට, සගරම් සල්පිටනම්වූ; වෙල්පිටමගිනි, වෙල්මාගියෙන්; යව, ගමනය කරන්.

50. නෙවිකුම්ලෙස, ත්‍රිවික්‍රමයාටවිදුවූ; හෙවත් ශ්‍රීවිෂ්ණුදිව්‍යරාජයාටසමවූ; විකුම්, වික්‍රමයෙන්; රුපු, ශත්‍රූන්; නොතැකුම්කොට, නකින්‍යනොකොට; හෙවත් නොසලකා; තුඟු, උත්තුඞ්ගවූ; තුරඟුන්, අශ්වසේනාවගේ; බලසැලසුම්, විලපෑම්ඇති; සෙන්, සේනාව; පිහිට, ප්‍රතිෂ්ඨිතවූ; සිරි, සම්පත්තියෙන්හා; පැවතුම්, (මිනා) චාරිත්‍රයෙන්; ලොව, ලෝකයෙහි; ඇමදිගට, සකලදිශාවන්ට; උතුම්කළ, ශ්‍රේෂ්ඨ කළාවූ; හෙවත් ශ්‍රේෂ්ඨත්වයෙහි සිටියාවූ; නිති, නිත්‍යයෙන්; මනරම්, සිත්කලුවූ; රසිගම්පුරවරට, රසිගම්පුරප්‍රවරයට; වදු, ප්‍රවේශ වෙව.

51. එපුරෙහි, ඒනගරයෙහි; අස, (තම්හට) අභ්‍යාසනනාවූ; පිරි දියෙනි, පරිඛාජලයෙහි; ලෙල, ලීලොපෙනවූ පිළිමිණිපව්ර, ස්ඵටික

---

* "ලෙස"-පොත්.

52 තුඟු පා ළකළ කළ සල් පිල් වෙළඳ ද නා
නිති පා නොකර රඳනා රන් රුවන් ත නා
මිණි පා පහන් කිඳු උදු ඉඳිව වොරද නා
පිණි පා සියල් ලූ වැනි සිය කිරණ ම නා

53 රු ව න් බඳපොරෙදු බැඳ කදු සැරහු මෙ නි
ලෙ ව න් තුටු වඩම්නෙන * ගජ වේ මැදි නි
ගු ව න් මිණි උවම් මෙහිමි තෙද බෙලෙ නි
රු ව න් අකර පැහිරී ගිරි සරණ වැ නි

---

මාණික්‍යමය ප්‍රාකාරයාගේද; ඒපිළිමිණිබිනෙනි, ඒ සර්වකමාණික්‍ය භිත්තියෙහි; හෙවත් ඒ සර්වකමාණික්‍යමය ප්‍රාකාරයෙහි; ළෙළ, බබලන්නාවූ පිරි, පරිපූර්ණව; ඉහිර, (ජලය) ඉහිරියන්නාවූ; පිරි, පරිඛාවගේද; ඔබින්ඔබ, ඔවුනොවුන්; පැහිර, (මේ ආකාරයෙන්) ප්‍රසාරිතව; දිසි, දෘශ්‍යමානවූ; ඡේයා, ඡායාවෝ; කෙවැනි, කවර ආකාරද? එදෙක, ඒ පරිඛා—ප්‍රාකාරදෙදෙනාගේ; ගඹරතර, ගාම්භීර්‍ය්‍යතර වය; උනුනුන්, අන්‍යොන්‍යයන්; බලන වැනි, නිරීක්‍ෂණය කරන්සිතහිම්.

52. පානොකර, සිස්නොකොට; රන්රුවන් තනා, සුවර්ණරත්න යෙන් සරසා; වෙළඳදනා, වනිග්ජනයා; නිති, නිරන්තරයෙන්; රඳනා, රඤ්ජමානවන්නාවූ; තුඟු, උත්තුඟවූ; පා, ප්‍රාසාදපඞ්ක්තියෙන්; ළකළකළ, අලඞ්කාරකළාවූ; සල්පිල්, ආපණශාලාවන්හි; උදු, උදක්; ඉඳිව, තනනලදුව; වොරදනා, බබලන්නාවූ; මිණි, මාණික්‍යයන් ගේ; පා, ආලෝකනැමැති; පහන්කිඳු, ප්‍රදීපරශ්මිරජ්ජුහු; (කෙවැනිද?) පිණිපා, චන්ද්‍රයාවිසින්; මනා, යහපත්වූ; සියල්, නිරවශෙෂවූ; සියකිරණ, සවීයරශ්මීන්; ලූවැනි, බහනලද්දක් වැන්න.

53. රුවන්බඳ, රත්නබද්ධවූ; පොරෙදු, වරත්‍රාවන්; බැඳ, බන්ධනය කොට; කදුසැරහුමෙනි, ස්කන්ධයන් හෙවත් දෙහයන් සැරසීමෙන් යුක්තව; ලෙවන්, ලොකවාසීන්ගේ; තුටු, සන්තුෂ්ටිය; වඩමින්, වර්ධනයකෙරෙමින්; වේමැදිනි, වීථිමධ්‍යයෙන්; හෙවත් වීථිමාර්ගයෙහි; එන, ආගමනයකරන්නාවූ; හෙවත් සඤ්චාරණය කරන්නාවූ; ගජ, හස්තීන්ගේ (ආකාරය කෙබඳුද?) තෙදබෙලෙනි, තෙජෝබලයෙන්; මෙහිමි, මේ ස්වාමිහට; උවම්, උපමාවූයේ; ගුවන්මිණි, සූර්‍ය්‍යයා (කිසා); ගිරි, පර්වතපඞ්ක්තියෙක්; රුවන්අකර, රත්නාකරයෙහි; පැහිරී, ප්‍රසාරිතව; සරණවැනි, සඤ්චාරණයකරන්නාක් වැන්න.

---

* "තුටුව යන එන—තුටුවඩන එන"—පොත්.

54 උ සේ සරණ නුබසර යුවල නුබ කු සේ
තො සේ බලා පුරසිරි වත් නුවන් රැ සේ
මෙ සේ විමන් සසඟින් කොතන කැර සි සේ
කෙ සේ ගෙණෙව් දෝ සැක නොකරනුය කෙ සේ

55 එ පු ර ව රේ වරඟන වේමග * හස රා
ස ර ණ ව රේ පිළි බිඹු වෙසෙහි නොර තු රා
නොදුන ත රේ පිළි මිණි බිතට † පන්සැ රා
අ න ර තු රේ විද රුවටෙනුය පන්සැ රා

සබඳ! මෙපුරේශ්වරාධිශ්වර මහෙශ්වර මිත්‍ර අලගෙශ්වර නම්
ප්‍රභු රාජයාගේ විශෙෂ ශ්‍රවණය කර.

---

54. නුවන්වත්, නෙත්‍රයන්ටවිෂයවූ; පුරසිරිරුගේ, නගරශ්‍රී කදම්බය; තොසේ බලා, සංතනාෂයෙන් නිරීක්ෂණයකොට; උසේ, උත්තුඞ්ගවූ; නුබකුසේ, නභඃකුක්ෂියෙහි; නුබසරයුවල, නභශ්වර යුග්මයාගෙන්; හෙවත් හිරුසඳුදෙදෙනාගේ; සරණ, සඤ්චාරණය තෙම; (කුමක්පිණිසද යතහොත්?) මෙසේ, මෙප්‍රකාරවූ; විමන්, විමානයන්ගේ; සසඟින්, සංසර්ගයෙන්; කොතන, කවරනම්තැනෙක්; සිසේකැර, හිස්වූවක්කොට; (විමානනැතිකවරනම්තැනෙක් යනු භාවයි) කෙසේ ගෙණෙව්දෝ, කොයිලෙසකින් ග්‍රහණය කරව්දයන; (ග්‍රහණයකළහැක්කේද යන) සැක, ශඞ්කාව; කෙසේ, කිසිලෙස කින් (වත්); නොකරනුව, (කිසිවෙකුටත්) නොකිරීම පිණිසයි.

55. එපුරවරේ, ඒපුරප්‍රවරයෙහි; වරඟන, වරාඞ්ගනාවන්; වේමග, විප්‍රමාගියට; හසරා, අවහිඃණිව; සරණවරේ, සඤ්චාරණයකරන කල්හි; පිළිබිඹුවෙසෙහි, (උන්ගේ) ප්‍රතිබිම්බවෙෂයෙහි; නොරතුරා, විශෙෂවිභාගයක්; නොදුන, ජානනයනොකොට (ම); තරේ, මහත්වූ හෝ දීප්තිමත්වූ; පිළිමිණිබිතට, ස්ඵටිකමාණික්‍යමයභිත්තියට; පන්සැරා, පඤ්චබාණයෙන්; හෙවත් ශීඝ්‍රයෙන්; අනරතුරේ, අනන්තරයෙහි; විද, විදලා; පන්සැරා, කාමදෙවියා; (නිති, නිරන්තර යෙන්) රුවටෙනුය, වඤ්චිතවන්නේය.

සබඳ!, මිත්‍රය!; මෙපුරෙශ්වරාධිශ්වර, මේ උත්තම්පුරයට අධිපතිවූ; මහෙශ්වර, මහාරාජයන්ගේ; මිත්‍ර, මිත්‍රවූ; අලගෙශ්වරනම්, අලගක්කෝනාරනම්ඇති; ප්‍රභුරාජයාගේ, ප්‍රභුරජහුගේ; විශෙෂ ශ්‍රවණය, විශෙෂවර්ණනාශ්‍රවණයෙක්; කර, කරව.

---

* "වෙපසැ"-මෙත් පාඨයි. † "නිල්මිණි බිතට"-වැඩියක්.

56 ජ ය ස ක් බෝ වා ර තුඟු ජයනාද ක ර
රු පු ස ක් නා පැ ර ගත් ගජකෙසර යු ර
මු ලු ස ක් ව ළ නැ ර යස තෙද පිරි ඉති ර
අ ල ග ක් කෝ නා ර හිමිසඳ! දින මේ පු ර

57 මෙ ත ර ව මි න් රඳනා සරසවිය වෙ ත
වි ත ර වෙසි න් කළ මන් මුලුලෝ මවි ත
ස ත ර ව ගි න් නිතිනොදනන් සරණ ප ත
ස ත ර වෙහි න් තෙවුනෙය මේහිමි සන ත

58 තු න් කුළු වැනි තුන් රජසෙන් නරවග තී
මෙ න් සුරනිඳු පුරසුර ලෝ මුදුන් ප තී
ම න් තුඟු බල මැතිකුල කුලගිරින් යු තී
දූ න් මේහිමි රන්ගිරි සරිසිරින් යු තී

---

56. බෝවාර, අනෙකප්‍රසන්නාවන්නී; ජයසක්, ජයසඞ්ඛයෙන්; තුඟු, උත්තුඞ්ගව; ජයනාදකර, ජයඝොෂයකොට; ගජ, හස්තීන්; (පැහැරගත්නාවූ) කෙසරයුර, සිංහයාකුමෙන්; රුපුසක්නා, ශත්‍රුසමූහ නැමැතිහස්තීන්; පැරගත්, පැහැරගත්තාවූ; අලගක්කෝනාරහිමි සඳ, අලගෙශ්වරස්වාමිඋත්තමය!; නැර, ශෙෂනොකොට; යසතෙද, යසසින් හා තෙජසින්; මුළුසක්වළ, සකලචක්‍රවාටයෙහි; පිරිඉතිර, පිරීඉතිරී; මෙපුර, මේ නගරයෙහි; දින, ජයග්‍රහණය කර.

57. සරසවිය, වාග්වනිතාව; මෙතරවමින්, ප්‍රමානවිතවෙමින්; වෙත, සමීපයෙහි; රඳනා, රක්ෂාවානාවනුලබන්නාවූද; විතරවෙසින්, මහත්වූ දෙහවිලාසයෙන්; මුලුලෝ, සර්වසත්වයාගේ; මන්, චිත්තය; මවිනකළ, විස්මයපත්කළාවූද; සතරවගින්, චතුඃසඞ්ග්‍රහවස්තුවෙන්; නිති, නිත්‍යයෙන්; නොදනන්, අනෙකජනයන්ට; සරණපත, පිටි වනල්වූද; මේ හිමි, මේ ස්වාමිතෙම; සනත, නිරන්තරයෙන්; සතර වෙහින්, ශාස්ත්‍රවිධිවූපරිද්දෙන්; තෙවත් රාජනීතියෙහි ප්‍රකාශිත විධියෙන් යුක්තව; තෙවුනෙය, විරාජිතවූයේ.

58. තුන්කුළුවැනි, ත්‍රිකූටාකාරවූ; තුන්රජසෙන්, ත්‍රිවිධරාජ සේනාව; නරවගතී, සම්රවිගන්නාවූ; සුරනිඳුමෙන්, ශක්‍රයාපරිද්දෙන්; පුරසුරලෝ, පුරනැමැති දෙවලොකයාගේ; මුදුන්පතී, මස්තකප්‍රාප්තවූ; මන්, අභිමානය හා; තුඟුබල, උත්තුඞ්ගබලයෙන්යුක්තවූ; මැතිකුල, මන්ත්‍රිකුලනැමැති; කුලගිරින්, කුලපර්වතපඞ්ක්තියෙන්; යුතී, යුක්තවූ; මේහිමි, මේඅලගෙශ්වරස්වාමීහු; දූන්, මෙවර්තමාන කාලයෙහි; රන්ගිරිසරි, ස්වර්ණපර්වතශ්‍රීසාරයට සදෘශවූ; සිරින්, ශ්‍රීසාරයෙන්; යුතී, යුක්තයි.. (බැබලෙසිසේයි)

59 ව ත දෙ ත සම ත මේහිමි පත්නැන් පට නි
කෙත ව ත සතත පාබල බලවත් බැවි නි
ස ත සි ත ලෙසට් සිරිවැඩි සිරිකත විසි නි
ස ත කි ත යුග පටන අමුතුව් මැවෙන වැ නි

60 ගු ණෙ න් අමිත මත්කළ අමත කි ර ණ ට
තෙ දි න් සහසි සහසව සහස කි ර ණ ට
ඔ දි න් විකුම් පෑ නරවර තෙදෙ ර ණ ට
ක ගි න් පැහැර රුපු නොනිබියද ර ණ ට

61 සි ය සි ය ප ත් සිය පත් යුත්වූ සිරි නි
ශි මි සි ය ප ත් සිය පත් මෙන් වන තෙදි නි
රුපු ගණ ප ත් ගනපත් වල්වැද සෙදි නි *
මෙත් මහ ව ත් මහ වත් නොපතත් බියෙ නී

---

59. මේ හිමි, මේ ස්වාමීතු; පත්නැත්පටනි, (ප්‍රභුත්වයට) සම්ප්‍රාප්ත කාලයෙහි සිට; සමතවන, සම්පන්නවූවන්; දෙන, ප්‍රදානයකරන කල්හිද; හෙවත් දානයකරනහෙයින්ද; සතත, නිරන්තරයෙන්; කෙතවන, ක්ෂෙත්‍රවාසත්‍රය; පාබල, පාදභටයන් යනමොවුන් කරණකොටගෙන; බලවත්බැව්නි, වික්‍රමාන්විතහෙයින්ද; සත, සත්වයන්ගේ; සිතලෙසට, චිත්තාභිලාෂපරිද්දෙන්; සිරිවැඩි, ශ්‍රීවර්ධිතයවූ; සිරිකත විසිනි, ශ්‍රීකාන්තාවගේ වශයෙන්ද; හෙවත් සම්පත්තියගේ වශයෙන්ද; (අවලෝකනයකරනකල්හි) සත, සත්වයා; කිතයුගපටන, කෘත යුගයපටන්; අමුතුව, අභිනවයෙන්; මැවෙනවැනි, නිර්මිත වන්නාක්මෙන්න. (නොහොත් මේ ස්වාමීත්‍ර) සත, සත්වයාහට; පටන, ආද්‍යවූ; කිතයුග, කෘතනම්යුගය†; අමුතුව, අභිනවයෙන්; මැවෙන වැනි, මැවෙන්නාක්මෙනිසි.

60. අමිත, අප්‍රමෙයවූ; ගුණෙන්, ගුණයෙන්; අමතකිරණට, සුධාංශුහට; හෙවත් චන්ද්‍රයාට; මත්කළ, අවමන්කළාවූද; තෙදින්, තේජසින්; සහසකිරණට, සහස්‍රරශ්මිහට; හෙවත් සූර්යයාට; සහසව, හාස්‍යසහිතව; සහසි කළ, විඩම්බනයකළාවූද; ඔදින්, ඔජසින්; හෙවත් ශක්තියෙන් යුක්තව; තෙදෙරණට, ත්‍රිවිධබලධාරීට; විකුම් පෑ, වික්‍රමය ප්‍රකාශකළාවූද; නරවර, (මේ) නරවීරයා; කගින්, ඛඩ්ගයෙන්; පැහැර, ප්‍රහාරදානයකොට; රුපු, ශත්‍රූන්ගේ; දරණට, ධාරණයට; හෙවත් ජීවත්වීමට; නොනිබිය, (අවකාශ) නොතැබී.

61. සියපත්සියසිය, සූර්යබිම්බයට; හෙවත් සූර්යවංශයට; පත්, ප්‍රාදුර්භූතවූද; සිරියුත්වූ, ලක්ෂ්මීසඞ්ගතවූද; නොහොත් සියපත්

---

* "පලවැද ගොසිනි"-හැම. † "රජාහි යුග මුවැතෙ"-ස්මෘති.

62 තෙදයුත එහිමි* යුදපත සිපත ලෙලව ත
එමැද කමල ඇඳිමෙන් රුපු නොම සැලෙ ත
අදවත් ලපලු පත්එව් වෙවුලුම් ගනු ත
පිළිකුත් පතෙව් අවි ගිලිහුනු අතින් අ ත

63 රිවි තෙද දිමුත හිමි හිමකර විලස ව නි
සොම්සඳ සොම්ගුණ සෙ වනි හිරවත කෙවැ නි†
පිළිබිරුදෙකින් ගැලවියහැකිදෙසි සිහි නි
එදෙදෙන තමත්සැටි ඇර වෙස්වළන වැ නි

---

ශ්‍රීසිය, පද්මාවටබඳුවූ; පත්සිරිනි, ප්‍රතිලබ්ධශ්‍රීයෙන්; යුත්වූ, යුක්තවූද; (මේ) හිමි, (එම්) ස්වාමීහුගේ; සියපත් සියමෙන්, සහස්‍රරශ්මීහුගේ මෙන්; පත්වත, ප්‍රකාශවත්නාවූ; තෙදිනි, තේජස්හෙතුකොට ගෙන; පත්, (ශත්‍රුභාවයෙන්) පැමිණියාවූ; රුපුගණ, ශත්‍රුසමූහයෝ; ගනාපත්, ඝනභාවප්‍රාප්තවූ; මහවත් අතිවිශාලවූ; වල්, ආරණ්‍යයට; සෙදිනි, ශීඝ්‍රව; වැද, ප්‍රවිෂ්ටවැ; මහවත් මෙන්, මහමුහුනු පක්ෂීන් සෙයින්; මහවත්, මහාමානීයන්; මහවත් මනුෂ්‍යපථයක්; බියෙනි, භීතියෙන්; නොපතත්, ප්‍රාර්ථනානොකෙරෙති.

62. තෙදයුත, තේජොයුක්තවූ; එහිමි, ඒප්‍රභුරාජයා; යුදපත, යුධප්‍රාප්තව; අසිපත, ඛඩ්ගපත්‍රය; ලෙලවත, ලීලාපෙතකරනකල්හි; රුපු, ශත්‍රූන්; එමැදඇදි, ඒ මධ්‍යයෙහි අඳනාලද; මහවත් සිතුයම් කළාවූ; කමලමෙන්, පියුම්පරිද්දෙන්; නොම්සැලෙත, නොසෙල් වෙත්ම; (සගමසාගේ සිටිනකල්හි යනු භාවයි) අදවත්, හෘදයවසනුව; ලපලුපත්එව්, අභිශසින් ලාපත්‍රසෙයින්; වෙවුලුම්ගනුත, කම්පනග්‍රහණයකරනකල්හි; අතින් අත, හස්තයෙන් හස්තයෙහි; අවි, ආයුධයෝ; පිළිකුත්පත්එව්, පරිණතපත්‍රසෙයින්; ගිලිහුනු, ගලිතවූහු.

63. හිමි, ස්වාමීහුගේ; දිමුත, (සූර්‍ය්‍යරශ්මියට අධිකතරව) දීප්තිමත්වූ; තෙද, තෙජස්හෙතුකොටගෙන; රිවි, සූර්‍ය්‍යතෙම; හිමකර විලස, චන්ද්‍රයාගේ විලාසයට; වනී, වන්නේය; සොම්සඳ, සෞම්‍යචන්ද්‍රතෙම; හිරවත, (නාමයෙන් වාරයකවත් කලාඋනත්වයක් භජනය නොකොට හැමකල්හි එකස්වරූපයෙන්ම පවත්නාහෙයින්) ස්ථිර වත්නාවූ; සොම්ගුණසේ, (ස්වාමීහුගේම) සෞම්‍යගුණවිලාසයට; වනී, වන්නේය; කෙවැනි, (මේ දෙදෙනාගේ අවස්ථාවිපර්‍ය්‍යාසය) කෙවැනි දැයත්?; පිළිබිරුදෙකින්, ව්‍රීඩාභීරුවයෙන්; මෙවත් ලජ්ජාභයදෙකින්; ගැලවිය හැකිදෙසි, මිදියහැක්කේද්‍යයත; සිහිනි, චින්තායෙන්; එදෙදෙන, ඒ සූර්‍ය්‍යචන්ද්‍රදෙදෙනා; තමත් සැටි, තමන්ගේ

---

* "ඔහුතෙදයුත"-යනුත් පාඨයි. † "කාරවනුකෙවැනි"-පොත්.

හිමිසඳ සොහොයුරු ගුණසයුරු මනත්‍රීශ්වරයාගේ
ප්‍රකාශ ප්‍රතාප ශ්‍රවණයකර.

64 තු නු රු ව න් පුදන නිහි බැහිපෙමින් ල දී
ම සු රු ව න් සිතු සතුරුමෙන්ම ලුහුබැ දී
සි තු රු ව න් සෙයින් වත දෙවන යදි ය දී
මැ නි රු ව න් මෙදෙව්හිමි දෙව්තුරෙව් සැ දී

65 ලෝ ස ත් සතන් කොඳ නද කරවමි න් වෙ ත
යා ප ත් සොඳුරු සෙත් තුරු පිරිවරින් යු ත
බෝ ස ත් විලස උසුලන ලෝ මු දු න් ප ත
පැ ප ත් සදෙව් මේහිමි පිරි සිරි න් යු ත*

---

(පූර්වප්‍රවෘත්ති) ආකාරය; ඇර, ඉවතලා; වෙස්, වෙෂයද; වළනවැනි, පහකරන්නාක්වැන්න; (ස්වාමීහුගේ දැකිතරතෙජයින් සූර්‍ය්‍යතෙජස් නිස්ප්‍රභාවටයනකල ලජ්ජායෙන් නමා (සූර්‍ය්‍යා) චන්ද්‍රවිලාසය ගත් තේය. චන්ද්‍රයාද ස්වාමිහුගේ ස්ථිරභාවයෙන් නමාගේ සෞම්‍යභාවය හෝ නිර්මලත්වය යටපත්වීමට යනවිට යායුතු අතක් නොදක්නෙන් භයින් ස්වාමීහුගේම සෞම්‍යගුණයට ඇතුල්වීය යනු භාවයි)

හිමිසඳ, (මේ) ස්වාමීන්ද්‍රයාගේ; සොහොයුරු, භ්‍රාතෘවූ; ගුණසයුරු, ගුණාකරවූ; මනත්‍රීශ්වරයාගේ, මන්ත්‍රීන්ද්‍රයන්ගේ; ප්‍රකාශ ප්‍රතාප, කීර්ත්ති තෙජස්දෙදෙනාසඞ්ඛ්‍යාතවූ (වර්ණනාවෙක්ඇත එද) ශ්‍රවණය කර, ඇසුව මැන.

64. නිහි, නිත්‍යයෙන්; බැහිපෙමින්, භක්තිප්‍රෙමාන්විතව; ලදී, ලෙන්ගතුව; හෙවත් උරෙදැනායකොට; තුනුරුවන්පුදන, තෙරුවන්පුදන්නාවූද; මසුරුවන්සිතු, මාත්සර්‍ය්‍ය චිත්තය; සතුරුමෙන්ම, ශත්‍රුත්පරිද්දෙන්ම; ලුහුබැදී, දුරුකොටහැරියාවූද; යදි, යාච්ඤා කළාවූ; යදි, යාචකයන්ට; සිතුරුවන්සෙයින්, චින්තාමාණික්‍යයක් පරිද්දෙන්; වත, වස්තූන්; දෙවන, ප්‍රදානකරවන්නාවූද; මැහි රුවන්, මන්ත්‍රීරත්නයක්වූද; හෙවත් මන්ත්‍රීනායකවූද; මේ දෙව්හිමි, මේ දෙවස්වාමීහු; දෙව්තුරෙව්, දෙවද්‍රුමයක්සේ; හෙවත් කල්ප වෘක්ෂයක්මෙන්; සැදී, සජ්ජිතවී.

65. ලෝසත්, ලොකසත්ත්වයාගේ; සතන්, සන්තාන නැමැති; කොඳ, කුමුදයන්; වෙත, (නමා) කෙරෙහි; නදකරවමින්, ආනන්දකරවමින්; (සිත්නැමැති කුමුදයන් ප්‍රබොධකරමින් යන අර්ථයි) යාපත්, ශ්‍රෙෂ්ඨවූ

---

* "පත"-පාඨාන්තරයි.

66 සිව් වතවන් සව් සත ඇතිකරවන්ට
හව් වත වෙන්* හව් රුපු දිරි සිඳුවන්ට
ලෙව් සිතුමින් සිව් සඟරාවත දෙන්ට
දෙව් හිමි දන් දෙව් තුර පුර සරසන්ට

67 සිතුමින් සෙසින් සිරිදුන් එහිමින් වඳිනේ
කියමින් ගමන් සමුගන් මින්මන් සොඳිනේ
නුබමින් යෙමින් අවරන් ගිරවත් සඳිනේ
නුබ මින් ගොසින් ගෙවුයන් වදිමින් ලගිනේ

---

හෝ සුලබ්බවූ; සොඳුරු, ශොභාවත්වූ; සෙත්, සෙනානැමැති; තුරුපිරිවරින්, තාරකාපරිවාරයෙන්; යුත, යුක්තව; බෝසත්විලස, බොධිසත්ත්වවිලාසය; (බොධිසත්ත්ව චරිතය) උසුලන, උද්වහනයකරන්නාවූ; ලෝ, සමස්තලොකයාගේ; මුදුන්පත, මස්තකප්‍රාප්තවූ; මේ හිමි, මේ ස්වාමි තෙම; පැපත්, ප්‍රභාප්‍රාප්තවූ; සඳෙව්, චන්ද්‍රයාසෙයින්; පිරි සිරින්, පරිපූර්ණශ්‍රීයෙන්; යුත, යුක්තයි.

66. සව්සත, සමස්තශාස්ත්‍රය; ඇතිකරවන්ට, උත්පාදනයකරවීමට; සිව්වතවන්, චතුර්මුඛයාවැනිවූ; හෙවත් මහාබ්‍රහ්මයාබඳුවූ; හව් රුපු, සමස්තශත්‍රුන්ගේ; දිරි, ධෛර්‍ය්‍ය; සිඳුවන්ට, ඡෙදනයකිරීමට; හෙවත් මර්දනයකිරීමට; හව්, ස්වභාවයෙන්; වෙන්වන, විෂ්ණුදිව්‍ය රාජයා වැනිවූ; ලෙව්, ලොකයාට; සිව්සඟරාවන, චතුඃසඞ්ග්‍රහවස්තුව; දෙන්ට, දීමට; සිතුමින්, චින්තාමාණික්‍යයක් බඳුවූ; පුර, නගරය සරසන්ට, අලඞ්කාරකිරීමට; දෙව්තුර, දෙවවෘක්ෂයක් බඳුවූ; දෙව් හිමි, (මේ) මන්ත්‍රීශ්වරයානන්; දන්, ජනනය කරන්.

67. සිතුමින්සෙසින්, චින්තාමාණික්‍යාකාරයෙන්; සිරිදුන්,සම්පත් ප්‍රදානය කළාවූ; එහිමින්, ඒස්වාමීහු; වඳිනේ, අභිවාදනයකොට; ගමන්මන්, යාත්‍රාධ්‍යාශය; හෙවත් පිටත්වනඅදහස; කියමින්, සැල කෙරෙමින්; සොඳිනේ, යාපත්සේ; සමුගන්මින්, ප්‍රතිඥග්‍රහණය කෙරෙමින්; (අවසරගනිමින්) නුබ, යුෂ්මත්තෙම; නුබමින්, සූර්‍ය්‍යයා; යෙමින්, ගමනයකොට; අවරන්ගිර, අපරපර්වතයට; වත්සඳිනේ, ප්‍රවිෂ්ටවූකල්හි; මින් ගොසින්, මේ ස්ථානයෙන් නික්මගොස්; ගෙවු යන්වදිමින්, ගෘහොද්‍යානයටප්‍රවෙශව; ලගිනේ, ලගනෙව්ව; හෙවත් රාත්‍රිනිවාසය පිණිස නවතුව.

---

* "හව්වෙතවන්-සිව්වෙතවන්"-හැමපොත්.

68 උ දේ ගි රි න් රිවි එන තම ක දේ බි දේ
ස දේ බි ගු න් මුවමල් මුවර දේ රු දේ
ලැ දේ වෙමි න් තා සබඳ! අනුබ දේ ස දේ
යෙදේ ග ම න් එපුරෙන් රිවිඋ† දේ ස දේ

69 සි තු පා ද සත නොමද නා ද ව න
නොම් බාද ව න ස මු ද යො ද ගෙ න
ක ළ පූ ද පින් ප ල ද උ ද ව න
ව දු වි ද ගම මු නි ද උ ද ස න

70 නොපහන් වියන නොපැමිණියෙන් සරුක ල
නොම්වන් තවම පියයුරු තිසර උරවි ල
දෙනු වන් මියුර! තලනොම අලලදුන් පි ල
බි ලි දු න් එකල්වන් මොලිගොඩ තොසින් බ ල

68. රිවි, සූර්ය්‍යයා; තමකදේ, තමඃසන්තානගිය; බිදේ, භග්නකොට ලා; උදේගිරින්, උදයපර්වතයෙන්; එන, ආගමනයකරන්නම; බිගුන් මුව, භෘඞ්ගයන්ගේ මුඛයෙහි; මල්මුවරදේ, පුෂ්පමකරන්දය; රුදේ සදේ, රඤ්ජමානවනයල්හි; (මේ පාදවයෙන්අරුණොදගමනයෙහි භෘඞ්ගයන්ගේ සඤ්චරණය ශොභාකරබැව් නිදීශවයි) ලැදේවෙමින්, ලැදිව; අනුබදේසදේ (වෙමින්,) අනුබද්ධීභාවාන්විතව; සබඳ!, මිත්‍රය!; තා, යුෂ්මත්හට; රිවිඋදේසදේ, සූර්ය්‍යොදයකාලයෙහි; එපුරෙන්, ඊනගරයෙන්; ගමන්, ප්‍රයාණයතෙම; යෙදේ, යුක්තවෙයි.

69. නොම්බාදවන, (පුණ්‍යකර්මයට) හානිකරනොවන්නාවූ; නද වන, ආනන්දජනකවූ; සමුද, ජනසමූහයා; යොදගෙන, යුක්තකොට ගෙන; නොමද, අමන්දවූ; සත, සත්ත්වයන්; සිතුපාද, චිත්තප්‍රසාදය කොට; කළ, කරනලද; පූද, උපහාරඇත්තාවූ; උදවන, උදාර වන්නාවූ; පින්පල, පුණ්‍යඵලයක්; ද, ප්‍රදානයකරන්නාවූ; විදගම, විදගම්නම් ග්‍රාමයෙහි; මුනිද, සර්වඥධාතූන්; හෙවත් ධාතුචෛත්‍යය; උදසන, ප්‍රාතඃකාලයෙහි; වදු, නමස්කාරකරව.

70. සරුකල, ශරත්කාලය; නොපැමිණියෙන්, අසම්ප්‍රාප්තහෙයින්; නොපහන්, ප්‍රසන්නනුවූ; වියන, අනෙටමෙන්; උරවිල, (පුරුෂ යකුගේ) වක්ෂස්ථලයට; තවම්නොම්වන්, මෛත්‍රාක්ෂවිෂ්ටනුවූ; (මෙසින් අනඞ්ගරසයට අසම්ප්‍රාප්තභාව දැක්වූයෙනයි) පියයුරු තිසර, පයොධරනැමැත්තන්ස්පර්ශයන්; දෙනුවන්, (ඔබට) දීමටමෙන්; මියුර!, මයුරය!; ඉපිල, ඉල්පී; නොම්අලල, ආකුලතානොවනසේ; තලදුන්, හස්තතාලයන්දෙන්නාවූ; (අපොළොශබ්දකළාවූ) (ඔබඑන්නා දැක අප්‍රීතියව පෙර ස්නිග්ධවන්නවත් පහස තුඩුන් පියයුරන්ගේ අත රට ඔබගෙන තුලුරුකරගැනීමට උත්සාහිව අත්පොළා ශබ්ද දුන් නාවූ යනු භාවයි) බිලිදුන්, බාලලදුන්; එකල්, තත්කාලයෙහි; වන්, (ඔබ) ප්‍රවිෂ්ටවූ; මොලිගොඩ, මොලිගොඩනම් ග්‍රාමයෙහිදී; තොසින් බල, සන්තොෂයෙන් නිරීක්ෂණය කර.

† "උදේවෙමින්තොසබැද"-සමහර.

71 සුනිල්වන් පැහැපත්–කබපිල්පතර විදමිනි
සු බ අඹ පිරි කල කලපුව මුදුනති ති
නු බ නුබ ගැබ නැගෙමින් ගමනොත් සදි ති
නොකලේ සඳවේලේ–උදුලදුල මේ අසලෙනි *
ර න මි ණි සමග සිදුපිලදල† නැගිය න
සපැ මි ණි සවිදු ‡ මේවෙලකැයි නොමඇදි න
මෙ ව න් සැකය කෙරෙමින් වනදෙවියන් ට
ප ව න් මගින් යාකෙරෙමින් සෙමින් සි ට
ප ව න් සිහිල් විදවිද බසිමින් ගොඩ ට
නි ව න් මං ගිමන් සැනපී යටත් ය ට

71. සුනිල්වන්, අතිනිලවර්ණයෙන්; පැහැපත්, ප්‍රභාස්වරවූ; නෙවත් දීප්තිමත්වූ; පතර, මහත්වූ; කබපිල්, මයුරපිච්ඡයන්; විදමිනි, විදහමින්; නෙවත් දිගහැරගෙන– සුබඅඹ, ශොභාවත්ජලයෙන්; පිරි, පරිපූර්ණවූ; කල, කල්‍යාණවූ; කලපුවමුදුනතිනි, කුඩාකලාණ්‍යමත් නෙත්; නුබගැබනැගෙමින්, නභොගර්භාවරූඪව; නුබ, ශුෂ්මත්හු; ගමනොත්සදිනි, ගමන්ගත්කාලයෙහි– දුල, (කෘෂ්ණවර්ණයෙන්) ජ්වලිතවූ; මේ අසලෙනි, මෙඝපටලයකට ආසන්නයෙහි හෝ මේඝපටලයක්හා සැශිව්වෙමින්; උදුල, උජ්ජ්වලිතවූ; නොකලේසඳවෙලේ, අකාලික්සන්ධ්‍යාවිලාසකයකැයිද–සිඳු, සමුද්‍රයෙන්, රනමිණි සමග, රත්නමාණික්‍යයන්හා සමගව; ඉපිල, පලාපිනව; නැගී, (ආකාශයට) උද්ගතව; ඝන, ගම්ගත්තාවූ; දල, ජල (ප්‍රහාර) යකැයිද; සවිදු, විද්‍යුල්ලතාසමගින්; සපැමිණි, සම්ප්‍රාප්තවූ හෝ ජ්වලිතවූ; මේ වෙලකැයි, මෙසමුද්‍රයකැයිද; නොමඇදින, (විශෙෂ විභාග) සඥානනයනොකිරීමෙන්–වනදෙවියන්ට, (ඒඒතැන) ආරණ්‍යදෙවතාවුන්ට; මෙවන්සැකය, මේ උක්තප්‍රකාරශඞ්කාවක්; කෙරෙමින්, නිපදවමින්; සෙමින්සිට, අතුරිනව; නෙවත් නැවති නැවති; පවන්මගින්, අනිලපථයෙන්; (ආකාශයෙන්) යාකෙරෙමින්, යාත්‍රා කරමින්; සිහිල්පවන්, ශීතලානිලය; විද විද, විදීනයකරෙමින්; ගොඩට බසිමින්, ස්ථලවගිණීව; යටත්ව, රුප්පෂ්ථයෙහි; හෙවත් වෘක්ෂයන්ගේ අධඃස්ථානප්‍රදේශයෙහි; සැනපි, සන්තර්පණයකොට; මංගිමන්, මාගිශ්‍රාන්තය; නිවන්, නිවාරණය කරන්.

* "උදුලේද මේ අසලෙනි"–සමහර.

† "සිඳුපිලලද"–පොත්. ‡ "සපැමිණිමෙතන"–බොහෝ.

72 ක ලා නෙතින් රසඳන දුලදර වනි ත
නො ලා නුව න් පිය බලමින් මත්මනි ත
ව ලා වෙමි න් ලොබනොමදෙන තුරු සදි න
වෙ ලා පුරට කලුනොපිනෙතරව වඩි න

73 ම න කල් තෙ පු ල් මනවුල්කර ලිය කෙළ න
බි ඟු ලො ල් වි ම ල් පුල්තුරුගෙවුයන්තෙවු න
ඇ ම කල් වි ස ල් සල්පිල් වෙළඳුන් රඳ න
සැ දි හැ ල් බේරුහල් ගම සැතපි වඩි න

74 ඉ න් කො ට වණන ගෙවුයන්සිරිනොදත හැ කි
ම න් තු ට වඩන යදි සිරිදෙන දෙව් තුරෙ කි
පි න් කො ට නොයෙක්පොළවටසතපැමිණිසකි*
ඔබෙන් තො ම දෙගොඩදෙනුවරදෙව්ලෝදෙකෙකි

72. වනිත, වනිතාවන්හා; අදර, ඔෂ්ඨයෙන්; දුල, ජ්වලිතවූ; කලා, කාන්තාවන්විසින්; රසඳන, රසාඤ්ජනධාරීවූ; නොහොත් රසඳන, රසාඤ්ජනවර්ණවූ; නොහොත් නීලවර්ණවූ; නෙතින්, නේත්‍රයෙන්; නුවන්පියනොලා, නයනපක්ෂ්මස්පන්දනයනොකොට; මත්මනින, කාමෝන්මාදයෙන් බලමින්, (දර්ශනීය රූපසෞන්දර්‍ය්‍යයුක්තවූ පුරුෂයන්හු) නිරීක්ෂණයකෙරෙමින්; දෙන, (ඔවුන් විසින්) ප්‍රදානයකරනු ලබන්නාවූ; තුරුසඳින, තූර්‍ය්‍යනාදයෙන්; ලොබ, (ඔබගේ) ලෝභය; වලානොමවෙමින්, පහනොකරමින්ම; (තූර්‍ය්‍යනාදය අසමින් සතුටුනොවී යනඅර්ථයි) කලුනොපින් එතරව, කලුනොවටනම්වූ නදීතීර්ථයෙන් ප්‍රතාරිතව; වෙලාපුරට, වේලාපුරනම් යුද්ධාඞ්ගනයට; (වේලාපුරකලුතරට) වඩින, ප්‍රයාණය කරන්.

73. මනකල්තෙපුල්, මනඃකල්පිතවූවචනයෙන්; නොහොත් රාගනිඃශ්‍රිත ගීතිකාධ්වනියෙන්; මන, (ශ්‍රවණයකරන ජනයන්ගේ) චිත්තය; අවුල්කර, ආකුලත්වයටපමුණුවා; කෙළන, ක්‍රීඩනයකරන්නාවූ; ලිය, ලලනාවන්ගෙන්ද; ලොල්, (පුෂ්පමකරන්දයෙහි) ලොල්වූ; බිඟු, භෘඞ්ගාවලියෙන් හා; විමල්, පුෂ්පමාලාවගෙන්; තෙවුන, විරාජිතවූ; පුල්තුරු, පුෂ්පිතවෘක්ෂයන්ඇති; ගෙවුයන්, ගෘහෝද්‍යානයන්ගෙන්ද; ඇමකල්, සැමකල්හි; වෙළඳුන්රඳන, වණිග්ජනයාරඳන්නාවූ; විසල්, මහත්වූ; සල්පිල්, ආපණශාලාවන්ගෙන්ද; හැල්, ශාලික්ෂේත්‍රයන්ගෙන්ද; සැදි, සජ්ජිතවූ; බේරුහල්ගම, බේරුහලනම්ග්‍රාමයෙන්; නොහොත් බේරුවලනම් ගමෙන්; සැතපි, සන්තර්පිතව; නොහොත් විඩා දුරුකොටගෙන; වඩින, ප්‍රයාණය කර.

74. සකි!, මිත්‍රය!; වණන, වර්ණනාකරන්නොහොත්; ඉන්කොට, සීමාවක්කොට; නොදතහැකි, දර්ශනයකළනොහෙන්නාවූ; (වර්ණනාවිෂ

* "පින්කොට නොගොස් මේලොවට ඔබපැමිණිසකි"-පොත්.

75 ප ර තෙ ර පැමිණි අවිසිප් සමුදුරේ දූ ර
වර ත ර සරම ඇමලෙස දූනගත් පව ර
වැ ර ස ර සරම සෙබළුන් රඳනා නිතො ර
**ප ර ත ර කයේ** කය සතපා යන් මිතු ර!

76 දෙනෙතට වතට වළහට පිය පියවුර ට
සරිකොට සිතට උවමක් නොසිතෙන ලොව ට
තොප දුට වෙනට එන අඟනන් සතුටුකො ට
**වැලිතොට** ගමට වැද රඟකොට යන් එපි ට

---

යාතික්‍රාන්තවූ යනු භාවයි) ගෙව්‍යන් සිරි, ගෘහෝද්‍යානසම්පත්ඇත්තාවූද; යදි, යාචකයන්ගේ; මන්තුටවඩන, මනඃසන්තුෂ්ටිවර්ධනය කරන; සිරිදෙන, සම්පත්ප්‍රදානයකරන; දෙව්තුරෙකි, කල්පවෘක්ෂයක් බඳුවූද; බෙන්තොටදෙගොඩ, භීමතීර්ථනගරයෙහි ගඞ්ගා උභය තීරාසන්නවූ; දෙනුවර, නගරවය; නොයෙක්පින්කොට, නානාවිධ කුශලයන්කර; හෙවත් පින්කිරීමෙන්; සත, සත්වයන්පිණිස; පොළොවට, (මේ) පෘථිවියට; පැමිණි, සම්ප්‍රාප්තවූ; දෙව්ලෝදෙකකි, දෙවනගරවයෙකි.

75. දූර, දුෂ්ප්‍රාප්‍යවූ; අවිසිප්, ආයුධශිල්පාභිධානවූ; සමුදුරේ, සමුද්‍රයාගේ; පරතෙර, පාරිමතීරයට; පැමිණි, ප්‍රාප්තවූ; වරතර, අභිශයින් උත්තමවූ; සරම, (ඛඞ්ගශිල්ප) පරිචයතාව; ඇමලෙස, සර්වප්‍රකාරයෙන්; දූනගත්, ජානනයකළාවූ; පවර, ශ්‍රේෂ්ඨවූ; වැරසර, වීරසාරවූ; සරමසෙබළුන්, පරිචිතශිල්පදක්වන ජෙකභටයන්; නිතොර, නොරනොව; රඳනා, රජමානවන්නාවූ; පරතරකයේ, පරනරකානම් නදීප්‍රදේශයෙහි; මිතුර !, මිත්‍රය !; කය, (ඔබගේ) ශරීරය; සතපා, සන්තර්පණයටපමුණුවා; යන්, යාත්‍රාකරන්.

76. දෙනෙතට, නෙත්‍රවයටද; වතට, වක්ත්‍රයටද; වළහට, ඉඟටියටද; පිය, (ගජකුම්භසාදෘශ්‍යයෙන්) ප්‍රියවූ; පියවුරට, පයොධරයන්ටද; සරිකොට, සදෘශකොටලා; උවමක්, උපමාවක්; ලොව්ට, ලොකයාගේ; සිතටනොසිතෙන, කල්පනාවට නොවැටහීමකරන්නාවූද; (සදෘශකරණයට උපමාවක් නොලබන්නාවූ යන අර්ථයි) තොපදුට, යුෂ්මත්හු දර්ශනයකළකල්හි; වෙනට එන, (ඔබගේ) සමීපයටආගමනය කරන්නාවූද; අඟනන්, අඞ්ගනාවන්; සතුටුකොට, (මධුරාලාපිතනාදදානයෙන්) සන්තුෂ්ටවූවන්කර; වැලිතොටගමට, වාලුකාතීර්ථනම්ග්‍රාමයට; හෙවත් වැලිතර නම්ගමට; වැද, ප්‍රවිෂ්ටවැ; රඟකොට, නෘත්‍යදක්වා; එපිට, ඉන්ඔබ්බෙහි; යන්, ප්‍රයාණය කර.

77 දෙව් ලිය වෙ න් නොදැනෙනුවෙන්* සැකවත ර
සිය නෙතු වෙ න් ලිය දුටු වෙන් නුදුටුපෙ ර
සු සි නි දු වෙ න් දිගු දනු වෙන් කෙකාක ර
**නොටගමු වෙ න්** වැලිතුඩු වෙන් වඩු මොනර!

78 බා ල් ලේ පුරුදු කවිනළු සිය ල් ලේ
ඊ ල් ලේ වදන් දෙන ලදුනුදු ල් ලේ
නැ ල් ලේ කොතනකත් ලොව මුලු ල් ලේ
**ගා ල් ලේ** සිරිද දකු නොව පැකි ල් ලේ

79 ව න් සඳ සකි† රිවිබිඹු සමුදු රේ දු රේ
ර න් කිරුළග බඳ ඉඳුමිණි ව රේ යු රේ
කැ න් ලඹදුන් මල් සල්‡ කිණිහි රේ තු රේ
ම න් පිණිමින් ලගු **ලනුමෝද රේ** කෙ රේ

77. සැකවතර, නිඃශඞ්කිතව; දෙව්ලිය, දිව්‍යස්ත්‍රීන්ගේ; වෙන්, (රූපසෞන්දර්‍ය්‍යාදි දර්ශනීයවිලාසයෙන්) පෘථක්භාවයෙක්; නොදැනෙනුවෙන්, ජානනයනොවන්නෙත්; (දිව්‍යස්ත්‍රීන්හාසදෘශවූ හෙයින් යනු භාවයි) පෙරනුදුටු, දර්ශනයනොකළවිරූ; ලිය, ස්ත්‍රීන්; සිය නෙතුවෙන්, ස්වචක්ෂුසින්; දුටුවෙන්, දර්ශනයෙන්; හෙවත් දර්ශනය කළවිට; සුසිනිඳුවෙන්, ශ්‍රුතිමධුරව; දිගුදනුවෙන්, දීර්ඝධ්වනියෙන්; කෙකාකර, කෙකාරවපවත්වා; මොනර!, මයූරය!; වැලිතුඩුවෙන්, වාලුකාතලයෙන්; (පිටත්ව) නොටගමුවෙන්, තීර්ථග්‍රාමයෙන්; වඩු, ප්‍රයාණයකර.

78. බාල්ලේ, බාලාවැල්ලෙහි; සියල්ලේකවිනළු, සකලකාව්‍ය නාටකයන්හි; පුරුදු, පරිචිතවූ; ඊල්ලේ, ඕවිලියෙහි; හෙවත් උන් සිල්ලාවෙහි; (සිට) වදන්දෙන, තෙපුල්දෙන්නාවූ; ලදුන්, කාන්තා වන්ගෙන්; උදුල්ලේ, උජ්ජ්වලිතවූද; ලොවමුලුල්ලේ, සම්පූර්ණලොක යෙහි; කොතනකත්, කිසිතැනෙකත්; නැල්ලේ, (දර්ශනීය සකල නගරාඞ්ගශ්‍රීසාරයට උපමාවක්) දෘශ්‍යමානනුවූ; හෙවත් ලොව සියලුනගරයන්ටවඩා ශ්‍රෙෂ්ඨවූ; ගාල්ලේ, ගාලුනම්නගරයෙහි; සිරිද, ශ්‍රීවිලාසයද; පැකිල්ලේනොව, චඤ්චල හෝ ප්‍රස්ඛලිතනොවී; දකු, දර්ශනයකර.

79. සකි!, මිත්‍රය!; රිවිබිඹු, සූර්‍ය්‍යබිම්බය; දුරේ, දුරවූ; සමුදුරේ, සමුද්‍රයට; වන්සඳ, ප්‍රවිෂ්ටවූකල්හි; (මෙයින් සන්ධ්‍යාකාලයනිර්දිෂ්ටයි)

* "නොදෙනෙනුවෙන්"-සැලකියයුතුපාඨයක්.
† "සිඹි"-බොහෝ. ‡ "පුල්-දුල්"-සි ද පෙනේ.

80 න දැ ව සයුරැ ලෙල රළ සළු සල න් නේ
සොඳ ව සුපිපි තුරු සේසත් සෙව න් නේ
ර දැ ව ලබන සැප එකතින් ලබ න් නේ
ර දැ ව මියුර!* සයුරස මිරිපෑ න් නේ

81 ගු ව න් මිණිහු කර නොපැවිය දු න් බිම ට
නු ව න් පිණන පුල් වැටකේ පහ න් වැ ට
ගෙ ව න් සුනිල් සැපවන පැමිණිය න් හ ට†
ගෙ ව න් සෙමින් සිට මාවත යට න් ය ට

---

ලනුමෝදරේ කෙරේ, ලනුමෝදර නම් නදී මුඛාසන්නයෙහිවූ; මල් කැන්ලඹඳුන්, පුෂ්පමඤ්ජරීන් ලම්බමානවන්නාවූ; කිණිහිරිසල්තුරේ, කර්ණිකාරවෘක්ෂයන්ගේ අභ්‍යන්තරයෙහි; රන්කිරුළු අග, සෞවර්ණ කිරීටයන්ගේ මස්තකයෙහි; බඳ, බඳනාලද්දවූ; ඉඳුමිණිවරේ, ඉන්ද්‍ර නීලමාණික්‍යරත්නයන්ගේ; අයුරේ, ආකාරයෙන්; මන්පිණමින්, මනඃප්‍රීණනයකෙරෙමින්; ලගු, ලග්නවෙව.

80. නදව, සන්තුෂ්ටව; සයුරු, සමුද්‍රයවිසින්; ලෙලරළ, චඤ්චල තරඞ්ග නැමැති; සළු, සාටකයන්; සලන්නේ, ආස්ඵාරණයකරනු ලබන්නාවූ; සොඳව, සුන්දරව; සුපිපි, සුප්පුල්ලවූ; සේසත්සෙවන්නේ, ශ්වේතච්ඡත්‍රාකාරවන්නාවූ; තුරු, වෘක්ෂයන්ඇති; රදව, රඤ්ජමානව; ලබනසැප, ලභ්‍යවූසම්පත්තීන්; එකතින්ලබන්නේ, අවශ්‍යයෙන් ලැබියහැකිවූ; (මාර්ගිකයන්ට සුඛසම්පත් ලැබියහැක්කාවූ යනු භාවයි) සයුරස, සමුද්‍රාසන්නයෙහිවූ; මිරිපෑන්නේ, මිහිරිපෑන්න නම් ග්‍රාමයෙහි; මියුර !, මයූරය !; රදව, ලග්නවෙව.

81. ගුවන්මිණිහුකර, සූර්යසන්තාපය; බිමට, භූමියට; නොපැවිය දුන්, වැද්දනුදුන්නාවූ; නුවන්පිණන, නෙත්‍රප්‍රීණනයකරන්නාවූ; පුල්, පුල්ලවූ; වැටකේ, කෙතකීවෘක්ෂනැමැති; පහන්වැට, ප්‍රදීප වර්තිඇති; (එහෙයින්ම) පැමිණියන්හට, සම්ප්‍රාප්තවූවන්ට; සැප වන, (විශ්‍රාමාපගමනයට හෙතු හෙයින්) සුඛවන්නාවූ; සුනිල්, අති නීලවර්ණවූ; ගෙවන්, ගෘහාකාරවූ; යටත්යට, වෘක්ෂයන්ගේ අධොභාගයෙහි; සිට, ස්ථිතව; මාවත, මහාපථය; සෙමින්, අශීඝ්‍රව; හෙවත් සෙමින් සෙමින්; ගෙවන්, ඉක්මවායන්.

---

* "මිතුර"-සමහර. † "සුනිල්වනසැපවනපැමිණිහට"-වැඩියක්.

82 මානැවියා* පොකුණේ–යොන්කත් සිලිල් සනහා
කෙළනත් දුට ගමන්–කළ මත් ගිමන් සනහා

83 තැ වු ලි නො ලී රිවි අනොතත් විල ලෙසි නී
සි ලි ලි බ ලී සිලස රල රැලි දෙමි නී
ඉ පි ලි ගැ ලී පිණන යෝනත් සෙදි නී
වි දු ලි දු ලී ගන ගනගැබ පෙණෙන වැ නී

84 සයුරු බොමින් කුඹුයොන් දුටුසෙ මිණි ප බා
පොකුණු බොනුව අපටත් සැලසිනම් බ ඹා
මෙදිය කෙළනවුන් ඉන මිණිමෙවුල් සු බා
දුකුම් වෙතී† සලෙලුවො කියත සිතුලො බා

---

82. මානැවියා පොකුණේ, මහනැවියානම්පුෂ්කරිණියෙහි; යොන්කත්, යෞවනවනිතාවන්; සිලිල්සනහා, ජලස්නානයෙන්; කෙළනත්, ක්‍රීඩනයකරන්නියන්; දුට, දර්ශනයකළහොත්; (එකල්හි) ගමන්කළ, (මහාමාර්ගියෙහි) ගමනය කළාවූ; (යුෂ්මත්හු) මත්ගිමන්, මාර්ගපීඩාව; සනහා, සන්තර්පණයකර.

83. අනොනත්විලලෙසිනි, අනවතප්තනඩාගයපරිද්දෙන්; රිවි තැවුලිනොලී, හිරුරැස්නොවැද්දනුන්නාවූ; බලී, ඉතාඅධිකවූ; සීලස, සීතලස්පර්ශඇති; රල, තරඟයෙන්යුක්තවූ; සිලිලී, ජලයෙහි; රැලි දෙමිනි, ජටාදනයකෙරෙමින්; ගැලී, නිමග්නවැ; ඉපිලී, පලාවිතවැ; සෙදිනි, ශීඝ්‍රව; පිණන, ප්‍රතාරණයකරන්නාවූ; යෝනත්, යෞවනස්ත්‍රීන්ගේ (ආකාරයකෙවැනිවේද?) ගන, සාන්ද්‍රවූ; ගනගැබ, මේඝගර්භයෙහි; දුලි, ජ්වලිතව; පෙණෙන, දෘශ්‍යමානවන්නාවූ; විදුලි වැනී, විද්‍යුල්ලතාකාරයි.

84. කුඹුයොන්, කුම්භයොනිසාමීන්; (අගතිසිහු) සයුරුබොමින්, සමුද්‍රජලපානයකෙරෙමින්; මිණිපබා, (එහිවූ) මාණික්‍යයන්ගේ කාන්තිය; දුටුසේ, දර්ශනයකළාක්මෙන්; පොකුණු, (මෙම) පුෂ්කරිණිජලය; බොනුව, පානයකිරීමට; බඹා, බ්‍රහ්මයා; අපටත්සැලසිනම්, අසවතුන්ටද සැලැස්වීනම්; මෙදියකෙළනවුන්,මේ ජලක්‍රීඩනයකරන්නියන්ගේ; ඉන, කටියෙහි; (අවරුඳ්ධජිතවූ) සුබාමිණිමෙවුල්, ශොභනමණිමෙඛලාවන්ගේ; දූකුම්, දර්ශනයතෙම; වෙහි, වන්නේයයි; සලෙලුවෝ, කාමුකජනයෝ; සිතුලොබා, චිත්තාශායෙන්; කියත, කථනය කෙරෙති.

---

* මෙකල "මානෙහියා". † "දූකුම්එනත"-වැනියක්.

85 ව න නෙ ත කමලුපුලසරිවී කිවි වද න
බොරුයයි කියති මෙළුවම් නොදැක එකතැ න
දිය කෙළනවුන් දැක පොකුණේ පුල් මලි න
කිවිබස සැබවනුව නුබටම පෙණේ එත න

86 නි ද නා ද න න් හට නි ද නා මෙන් පිහිට
ස ද නා රු ව න් නවරඳනා වළ දිග ට
සො බ නා වී දි යෙ න් ව ඩ නා පුරවර ට
ව ඩ නා යෙ හෙ න්* මනනද නා වැලිගම ට

87 අ ය ත් න යෙ න් ලද ලඳ ලිය තො දකිම් නී
අ ය ත් නු ව න් ඔත් බැලුමත් යොත් ලම් නී
ප ය ත් එ සි න් තට† කීකරු නොවන වැ නී
ප ය ත් න යෙ න් මුත් යා නොහැක එපුරේ නී

85. වනනෙත, වක්ත්‍රනෙත්‍රදෙදෙනට; කමලුපුල, පද්මනීලොත්පලදෙදෙන; සරි, සදෘශවෙත්යි; වී, ප්‍රකාශිතවූ; කිවිවදන, කවීන්ගේවචනය; බොරුයයි, සත්‍යනොවේයයි; මෙළුවම්, මේ උපමාවය; එකතැන, එකස්ථානයෙක්හි; නොදැක, දර්ශනයනොකොට; කියති, (ජනයෝ) කථනයකෙරෙති; පුල්මලින, ප්‍රඵුල්ලපුෂ්පයෙන්යුක්තවූ; පොකුණේ, මනනැවියා පුෂ්කරිණියෙහි; දියකෙළනවුන්, ජලක්‍රීඩනය කරන්නියන්; දැක, දර්ශනයකොට; හෙවත් දර්ශනයකිරීමෙන්; කිවිබස, කවීන්ගේ යථොක්තප්‍රකාශය; සැබවනුව, සත්‍යවනුපිණිස; එතන, ඒ ස්ථානයෙහිදී; නුබටම, යුෂ්මත්හටම; පෙණේ, (ආවශ්‍යකහෙතු) දෘශ්‍යමානවෙයි.

86. නිදනාදනන්හට, නිර්ධනවූ ජනයන්ට; නිදනාමෙන්, නිධානාකාරයෙන්; පිහිටසදනා, ප්‍රතිෂ්ඨාසලසන්නාවූ; දිගට, දිශාන්තයන්හි; නවරුවන්වළ, නවවිධරත්නාවාටයෙන්; රඳනා, රජමානවූ; පුරවරට, පුරප්‍රවරයට; වඩනා, ප්‍රයාණයකරන්නාවූ; සොබනා, දර්ශනීයවූ; වීදියෙන්, වීථිපථයෙන් (ගොසින්;) මනනදනා, මනොරම්‍යවූ; වැලිගමට, වාලුකාග්‍රාමයට; යෙහෙන්, සවස්ථව; (පුවචනනියායෙන්) වඩන, ප්‍රයාණයකරන්.

87. අයත්නයෙන්, නිරුත්සාහයෙන්; ලද, (ඒස්ථානයෙහිදීදර්ශීන) ප්‍රාප්තවූ; තො, යුෂ්මත්හු; දකිම්නි, දර්ශනය කෙරෙම්ව්; ලඳලිය, යෞවනවනිතාවෝ; අයත්, ආයතවූ; හෙවත් දික්වශියාවූ; නුවන්,

* "වඩනාමැනවි"-ඇතැම්. † "පයත්නොපට ඉන්"-බොහෝ.

88 අ ති න් කොමල කැලුමලු නද සුර න් ද මා*
ව ති න් සසිරි කොඳ නෙතිනිදුවර න් ද මා†
ග ති න් නොසරිවනුයෙන් සුරසර න් ද මා
ඉ ති න් මෙලොව උවමට කියනු කි න් ද මා

89 ඔ ද ම න් යොවුන් මද මතහන පැලඹුම ට
ස ල ම න් සලඹ සත් කොලහල සනෙන වි ට
සොබම න් තමන් දහ සරියසි තොප කර ට
අ ව ම න් කරන වැනි ඉන් යාගත් නොසි ට

නෙත්‍රයෙන්; ඔන්, කරනලද්දාවූ; බැලුමන්, නිරීක්‍ෂණාත්මකවූ; නොහොත් නිරීක්‍ෂණමාත්‍රනැමැති; යොත්, රජ්ජුන්; ලම්නී, ප්‍රක්‍ෂෙප කෙරෙමින්, එසින්; එම කාරණයෙන්; පයන්, ප්‍රයතවූ; හෙවත් ඝත්‍රිදශීනයෙහි ලොලත්‍වවිරහිතහෙයින් පරිශුඬවූ; නොහොත් පයන්, (යාත්‍රාකිරීමෙහි) ප්‍රොත්සාහීවූ; තට, යුෂ්මත්හට; කීකරු නොවනවැනි, කීකරුනොවන්නන් වැනිවෙති; (තොපඅකැමැති කරවාගෙන බැලුම් රැහැණින් බැඳගැනීමට යත්නකරන්නන් මෙනැයි සේයි) (මෙසේ ඇතිකල්හි) පයත්නයෙන් මුත්, ප්‍රයත්න කිරීමෙන් මිස; හෙවත් ගමන්ගැනීමෙහි උත්සාහී නොවුවහොත්; එපුරෙනි, ඒනගරයෙන්; යානොහැක, යාත්‍රාකළනොහේ.

88. කොමල, මොලකැව්වූ; අහින්, හස්තයන්ට; කැලුම්ලු, කාන්ති ජ්වලිතවූ; නද, (එහෙයින්ම) ප්‍රමොදවූ; සුරන්දමා, මනාකාන්ත කඳම්බයන්ගේ ලීලාවද; වතින්, වක්ත්‍රයන්ට; සසිරි, ශ්‍රීසමුජ්ජ්වලිතවූ; කොඳ, කුන්දයන්ගේ ආකාරයද; නෙතින්, නයනයුග්මයන්ට; ඉදුවරඅන්දමා, ඉන්දීවරයන්ගේ ආකාරයද; ගතින්, අතිරික්තදෙහ විලාසයට; සුරසරඅන්දමා, දෙවඟනන්ගේ ආකාරයද; නොසරි වනුයෙන්, සදෘශනොවන්නෙන්; ඉතින්, ඉතිකින්; මා, අස්මත්හු විසින්; උවමට, (මැලාට) උපමාපිණිස; මෙලොව, මේ සමස්ත ලොක යෙහි; කියනු, වර්ණනාකරන්නේ; කින්ද?, කතරවස්තුවෙක්දෝ?.

89. යොවුන්මදමන්, යෞවනමදවිෂ්ටවූ; ඔදමන්, එඞිසිත්ඇත් තාවූ හෝ කාමයෙන් ඔදවැඩිසිත්ඇත්තාවූ; අඟන, අඞ්ගනාවන්; පැලඹුමට, දීප්තිමත්ආකාරයට; යනෙනවිට, යාම් ඊම් කරනකල්හි; සලමන්, සෙලවුම්ගත්තාවූ; සලඹ, පාදාඞ්ගදයන්ගේ; සත්කොලහල,

* "කොමල බැව්නුදුනදසරන්දමා-කොමල බැව්කලුනදසරන්දමා"-පොත්.
‡ "නෙනින් බලන සිරිකොඳඉඳුවරන්දමා"-හැම.

90 මිලි දියැ තුන් සිවි නා*රජ කුලේ දුලේ
සරි දිගැ තුන් උසුලන මිතෙලේ බලේ
ගිලි මද තුන් ලොබිනෙත මිලොලේ අලේ
බල මදූ තුන් මාතොම ඇත්හලේ නිලේ

91 තුල් වලා දිවන සෙද දිසි දියාකර
ලොල් වලා පණන මින් විදු සියාකර
නිල් වලා සිදුපියට බිම ගියාපුර
නිල් වලා ගගින් යාකර පියාසර

නාදකොලාහාලය; සොබමන්, ශොභමානවූ; නමන්දඟ, නමන් ඇසුරුකරන ජඞ්ඝාව; තොපකරට, යුෂ්මත්හුගේ (මයූර) ග්‍රීවාවට; සරියයි,සදෘශයයි; අවමන්කරනවැනි, හෙලාදක්නාක්වැන්න; (ඔවුන්ගේ ජඞ්ඝාවන් ඔබගේ මයූරග්‍රීවාවට සදෘශවීම ඔබටම නින්දාකරයයි සේයි) (එහෙයින්) නොසිට, නොරඳ; ඉන්යාගන්, ඒ ස්ථානයෙන් යාත්‍රාග්‍රහණය කරන්.

90. මිලි, රාශිභූතවූ; සිව්, සජීනවූ; නාරජකුලේ, ශ්‍රෙෂ්ඨහස්ති කුලයෙහිවූ; දුලේ, ජ්වලිතවූ; දියැතුන්, (ශත්‍රුබලභඞ්ගයකොට විජයශ්‍රීදේවීන් ප්‍රමොදප්‍රාප්තකරනහෙයින්) විජයහස්තිසඞ්ඛ්‍යාවට ගණ්නුලබන්නාවූද; (එසේ හෙයින්ම) බලේ, අතිමහත්වූ; මිතෙලේ, මහීතලය; හෙවත් පෘථිවිමණ්ඩලය; උසුලන, උද්වහනයකරන්නාවූ; දිගැතුන්, දිග්දන්තීන්ට; සරි, සදෘශවූද; ගිලි, ගලායන්නාවූ; තුන්මද, ත්‍රිමදයෙන්; ලොබින්, ලොභයෙන්; එන, ආගමනයකරන්නාවූ; මිලොලේ, මධුලිහයන්; හෙවත් භෘඞ්ගයන්; අලේ, අනකලාවූද; නිලේ, නීලවර්ණවූද; මදූතුන්, මත්තහස්තින්; මාතොට, මහාතිත්ථපුර ප්‍රවරයෙහිවූ; ඇත්හලේ, හස්තිශාලාවෙහි; බල, නිරීක්ෂණයකර.

91. දිසි, දෘශ්‍යමානවූ; දියාකර, සමුද්‍රයකරා; තුල්වලා, අතිමහත්ව; සෙදදිවනා, ශීඝ්‍රවධාවනයකරන්නාවූ; හෙවත් වේගයෙන් බැසයන්නාවූ; ලොල් වලා, ලොලයකොටලා; විදුසියාකර, විද්‍යුල්ලතා හා එක්වැනිකොට; (විදුලිවැනිව) පණනමින්, පණනම්සුත් ඇත්තාවූ; වලානිල්, වලාහකාකාරයෙන් නීලවර්ණවූ; සිදු, සමුද්‍රනැමැති; පියට, වලාහකයා ඇසුරුකිරීමට; බිම, භූමියෙහි; ගියාපුර, ගියාක් වැනිවූ; (සමුද්‍රස්වාමියා හා සමාගමසම්භොගසුඛාස්වාදයපිණිස භූමියෙහි වැතිර ගත්තාක් වැනිවූයි සේයි) නිල්වලාගගින්, නීලවලාහක නම් නදියෙන්; පියාසරකර, පක්ෂ ප්‍රසාරණයකොට; යා, ප්‍රයාණයකරන්.

* "වටිකා" කියි.

92 අ වු ලේ වත් පෙණෙන–වනහිස සවස්වේ ලේ
අ වු ලේ සිතු නොලා–යන්න **උග්ගල්බැවු** ලේ

93 නු බ සි ය නි හි රෑ ලැගුමට එතන එ ති
ඉ න් කු ල ප ති සෙබඩක වෙත ලෙසේ රු ති
සැකනොපැව ති* ගනසා තුරු මැදුරු† ඇ ති
තු ගු ව න ප ති තුරගෙක ලගුතු යාප ති

94 දවස පු රා දිව මහලෙව් උදය ව රා
අවර ඹ රා පත වරතර ගතිනි ද රා
සරත දු රා කර සනහනුව සමුදු රා
සහස කරා කර ඇදි වැත්ත තම ක රා

---

92. සවස්වේලේ, සායාහ්නකාලයෙහි; වනහිස, වනශීර්ෂය; අවුලේ වත්, ආකුලවූවාක්මෙන්; පෙණෙන, දෘශ්‍යවත්ම; සිතු, චිත්තයෙහි; අවුලේ, ආකුලත්වයක්; නොලා, ප්‍රක්ෂේපනොමකොට; හෙවත් නූපදවාම; උග්ගල්බැවුලේ, උග්ගල්බැවුල ‡ නම් ස්ථානයෙන්; යන්න, ප්‍රයාණයකරත්.

93. නුබසිය, යුෂ්මත්හුගේ ඥාතීන්; නිති, නිරන්තරයෙන්; හෙවත් සැමදම; රෑලැගුමට, රාත්‍රිවාසයපිණිස; එතන, ඒ ස්ථානයට; එති, පැමිණෙන්නාහ; ඉන්, උන්අතුරෙන්; කුලපති, වංශවත්වූ හෝ කුලජ්‍යෙෂ්ඨවූ; සෙබඩක, මයුරධෙනුවක්හුගේ; වෙත, ආසන්නයෙහිවූ; සැකනොපැවති, ශඞ්කාස්පදනූවූ; ගනසාතුරු, සාන්ද්‍ර ශාඛාන්තරනැමැති, මැඳුරු ඇති, (ප්‍රියකරු) මන්දිරඇත්තාවූ; තුඟු, ප්‍රාංශුවූ; වනපතිතුරගෙක, වනස්පතිවෘක්ෂයක්හුගේමස්තකයෙහි; රුතිලෙසේ, යථාභිලාෂයෙන්; ලගුතු, ලග්නවනහොත්; යාපති, සුප්‍රාප්තවෙති.

94. උදයවරා, ප්‍රාතඃකාලයෙහිපටන්; දවසපුරා, දහවල්මුලුද; මහලෙව්, මහාලෝකයෙහි හෙවත් මේ චක්‍රවාටයෙහි; දිව, ධාවනයකොට; අවරඹරා, අපරාම්බරයට; පත, සම්ප්‍රාප්තකල්හි; වරතර ගතිනි, උත්තමතමදෙහයෙන්; දරා, ධාරිතවූ; සරත, ශ්‍රාන්තය; දුරාකර, දූරීභූතකොටලා; සමුදුරා, සමුද්‍රයෙහි; සනහනුව, ජලස්නානය කරනු පිණිස; සහසකරා, සහස්‍රකිරණයා; (සූර්යයා) තමකරා, ස්වීයරශ්මිය; කර, හස්තයෙන්; ඇදිවැත්ත, (අපරාම්බරයෙහි) ආලිපනකලාක්මැනි. (මෙයින් රාත්‍රියගේ සම්ප්‍රාප්තියට ආසන්නවූනිමිති සන්දර්ශිතයි)

---

* "නොවැඇති"-සීපයක. † "තුරුසිදුරු-තුරුවදුරු"මෙත් සම්භාව්‍ය පාඨයි.
‡ මෙකල්හි පික්වැල්ලයයි ඇතැම් අයගේ මතයි.

95 පියයුරු අඳුරු තුරු සළුපටිනි වසමි - නි
නිසකත එසඳ එත සියපත් අකුලමි - නි
පරදර වරද වරමින් වරගුණ සිති - නි
සියකුල සිරිත රිවි මුලුලොවට පැවෙ - නි

96 ස ඳ නැගෙන බලනෙව් තුරු කොලතුරෙ - නි
එ ද නිසඹ තොම * තමහට සැකවෙමි - නි
සැ ද සිහින් බොරුතතු හිමිට පාමි - නි
සැ ඳ වෙලෙ සහලගුරු මැඩ නිවූ වෙ - නි

97 කුඹුයොන් සයුරු බොන එහි මිණිසේ අන - ත
නුබකැටතෙලෙහි දිසිනත් † තුරුපහන් ව - ත
සැඳෑසඳුට සදමින් මග නිසා ක - ත
ඉසි සුනිමල් මලිගියමල් වෙනි දිමු - ත

---

95. එසඳ, නතකාලයෙහි; හෙවත් නොපැළඟ්ගල්බැවුලෙන්ඔබ්බෙහි ගමන්ගත්කල්හි; නිසකත, නිශාඞ්ගනාව; අඳුරු, අන්ධකාරනැමැති; උතුරුසළුපටිනි, උත්තරීයශාටකයෙන්; පියයුරු, පයෝධරයන්; වසමිනි, ඡාදනයකෙරෙමින්; සියපත්, ශතපත්‍රයන්; අකුලමිනි, ආකුඤ්චනයකෙරෙමින්; එත, සම්ප්‍රාප්තවනකල්හි; රිවි, සූර්‍ය්‍යයා; වර, උත්තමවූ; ගුණසිතිනි, ගුණචින්තනයෙන්යුක්තව; පරදරවරද, පරදාර සේවනයෙහි දෝෂය; නොහොත් වරද, සාවද්‍යවූ; පරදර, පරදාරසේවනය; වරමින්, පහකෙරෙමින්; සියකුලසිරිත, තමාවංශාගතචරිත්‍රය; මුලුලොවට, සමස්තසත්වයාහට; පැවෙනි, ප්‍රකාශකළාක්වැනිවෙයි. (ශතපත්‍රහැකිලීම සහ කුමුද ප්‍රබොධයද වෙයි යනු භාවයි).

96. සඳ, චන්ද්‍රයා; තුරුකොලතුරෙනි, වෘක්ෂපත්‍රාන්තරයෙන්; බලනෙව්, (නිශාඞ්ගනාවගේනෙත්) පරීක්ෂණයටමෙන්; නැගෙන, උද්ගතවනකල්හි; සැඳෑවෙලේ, සන්ධ්‍යාවලාහකයෝ; (කෙසේද?) එදා, නතකාලයෙහි; නිසඹ, නිශාම්බිකාව; තොම, තමාම; තමහට, තමන්කෙරෙහි; සැකවෙමිනි, ශඞ්කිතවෙමින්; සැදසිහින්, හැදහිලිවිත්තයෙන්; බොරුතතු, අසත්‍යප්‍රවෘත්තියක්; හිමිට, ස්වාමිහට; පාමිනී, පෙන්වමින්; හෙවත් ප්‍රකාශකෙරෙමින්; මැඩනිවූ, පෙළානිවනලද; සහලගුරුවෙනි, ජ්වලිතාඞ්ගාරසදෘශයි.

97. කුඹුයොන්, අගතිසිහු; සයුරුබොන, මුහුදුදිය පානයකරන්නම; එහි, ඒසමුද්‍රයෙහි; අනතමිණිසේ, අනන්තමාණික්‍යයන් පරිද්දෙන්; නුබකැටතෙලෙහි, නභොලක්ෂණදර්ශනතලයෙහි; දිසි, දෘශ්‍යමානවූ;

---

* මේ චමසිය යුත්තකි. † "දිසිමෙන්"-වැඩියක්.

98 අ මා ර සි න් රිසියෙන හිමිසඳුන් සොඳ
බ මා ඔ දි න් පත්වර නුබයහන් වැ ද*
ද මා සෙ දි න් වනසෝගන අඳුරු කඳ
ස මා ග මි න් වූ නිසකත් පහන් අ ද

99 ග සා කරින් සක්වා වෙන්කළ පවි න
නි සා පියඹ † සහ තුරු පිරිවර ගියෙ න
ස සා වෙසින් දුමරුස වෙමිනි එමදි න
ස සා දරහු බල පල ලද උදුස න

නත්තුරු, නානාතාරකාවෝ; (කෙවැනිද?) නිසාකත, නිශාකාන්තාව; පහන්වන, ප්‍රසන්නවක්ත්‍රයෙන් යුක්තව; සැඳෑ, සන්ධ්‍යා කාලයෙහි; සඳුට, චන්ද්‍රයාගේ ඊමට; මිගසඳමින්, මාගීත්සරසමින්; ඉසි, විප්‍රරූවා හැරියාවූ; සුනිමල්, අතිපරිශුද්ධවූ; දිමුත, දීප්තිමත්වූ; මලිගිය මල්වෙනි, සුමනපුෂ්පයන්මෙනි.

98. අමාරසින්, අමෘතරශ්මියෙන්; හෙවත් ශුභ්‍රකාන්තියෙන්; රිසියෙන, ඊප්සාවඞීනයකරන්නාවූ; සොඳ, සුන්දරවූ; හිමි, ස්වාමිලක්ෂණවූ; සඳුන්, චන්ද්‍රයා; නුබ, නභොලක්ෂණවූ; යහන්, ශය්‍යාවට; වැද, ප්‍රවිෂ්ටවැ; බමා, භ්‍රමණයවන; ඔදින්, ඕජසින්යුක්තව; (දසදිගුන්හි පැතිරෙනරශ්මිමාලා දරමින් යනු භාවයි) පත්වර, දෘශ්‍යමානකල්හි; නිසකත්, නිශාම්බිකාතොමෝ; වනසෝ, විරහශොකලක්ෂණවූ; ගනඅඳුරුකඳ, ඝනාන්ධකාරපුඤ්ජය; සෙදින්, ශීඝ්‍රව හෝ ඝනබවව; දමා, ප්‍රක්ෂෙපකොටලා; සමාගමින්, (චන්ද්‍රයා හා) සමහම්සුවවිඳීමෙන්; පහන් අද, ප්‍රසන්නාසිත්ඇත්තී; වූ, වූවා.

99. කරින්, රශ්මි (නැමැතිහස්ත) යෙන්; ගසා, ප්‍රහාරදානයකොට; සක්වා, චක්‍රවාකමිථුනය; (සක්වාඅඹුසැමිදෙදෙනා) වෙන්කළපව්න, (මෛථුනසංයොගයෙන්) වියොගකළපාපයහෙතුකොටගෙන; නිසා, රාත්‍රිනැමැති; පියඹ, ප්‍රියාම්බිකාව; තුරුපිරිවරසහ, තාරකාපරිවාරය හා සමගින්; ගියෙන, (වියෝව) ගියහෙයින්; සසාවෙසින්, ශශවෙෂයෙන්; දුමරුසවෙමිනි, ධූම්‍රවර්ණයුක්තවෙමින්; එමදින, තද්දින යෙහිම; පලලද, (උන්වෙන් කිරීමෙහි) විපාකසඞ්ඛ්‍යාතඵලයලද්දාවූ; (සක්වා යුවලය සමහම්සුවෙන් වෙන් කිරීමෙහි විපාකවශයෙන් තමාගේ නිශාම්බිකාව පහවගිය හෙයින් ශොකයෙන් ධූම්‍රවර්ණවූ යනු භාවයි) සසාදරනු, ශශධරයා; හෙවත් චන්ද්‍රයා; උදුසන, ප්‍රාතඃ කාලයෙන්ම; බල, නිරීක්ෂණයකර.

* "මැද"-කිසි. † "සියඹ"-ඇතැම්.

100 මුලුරු නොහිඳ උදයෙන් බසිමින් ගසි   න
පියවන සඳෙහි සළු අඳවන රතිමති   න
නොපණත් පණත් කළ සැවුලන් නරඹමි   න
විල්කත් සිනාගත් වැනි සියපත් වති   න

101 න ර ව  පැහැර පිය පිය * පිය වෙමින් හ   ද
බ ර ව  රඳන පිණි පියමින් පිලිත් සො   ද
න ර ව  නොකර කරනගමින් කෙකා න   ද
ක ර ව  මියුර ! රිවිදෙව්හට රුගුම් පු   ද

102 යො දෑ  තෙ දෑ  කර කෙරෙමින් දසනුදෙ   ස
සො දෑ  උ  දෑ† රිවි දිලියෙන ගුවන්කු   ස
වි  දෑ  න  දෑ  පිය පියමන් නොවීල   ස
එ  දෑ  උ  දෑ  සන යාගත් ගසින් බැ   ස

---

100. මුලුරු, රාත්‍රිමුලුල්ලෙහි; නොහිඳ, නොනැවතී; උදයෙන්, උදෑසනක්සේම; ගසින්, (රාත්‍රිවාසයපිණිසහුන්) වෘක්ෂයෙන්; බසිමින්, අවතීර්ණවීමෙන්; (බැසීමහේතුකොටගෙන) පියවනසඳෙහි, (සත්පුරුෂයන් සමහම්බුවෙත්) ප්‍රියවන වේලෙහි; රතිමතින, රතික්‍රීඩාසම්භවමත්තතායෙන්; සළුඅඳවන, ශාටකාච්ඡාදනයකරවන්නාවූ; (මෙයින් අරුණු නැඟීමට පෙරාතුවම හැඬීම හා බැසීමද ඥාපිතයි) නොපණත්, අසම්මතවූ හෝ සාවද්‍යවූ; පණත්, පණතක්; කළ, කළාවූ; සැවුලන්, සාවල්පක්ෂීන්; හෙවත් කුක්කුටයන්; නරඹමින, නිරීක්ෂණය කෙරෙමින්; විල්කත්, තඩාගාම්බිකාපඞ්කජිය; සියපත් වතින, ශතපත්‍රනැමැති වක්ත්‍රයෙන්; සිනාගත්වැනි, ස්මිතග්‍රහණය කළපිහගිමි.

101. පියහදවෙමින්, ප්‍රියවිනතාභාවිතවෙමින්; පිය, දශීනියවූ; පිය, පක්ෂපත්‍රයන්; නරවපැහැර, නරශ්ගසා; බරවරඳන, බරඇතිව වැකුණාවූ; පිණි, තුෂාරයන්; සොඳ, දශීනියවූ; පිලිත්, (ඔබගේ) පිල්වැටිය කෙරෙන්; පියමින්, පහකෙරෙමින්; කර, ග්‍රීවාව; නගමින්, උන්නතකොටගනිමින්; කෙකානද, කෙකාරාවය; නරවනොකර, ස්ථිරවනොකොට; (මෘදුවශයෙන් රාවනගා යනු අදහසි.) මියුර!, මයූරය!; රිවිදෙව්හට, සූර්‍ය්‍යදිව්‍යරාජයාහට; රුගුම්පුද, නෘත්‍යෝපහාරය; කරව, දක්වන්නෙහි.

102. තෙදෑයොදෑ, තෙජෝයුක්තකොට; දසනුදෙස, දිගුන්අනුදිගුන්හි; කරකෙරෙමින්, රැස්පතුරුවමින්; රිවි, සහස්‍රරශ්මිනු; සොඳ, මනාසේ;

---

* "පියයත්"-වැඩියක්.  † "සඳ උදෑ"-වැඩියක්.

103 රුදි සුලබා පලුපල මල් කැල පල ඹා
සැදි සසොබා නදුනුයනැයි සැකව සු බා
වන් සුරඹා වන් යන එන කලුන් සු බා
නුබනරඹා යන් මගදෙපස වනගැ බා

104 සාමුවා අඟන සමගව කෙළි ලොලි න
සාමුවා කරු ලපලු කවමින් කමි න*
සාමුවා වෙමින් විටෙකෙලි පිණිපැ න
සාමුවා බල එකල වන හිස කෙළ න

---

උදා, උද්ගතව; ගුවන්කුස, නභඃකුක්ෂියෙහි; දිලියෙන, භ්‍රාජමානවන කල්හි; නදා, ආනන්දකරවූ; පිය, පියයන්; පියමන්, ප්‍රියවිත්තානවිතව; විදා, විදහාගෙන; (ප්‍රසාරණයකොට) අලසනොවී, (ශීතාදිඋපද්‍රවය නිත්) ආලස්‍යයුක්තනොව; එදාඋදාසන, එදවස් උදය කාලයෙහි; ගසින්, (රාත්‍රිනිවාසයපිණිසඔබවැඩහුන්) වෘක්ෂයෙන්; බැස, අවතීර්ණ වැ; යානත්, යාත්‍රාග්‍රහණය කරත්.

103. සුලබා, සුබලභ්‍යව; රුදි, රඤ්ජිතවූ; පලඹා, එල්බෙන්නාවූ; පලු, පල්ලවය; පල, ඵලය; මල්කැල, පුෂ්පකලාප යන මෙතෙකින්; සැදි, සුසජ්ජිතව; සසොබා, ශොභාගත්තාවූද; සුබා, ශොභනවූ; නදුනුයනැයි, නන්දනොද්‍යානයයි; සැකව, ශඞ්කිතව; හෙවත් කල්පනා ඇතිව; වන්, වැද්දගත්තාවූ; සුරඹාවන්, දිව්‍යාප්සරාවන්වැනිව; යන එන, යාම් ඊම් කරන්නාවූ; කලුන්, කාන්තාවන්ගෙන්; සුබා, ශොභනවූද; මගදෙපස, මාර්ගොභයපාර්ශ්වයෙහි; වනගැබා, වනගර්භය; නුවා, යුෂ්මත්හු; නරඹා, නිරීක්ෂණයකොටගෙන; යන්, යාත්‍රාකරන්.

104. සාමුවා අඟනසමගව, ශාඛා මෘගාඞ්ගනාවන් හා සමගින්; කෙළිලොලින, ක්‍රීඩාලෞල්‍යයෙන්; සාමුවාකරු, (උන්) සම්මුඛකොට ගෙන; හෙවත් ලඟට ඇදගෙන; ලපලු, බාලපල්ලවයන්; කවමින්, භක්ෂණයකරවමින්; කමින, (තමන්ද) භක්ෂණයකෙරෙමින්; විටෙක, වාරයෙක්හි; සාමුවාවෙමින්, වදලව; හෙවත් මූවහවෙමින්; එලි, අභිමුඛස්ථානයට; පිණිපැන, පිණුම්පැනලා; වනහිස, වනමස්තක යෙහි; එකල කෙළන, ඒකාලයෙහි ක්‍රීඩනයකරන්නාවූ; සාමුවා, ශාඛාමෘගයන්; හෙවත් වානරයන්; බල, නිරීක්ෂණය කර.

---

* "කවින"-යි ද පෙණේ.

105 මදූතුන් මදතුන් පහරින් සර නා
සියගුන් ගනගන සැකයෙන් සැලෙ නා
තුටුඉන් රැව් කරනත් නොව පම නා
නොකරන් රඟදනු නියවත! නියෙ නා

106 තුරු හිමියෝ ලිය ලිය වලඳිමි නි
සාමුවදරු වඩමින් සා අති නි
බිඟු සන් සුරතල් බස් මල් මුවෙ නී
කියමින් නලවන වැනි ලෙලවමි නි

107 ගඟුලැලිලා සලිලසලා* පුලිනත ලා
සෙවනදුලා හමනනලා† රෙණැදස ලා
රත්පියලා රතිපියලා පියලිනි ලා
එවනබලා සිරි‡ නොවලා මෙනොපබ ලා

105. තුන්මදපහරින්, ත්‍රිමදප්‍රහාරයෙන්; හෙවත් තුන්තැනෙකින්ගිලිහිවැකෙණමදජලයෙන්යුක්තවූ; සරණා, (නගරයෙහි ඒ ඒ තැන) සංචරණයකරන්නාවූ; මදූතුන්, මත්තහස්තීහු; සියගුම්, ඝොෂාන්විතව; සැලෙනා, චඤ්චලවන්නාවූ; ගන, සාන්ද්‍රවූ; ගන, මෙඝයෝයයි; සැකයෙන්, ශඞ්කිතවීමෙන්; ඉන්, ඒස්ථානයෙහිදී; නොවපමණා, ඉතාවැඩියක්ව; තුටුරැව්, තුෂ්ටිරවය; කරනත්, කරන්නෙහිනමුත්; රඟනොකරන්, නෘත්‍යය නොදක්වව; නියවත!, නුවනැතිය!; නියෙනා, ඥානයෙන්; දනු, (මේකරුණ) ජානනය කර.

106. තුරු, වෘක්ෂාභිධානවූ; හිමියෝ, වල්ලභයෝ; ලිය, (මාලතී මාධවී ආදි) ලතාභිධානවූ; ළිය, (ප්‍රියතර) කාන්තාවන්; වලඳමිනි, සිපගනිමින්; සාඅතිනි, ශාඛාභිධානහස්තයෙන්; සාමුවදරු, ශාඛාමෘගාභිධානදූරකයන්; නොහොත් සාමුවදරු, වඳුරුපැටියන්; වඩමින්, ඇකයෙන්දරමින්; මල්, පුෂ්පාභිධානවූ; මුවෙනි, මුඛයෙන්; බිඟුසන්, භෘඞ්ගරාවනැමැති; සුරතල්බස්, බොළඳ තෙපුලන්; කියමින්, කථනයකෙරෙමින්; ලෙලවමිනි, ලලිතකෙරෙමින්; නලවනවැනි, ලාලනයකරන්නාක්වැනිහි හෙවත් අස්වැසිලිකරන්නාක් වැනි (වෙති).

107. ගඟුලැලිලා, ගඞ්ගානිර්ඣරයන්ගේ; සලිලඅසලා, ජලාසන්නයෙහිවූ; පුලිනතලා, වාලුකාතලයෙහි; (පතිනවූ) සෙවනදුලා, ඡායායෙන් උජ්ජ්වලිතවූද; රෙන්සලා, රේණුවජ්ටාවන්; ඇද, ආකර්ෂණය

* "සලිලතලා"-කිසි. † "සෙවනඑලා එනතලලා"-බොහෝ.
‡ "රිසි"-මෙත් පාඨයි.

108 එ න වේ ලා   දූ න වේ ලා   බුදින ලො   ලා
කා දු ලු දු ලා   පි ණි මත ලා   සුසුම තු   ලා*
ලි ය වෙව් ලා   එ ව් ස ස ලා   ලපලු ද   ලා
ලො දු එව ලා   න ව මි ලා   තුරු දුදු   ලා

109 ගු ව න් රු ව න්   කැලුමන් ගැමෙන් ඔප   ට
නු ව න් උ ව න්   තුනුදිලි දිවමන් ලෙස   ට
ස ව න් වි ම න්   මත්රිසි ලෙද වඳුව තු   ට†
නි ව න් එ සි න්   තොප සිතති සිතේ ම   ට

---

කොට; හමන, වහනයවන්නාවූ; නලා, මාරුතඇත්තාවූද; රත් පියලා, අශෝකය; රතිපියලා, මදනය; පියලි, රජාදන ගනමෙතෙක් වෘක්ෂයෙන්; නිලා, නීලායමානවූද; බලා, අතිවිශාලවූද; එවන, තදවන යෙහි; සිරි, ශ්‍රීසෞභාග්‍යය; නොවලා, නොවලහා; මෙතොප, මේ යුෂ්මත්හු; බල, නිරීක්ෂණය කර.

108. බුදිනවේලා, වැළඳීමටකාලය; දූන, ජානනයකොට; ලොලා, (ආහාර) ලෞල්‍යයෙන්; එනවේලා, (යුෂ්මත්හු) ආගමනය කරනවෙලෙහි; පිණිම, තුෂාරම; දලා, ජ්වලිතවූ; කඳුලු, (සන්තොෂ) වාෂ්පකොට ඇති; නලා, මාරුතයම; තුලා, මහත්වූ; සුසුම, සූක්ෂ්ම කොටඇති; ලියඑව්, කාන්තාවන්සේ; සසලා, චඤ්චලවූ; දලා, ගහනවූ; ලපලු, බාලපල්ලවයන්; වෙවුලා, වෙවුලුම්ගන්වා; ලොදුඑවලා, ලොලතායුක්තව හෝ ශොභාවත්ව; නවමි, අභිනවමල්පැණිය; ලා, (ඔබඑන්නහුගේ අභිමුඛයෙහි) ප්‍රක්ෂෙපකොට; තුරු, වෘක්ෂයෝ; දුදුලා, ජ්වලිතවූවෝ (වෙති).

109. ගුවන්රුවන්කැලුමන්, නභොමණීහුගේ කාන්තිස්කන්ධය; ඔපට, මට්ටම් ආකාරයෙන්; ගැමෙන්, ආලිම්පනයකලාක්මෙන්; නුවන්, නෙත්‍රය; උවන්, වක්ත්‍රය; තුනු, ශරීරඃනමෙතෙක්දෙනින්; දිවමන්ලෙසට, ජීවමානවිලාසයෙන්; දිලි, දීප්තිමත්වූ; සවන්, සර්වඥයන් වැඩසිටින; විමන්, විමානය; හෙවත් බුද්ධප්‍රතිමාලය; මත් රිසිලෙද, චිත්තරුචිවූපරිද්දෙන්; තුට, සන්තුෂ්ටියෙන් යෙදී; වඳුව, නමස්කාරකර; එසින්, ඒ හෙතුවෙන්; තොප, යුෂ්මත්හු; නිවන් සිතති, නිර්වාණය (ලැබීමට) සිතායසි; මට, අයමත්හට; සිතේ, චින්තනය වෙසි.

---

* "කඳුලුදුලා පිණිවතලා වේ සුසුලා"-හැම.
† "මත්සිරිසඳ මත සතුට"-කිසි.

110 එ ද මුනිඳු පුදකළ නිසලනෙත් යො ද
ර ඳ ගියෙව් රතුනිල්සුදුකැලුම් ක ඳ
වි ද දිගත පලදල කඳු පතර ස ද
සොඳ* උදුල දුමරඳු වඳු නිවන් ස ඳ

111 ස ත පා සයුරු නද පිණි පා කැන් අසු ර
ස ර පා සෙයින් මල් සර පා කරන දු ර
ර න පා කෙසරතෙල් මුනි පා දහම් ද ර
ය ති පා තඹරවර පිණි පා කර මොන ර!

112 පැ ප ත් සුදම් සබ සිරිසර † පහළ කො ට
යා ප ත් විලස පැමෙන් දිසි ‡ නරලොව ට
මා ව ත් පතනුවන් වන්විට වන පිහි ට
මා ව ත් මඩුව දූක යාගත් පුරවර ට

---

110. එද, තත්කාලයෙහි; හෙවත් අනිමිෂලොචනාවිනසප්තාහයෙහි; නිසලනෙත්, නිශ්චලනෙත්‍රයන්; යොද, පිහිටුවා; (අනිමිෂලොචනාමයෙන් යනඅර්ථයි) පුදකළ, අර්චනයකළාවූ; මුනිඳු, මුනිරාජයන්වහන්සේ; රඳගියෙව්, (ජයශ්‍රීමහාබොධිද්‍රුමෙන්ද්‍රයන්කෙරෙහි) රඳවානැබ්බාක්වැනිවූ; රතුනිල්සුදුකැලුම් කඳ, ලොහිතනීලාවදාතකාන්තිස්කන්ධයෙන්; දිගත, සැමදිගුන්; විද, විනිවිජ්ඣනයකොට; පල, ඵලය; දල, පල්ලවය; පතරකඳු, විස්තෘතස්කන්ධ යන මේතක්දෙයින්; සඳ, නිරන්තරයෙන්; සොඳ උදුල, මනාසේ උජ්ජ්වලිතවූ; දුමරඳු, බොධිද්‍රුමෙන්ද්‍රයන්වහන්සේ; නිවන්සඳ, නිවන්ලබන අදහසින්; වඳු, අභිවාදනය කරන්.

111. සතපාසයුරු, සුයශ්ඃවංශනැමැතිසමුද්‍රයට; නද, ආනන්දදායකවූ; පිණිපාකැන් අසුර, චන්ද්‍රරශ්මිසදෘශවූද; සරපාසෙයින්, නලකූබරයා පරිද්දෙන්; මල්සර, පුෂ්පවාණයා; හෙවත් අනඞ්ගයා; දුර, දූරයට; පාකරන, පහකරන්නාවූද; (මෙයින් රූපවිලාසයාගේ උත්කෘෂ්ටත්වය නිර්දිෂ්ටයි) මුනිපා, මුනීන්ද්‍රනැමැති; කෙසරතෙල්, සිංහතෙලයට; රනපා, රුවන්පයක්බඳුවූද; දහම්දරයති, ධර්මධාරයතීශ්වරයන්ගේ; නොහොත් මුනිපා, සර්වඥරාජයාගේ; දහම්, ධර්මලක්ෂණවූ; කෙසරතෙල්, සිංහතෙලයාගේ; දර, ධාරණයට; රනපා, සුවර්ණභාජනයක් බඳුවූ; යති, යතීශ්වරයාගේ; වර, උත්තමවූ; පාතඹර, පාදපද්මය; මොනර!, මයූරය!; පිණිපාකර, ප්‍රණිපාතකරන්.

112. පැපත්, කාන්තිමත්වූ; සුදම්සබ, සුධර්මානම් (දෙව) සභාවෙහි; සිරිසර, ශ්‍රීසාරය; පහළකොට, ප්‍රකාශකර; යාපත්විලස, මනොහර

---

* "සඳ-උද"-ඇතැම්. † "සුදම් සබයේ-සුදම් සබසේ"-වැඩියක්.
‡ "පාහාමෙන්"-කිසි.

113 දෙ ව් රද ලක රකිනුවකළ * නියෝ වි නේ
දෙ ව් රජහිමි දෙව්නුවරට වඩින දි නේ
දෙ ව් පුරයෙන් පහ බැයොත් තුබූ මෙ නේ
ස ව් මිණි කොත් කැන් දිලි ගුවන ගටමි නේ

114 වි සි තු රු පුරඹ වටොරට පැරද විළියෙ න
නි ර තු රු යනෙනලසගමනය නරඹමි න
පි වි තු රු සුතන් ඇර යනු බැරිව තැන තැ න
ර ඹ තු රු නැමි සිටිනෙව් මුහකඩාව න

---

විලාසයෙන්; හෙවත් දර්ශනයටයොග්‍යපරිද්දෙන්; නරලොවට,මනුෂ්‍ය ලොකයට; පැමෙන්, ප්‍රකාශකළාක්මෙන්; දිසි, දෘශ්‍යමානවූ; මාවත් පනනුවන්, මහාපථාවතීර්ණවූවන්; වන්විට, ප්‍රවිෂ්ටවූකල්හි; පිහිටවන, ප්‍රතිෂ්ඨාවත්නාවූ; මාවත්මඩුව, මහාවෘත්තිමණ්ඩපය; (මහාවෘත්ති මණ්ඩපනම්වූමහාශාලාව) දක, නිරීක්ෂණයකොට; පුරවරට, පුර ප්‍රවරයට; යාගත්, යාත්‍රාග්‍රහණය කරත්.

113. දෙව්රද, ශක්‍රයා විසින්; කළ, (අපබුදුන් පිරිනිවන්පාවදාළ දවස්හි) කළාවූ; නියෝවිනේ, (නොපටලක්දිව භාරය එය රකුව යන) නියොගයෙන්; හෙවත් නියමය පිළිගෙන; ලකරකිනුව, ශ්‍රී ලඞ්කාරක්ෂණය පිණිස; දෙව්රජහිමි, ශ්‍රීවිෂ්ණුදිව්‍යරාජොත්තමයන්; දෙව්නුවරට, දිව්‍යනගරයට; හෙවත් දෙව්නුවරපුරයට; වඩිනදිනේ; ආගමනයකරන දිනයෙහි; දෙව්පුරයෙන්, (ශ්‍රීවිෂ්ණුදිව්‍යරාජයන්විසූ) දිව්‍යපුරයෙන්; පහ, (තමන්ගේ) ප්‍රාසාදය; බැ, බානලද්දාවූ; යොත් රජ්ජුපිණ්ඩය; තුබූමෙනේ, තබාගියාක්මෙන්; සව් මිණිකොත්, සකල මාණික්‍යශෘඞ්ගයන්ගේ; කැන්, කාන්තිපිණ්ඩයතෙම; ගුවන, ආකාශය; ගටමිනේ, ඝට්ටනයකෙරෙමින්; දිලි, ජ්වලිතවී.

114. පුරඹ, පුරස්ත්‍රීන්ගේ; විසිතුරු, විචිත්‍රවූ; හෙවත් දක්කැවිවූ; වටොරට, වෘත්තාරුවට; පැරද, පරජිතවූ; විළියෙන, ව්‍රීඩායෙන්; නිරතුරු, අවිරතවූ; යනෙන, ගමනාගමනයකරන්නාවූ; අලස ගමනය, (උන්ගේ) ආලස්‍යප්‍රයාණය; හෙවත් ශොභාවත් සඤ්චර ණය; නරඹමින, නිරීක්ෂණයකෙරෙමින්; පිවිතුරුසුතන්, පවිත්‍රවූ පුත්‍රයන්; ඇර, දමාලා; යනුබැරිව, යාගතනොහැකිව; මුහකඩාවන, මුඛාවලම්බනයකොට; හෙවත් මුහඑල්ලාගෙන; රඹතුරු, රම්භා වෘක්ෂයෝ; නැමී, නම්නව; තැන තැන, (ඒ නගරයෙහි) තන්හි තන්හි; සිටිනෙව්, ස්ථිතිය කරන්නවුන් වැන්නෝය.

---

* "ලෙව්රකිනුවලක සකකළ-ලෙව් රකිනුවලකසත මහිනි"-හැම.

115 ල ඳුන් කැකුළුතන පටබැම්මකින් යු තේ
එ වන් දගේ සිට දුටුවන්ද බැඳල තේ
මෙ සි න් මිදී මුත්* පැලඹුම් ලැබුනුහො තේ
සෙ දි න්† මෙමුලුලොව වුව බැඳලතී සි තේ

116 සි සී වතට කිව කිවිදන කියති සි සි
නො සී කරනු දුල්‡ නිලුපුලනෙතගනි සි
ලැ සී ගමන් වන හස ගමන පසුබ සි
ප සී පසින් සැරසීයෙති ලියෝ නි සි

117 පුරඳර පුර අයුරු—පුර සිරි බලා මෙලෙ සි න්
වැඩමකර රජගෙට—වැඩකරු මිතුර! සතො සි න්

---

115. ලඳුන්, කාන්තාවන්ගේ; පටබැම්මකින්යුතේ, පට (වස්ත්‍ර) බන්ධනයකින් යුක්තවූ; කැකුළුතන, කුඩ්මලාකෘතිපයොධරයෝ; එවන්, ඒ (උක්ත) ප්‍රකාරවූ; දගේ සිට, බන්ධනයෙහි සිටගෙන; දුටුවන්ද, දර්ශනයකළවුන්ද; බැඳලතේ, බන්ධනයකරන්නාහ; මෙසින්, මේ බන්ධනයෙන්; මිදී, මුක්තව; මුත්, මේ පයොධරයන්ගේ; පැලඹුම්, ප්‍රලම්භනයෙක්; ලැබුනුහොතේ, ලබ්ධවූයේ නම්; (සිඩවේනම්) සෙදින්, සත්‍යවශයෙන් හෝ යුහුවම; මෙමුලු ලොව වුව, මේ සමස්ත ලෝකය නමුත්; බැඳලතී, බන්ධනය කරන්නාහයි; සිතේ, චින්තනය වේ.

116. වතට, (කාන්තාවන්ගේ) වක්ත්‍රයට; සිසී, ශශධරයා; හෙවත් චන්ද්‍රයා; කිව, (සදෘශයයි) කිවහොත්; සිසී, හාස්‍යජනක හෙතු වෙකැයි; කිවිදනකියති, කවිවරයෝ කියන්නාහ; නිසි, සුන්දරතරවූ; නෙතග, උත්තමනෙත්‍රය; දුල්නිලුපුල, ජ්වලිතවූ නීලොත්පලයන්; නොසීකරනු, අයොග්‍යකරන්නේය; ලැසීගමන්, (කාන්තාවන්ගේ) අතුර්තප්‍රයාණයෙන්; වනහස, වනහංසයන්ගේ; ගමන, (ශොභාන්විත) ගමන්විලාසයතෙම; පසුබසී, ඉවතයන්නේය; (මේ මේ ආකාරයෙන්) නිසි, මනාවූ; ලියෝ, වනිතාවෝ; සැරසී, (සර්වාභරණයෙන්) අලඞ්කෘතව; පසීපසින්, පඞ්ක්තිබැඳි; යෙති, ගමන් කෙරෙත්.

117. පුරඳරපුරඅයුරු, පුරන්දරපුරාකාරවූ; හෙවත් ශක්‍රපුරය වැනිවූ; පුර, පුරයාගේ; (දෙවින්ද්‍රවරයෙහි) සිරි, ශ්‍රීසාරය; මෙලෙසින්, මේ උක්තප්‍රකාරයෙන්; බලා, නිරීක්ෂණය කොට; වැඩකරු, අභිවෘද්ධිකාරකවූ; මිතුර !, මිත්‍රය !; රජගෙට, (දිව්‍ය) රාජභවනයට; සතොසින්, සන්තොෂයෙන්; වැඩමකර, වඩිනුමැන.

---

* "මිදිමුත්"-වැඩියක්. † "සොදින්—තදින්"-බොහෝ.
‡ "ඉන්—දන්"-ඇතැම්.

118 ව රු ය දි න් දුකඳුරු දිව යු රු යු රු
නි රු කුලෙන් නිති සත රැකි සු රු සු රු
ස රු සි රි න් රැක සිරි රජ දෙ රු ඳු රු
පු රු බැ ති න් නමමින් නමක රු ක රු

119 දු ල ව රත්ලියෙව් දුල කෙවිලි රැව් ස මා
ලෙ ල ව කියන ලිය ලිය ගියට කන්න මා
ලො ල ව මෙසෙවු රූ නොමදිටුවිරූ න මා
බ ල ව නළඟනන් රඟමඩල නෙත් යො මා

120 ර න ක ම ලේ පෙති සිරිඇති ඇඟි ලී
ලෙ ල එ ක ලේ කල කරතලිනුදු ලී
ර ඟ ම ඩ ලේ ඉසි පුල්මල් විදු ලී*
පැ හැ න ව ලේ තුරු දිලි තුබ කිය ලී

---

118. දිවයුරු, දිවාකරයා; (තෙජසින්) අඳුරුයුරු, අන්ධකාරය සෙයින්; යදින්, යාචකයන්ගේ; දුක්, දුඃඛය; වරු, පහකොට; නිරු කුළෙන්, නිරවුල්.වනසේ; සත, සත්වයා; නිති, නිරන්තරයෙන්; රැකි, රක්ෂණයකළාවූ; සුරසුරු, දිව්‍යරාජයාට; සරුසිරින්, උත්තම ශොභාවෙන් යුක්තව; රැකසිරි, ආරක්ෂානබනලද්දාවූ; රජදෙරු අඳුරු, දිව්‍යවිමානවාරෙපකටස්ථෙහි (සිට); පුරුබැතින්, අනූනභක්තියෙන් යුක්තව; කරු, (ඔබගේ) හස්තයන්; නමමින්, නම්නකෙරෙමින්; නමකර, නමස්කාර කරන්.

119. දුල, ජ්වලිතවූ; රත්ලියෙව්, ස්වර්ණලතාසෙයින්; දුලව, ජ්වලිතව; කෙවිලි, පරපුටුබෙනුන්ගේ; රැව්සමා, රාවයටසදෘශකොට; ලෙලවා, ලල්නකොට; ලිය, කාන්තාවන් විසින්; කියන, කථනය කරනුලබන්නාවූ; ලියගියට, ලයාන්විතගීතයට; කන්නමා, ශ්‍රවණාවනතකොට; (ගීතස්වරය අසා යන අර්ථයි) තමා, තමන් විසින්; නොමදිටුවිරූ, අදෘෂ්ටපූර්වවූ; මෙසෙවුරූ, මෙසේවූරූපවිලාසයක් ඇති; නළඟනන්, නාටිකාඞ්ගනාවන්; නෙත්යොමා, නෙත්‍රවිදහා; රඟමඩල, නාට්‍යමණ්ඩලයෙහිදී; ලොලව, ලෞල්‍යයුක්තව; බලව, නිරීක්ෂණය කර.

120. රතකම්ලේ පෙති, රක්තොත්පලපත්‍රයන්හුගේ; සිරිඇති, ශොභාන්විතවූ; ඇඟිලි, අඞ්ගුලීන්ගෙන්හා; කරතලින්, හස්තතලයෙන් (අත්ලෙන්); උදුලී, උජ්ජ්වලිතවූ; කල, මනොහරවූ; එකලේ,

---

* "පුල්මල් ඇඳිලී"-බොහෝ.

121 ස සො බා ලෙල පද පද නුව නර ඹා*
නො ත බා රැව් දුන් සන් සල සල ඹා
න ළ ඹා† සුරඟනවන් රඟ නර ඹා
ඔ ල ඹා ලනු බැරි සිතු නොම කල ඹා

122 ර ල ලා උ දු ලා ලෙලුම තු ලා යා
නෙතලා‡ බ ම ලා බැම බම ලා යා
ර ඟ ලා එක ලා බැලුව ස ලා යා
නෙතලා සිත ලා ඇද බැඳ ලා යා

123 ලකළ රුවන් රන් බ න් දී
ලෙලෙන අතම සිතු බ න් දී
ලියකියු ගී සුරුස න් දී
අසන රිසිය එම කා න් දී

---

ඒ කාන්තාවන්ගෙන්ද; ඉසි, වැකුණාවූ; හෙවත් විසුරුවනලද්දාවූ; පුල්මල්, ප්‍රඵුල්ලපුෂ්පයන් ගෙන්ද; ලෙල, ලලිතවූ; රඟමඬලේ, (ඒ) නෘත්‍යමණ්ඩලය; විදුලි පැහැනවලේ, විද්‍යුත්ප්‍රභාව්‍යාප්තවූ; තුරු දිලි, තාරකාවලියෙන්ජ්වලිතවූ; නුබ, ආකාශයහා; කිඋලි, (සාදෘශ්‍යය) ප්‍රකාශිතයි.

121. පදඅනුව, (ගීත) පදයන්ට අනුගතකොට; සසොබා, ශොභා සහිතව; නරඹා, නිරීක්‍ෂණයකොට; ලෙලපද, ලලිතපාද ඇතිව; (එහෙයින්ම) සන්සල, චඤ්චලවූ; සලඹා, නූපුරයන්ගේ; රැව්, රාවය; නොතබා, ශෙෂනොකොට; දුන්, දානයකලාවූ; සුරඟනවන්, අප්සරාවන්වැනිවූ; නළඹා, නාටිකාඞ්ගනාවන්ගේ; රඟ, නෘත්‍යය; නරඹා, නිරීක්‍ෂණයකොට; සිතු, චින්තය; නොමකලඹා, ආලොලනයනොම කොට; ඔලඹාලනු, රඳවාගැන්ම; බැරි, අසක්‍යයි.

122. රලලා, තරඞ්ගයන්ගේ; උදුලා, උජ්ජ්වලිතවූ; ලෙලුම තුලායා, ආන්දෝලනයහාසදෘශව; බැම, භ්‍රැයුග්මය; බමලා, භ්‍රමණය කොට; හෙවත් ඇස්බමුනටවා; නෙතලා, නෙත්බනා; (ඇස්දල්වා) බමලා, භ්‍රමණයව; අසලායා, ආසන්නයෙහි; රඟලා, නැටුම්දක්වා; එකලා, එවකාන්තාවෝ; බැලුව, (ජනයන්දෙස) නිරීක්‍ෂණයකළ හොත්; නෙතලා, (ඔවුන්ගේ) නෙත්‍රයන්ද; සිතලා, චිත්තයද; ඇද, (තමන්කෙරෙහි) ආකර්ෂණයකොට; බැඳලායා, බන්ධනයකරන්නාහ.

123. රන්බන්දී, සවර්ණවලයෙහි ඔබ්බනලද; රුවන්, රත්නජාතයෙන්; ලකළ, ශොභිතාවූ; හෙවත් උද්දීප්තවූ; ලෙලෙන, සැලෙන්නාවූ; අතම, (උන්ගේ) හස්තයම; සිතු, (දර්ශනය කළවුන්ගේ)

---

* "මතබා"-සම්හර. † "නරඹා"-හෑම. ‡ "නොතලා"-කිසි.

124 යුග කොපුලා බිත උදු ලා
මිණි කොඬොලා කර සස ලා
එම නක ලා රඟන ක ලා
ව ත ම බ ලා රිසි * නොව ලා

125 වයන්නන් පෙදෙසිලා තබා ගී බම න් නේ†
අගින් නන් රඟන්නන් සුරන්යයි සිතෙ න් නේ
නුවන් වන් මොවුන් රූ ලෙවන් කුම් කියන් නේ
මලින් දුන් න ගත්තේද ගැත්තේය උ න් නේ

විත්‍තය; බන්දී, දඟකරන්නේය; ලිය, ස්ත්‍රීන් විසින්; සුරූසන්දී, සෙලිනනාදයකොට; නොහොත් අසුරූසන්දී, අසුරූගසා; කියු, කවිතවූ; ගී, ගීතයන්; කන්දී, දෙසවන්යොමා; අසන, ශ්‍රවණයකිරීමෙහි; එම, එකාකාරවම; රිසිය, අභිප්සාවෙයි.

124. කොපුලායුගබිත‡,ප්‍රශස්තකපොලයුගලයෙන්; උදුලා, පැහැපත්වූ; මිණිකොඬොලා, මණිමයකුණ්ඩලාවන්; සසලාකර, චලනයකොට; රඟන, නැටුම්ගත්තාවූ; මනකලා, මනඃකල්‍යවූ; එකලා, ඒ කාන්තාවන්ගේ; වතම, වක්ත්‍රම; බලා, නිරීක්‍ෂණයකොට; හෙවත් බැලීමෙන්; රිසි, (දශීනයකරන්නන්ගේ) රුචිය; නොවලා, පහනොවෙයි. (රිසිවැඩෙයි සේයි)

125. වයන්නන්, වාදනය කරන්නන්ගේ; පෙදෙසිලා, (මඳුලධ්වනි) පදයෙහිලා; හෙවත් මඳුල පදයට අනුගතකොට; නොහොත් වයන, අනෝනාවූ; නන්පෙදෙසිලා, නානා පදයන්ට අනුගතකොට; ගීනබා, ගායනාකර; බමන්නේ, භ්‍රමත්වූ; නන්, නානා ප්‍රකාරවූ; රඟන්නන්, නෘත්‍යකරන්නන්ගේ; අඟින්, දෙහ ශොභාවෙන්; නොහොත් ආකාරයෙන්; සුරන්යයි, දෙවඟනෝයයි;

* "සිරි"-ඇතැම්.       † "ගීතවන්නේ"-කිසි.

‡ සිතනිශබ්දයෙන්"තද්භවව හෙළබස ව්‍යවහෘතවූ බිත්ශබ්දයද ඇතැම් තැන ප්‍රශස්තාර්ථද්‍යොතකයි, දෛවිභාෂායෙහිදු ප්‍රශස්තාර්ථද්‍යොතක සිතනි ශබ්දයෙක් කවිත්ව සිඬාන්තයි, මේ සිංහු ශ්‍රී කාලිදාශයෝද:-

"අථො පරිඝට්ටාද්භ්‍රමරෛර්භ්‍රමද්භිඃ
ප්‍රාක්සූචිතාන්තඃ සලිලප්‍රවෙශඃ,
නිර්ධෞතදන්තාමලගණ්ඩභිත්තිඃ
ර්වන්‍යඃ සරිත්තො ගජ උන්මමජ්ජ"-ශ්‍රී රඝුවංශ. 5-43.

".මතල්ලිකොද්ධ විශ්‍රාඃ ඝජුඃ ප්‍රකාණ්ඩස්ථල භියාත්ඃ"-ගණරත්නමහොදධි.

126 කුහුල්වන් මියුල් දෙන් නෙතෙව් නෙත් බැලූ මිලා
කමල් වන් වතින්ගී මතින් රැව් නැගූ මිලා
ලහෝ පත් නොපත් තුල් අතුල් පෑ ලෙදූ මිලා
නිවායේ දනන් මන් නිවායේ රැඟූ මිලා

127 ම ත් වෙ මි නි ම ත් සරිව * ගී රෙසෙහි වා නේ
අ ත් ත ල ට ග ත් ලෙලෙන විදුලි † අසමා නේ
ර ත් ප බ ල ප ත් අයුරු අත් බියස පා නේ
ස ත් ස තු ටු වෙ ත් නොපටු සිත් වඩති යෝ නේ

---

සිතෙනන්නේ, (බලාසිටියවුන්ට) චින්තනීයවෙයි; මොවුන්, මේනෘත්‍යකරන ස්ත්‍රීන්ගේ; රූ, රූපවිලාසය; නුවන්වන්, ඇසට වැද්දවූන් නාවූ; ලෙවන්, ලොකයා; හෙවත් කවිජනයා; කුමකියන්නේ, (උපමාවශයෙන්) කියනුලබන්නේකුමක්ද?; මලින්දුන්න, පුෂ්පවාණයා; හෙවත් අනඞ්ගයා; ගත්තේද, (උපමාවසයෙන්) ග්‍රහණයකෙළේද?; උන්ගේ, ඒස්ත්‍රීන්ට; ගැත්තේය, දාසභවයෙහි සිටී.

126 කුහුල්වන්, සඤ්ජාතකෞතුහලඇති; මියුල්දෙන්, මෘගබෙනුන්ගේ; නෙත්එව්, නෙත්‍රාභාසදෘශවූ; (අතිශයින්ම භ්‍රමත්වූ යන අර්ථයි) නෙත්, නෙත්‍රයෙන්; බැලූමිලා, බැලීම්හෙලා; කමල්වන්, කමලාකෘතිවූ; වතින්, මුහුනින්යුක්තව; ගීමතින්, ගීතයෙන් පමණක්; රැව්නැගුම්ලා, රාවොත්පාදනයකර; ලහෝපත්, බාලාශෝකපල්ලවයන් විසින්; තුල්, සාම්‍යයක්; නොපත්, අලබ්ධවූ; (බාලාශෝකපල්ලවයන් පැරැද වූයන අර්ථයි) අතුල්, හස්තතලයන්; ලෙදූමිලා, ලලිතදූනයෙන්; පෑ, පෙන්වා; රැඟුම්ලා, නෘත්‍යදක්වා; දනන්මන්, ජනතාවගේ චිත්තය; නිවායේ, සන්සුන්ආකාරයෙන්; නිවායේ, නිවීම කරයි.

127. මත්වෙමිනි, (පුෂ්පමධුපානයෙන්) චිත්තවෛකල්‍යයට පැමිණ; ගීරෙසෙහි, ගීතරසයෙහි; මත්සරිව, මාත්සර්‍යයුක්තව; වානේ, මධුවෂකයෝ; අත්තලටගත්, හස්තයටගත්තාවූද; විදුලිඅසමානේ, විද්‍යුල්ලතාපරයා; ලෙලෙන, ලලිතවූ; රත්, රක්තවර්ණවූ; පබලපත් අයුරු, ප්‍රවාලපත්‍රාකාරවූ; අත්, හස්තයන්; අබියස, (ජනයන්) අභිමුඛයෙහි; පානේ, ප්‍රකාශකරන්නාවූද; යෝනේ, යෞවනාවනිතාවෝ; නොපටු, අමන්දවූ; සිත්, චිත්තය; වඩති, වර්ධනයකෙරෙති; (ඉන්, ඒ හෙතුවින්) සත්, (ඒ දර්ශනයකරන) සත්වයෝ; සතුටුවෙත්, සන්තුෂ්ටවෙති.

---

* "මත්සරය"-මේද සැලකිය යුතු.

† "ලෙසැති—අසනි"-ඇතැම්.

128 අඟනක රඟ බැස පැන අත රා යා
තනනා තනනම් රත්හිස රා යා
විලසින් දනුයෙන් දෙව් අස රා යා
දනමත් කරවන දූන් ගී රා යා*

129 බැලුම් ඇලුම් කරන ලො ලේ
කතක එරඟ රඟන ක ලේ
පැලඳි සවණ නිල් උපු ලේ
නෙතට පැරදි සෙයින් සැ ලේ

130 පැතුනු පැතුරුනු සුර අඟන න් නේ
ලේවට රඟනා නෙක නළු ව න් නේ
රූ රුස සීලසයෙන් නෙත ල න් නේ
වේතුට වේතුට මේ දුටු ව න් නේ

---

128. තනනම්, පයොධරභිබානාවූ; රත්හිසරයා, සවර්ණහංස යුග්මය;. තනනා, තිතියෙන්නාවූ; අඟනක, එක්අඩගනාවක්; අත රඟාපැන, අතරින්වැද; රඟ, නෘත්‍යමණ්ඩලයට; බැස, අවතීර්ණව; දනුයෙන්, ධවන්‍යාරොපණයෙන්; දෙව්අසරයා විලසින්, දිව්‍යාප්සරාවකගේ විලාසයෙන්; දූත්, ප්‍රදූතයකළාවූ; ගීරයා, ගීතරවයෙන්; දනමත්කරවන, (බලාසිටින) ජනයන් කුල්මත් කරවන්නීය.

122. ලොලේ, චාපල්‍යයෙන්; බැලුම්, නිරීක්‍ෂණයෙහිලා; ඇලුම් කරන, අභිප්සාඇත්තාවූ; කතක, එක්කාන්තාවක්; එරඟ, ඒ නෘත්‍යමණ්ඩලයෙහි; රඟනකලේ, නෘත්‍යකරනකල්හි; සවණ, (ඒ කාන්තාවගේ) ශ්‍රවණවයෙහි; පැලඳි, පිලඬිතවූ; නිල්උපුලේ, නීලොත්පලයුග්මය; නෙතට, (ඇගේ) නයනාකාරයට හෝ නෙත්‍ර වර්ණයට; පැරදිසෙසින්, පරාජිතසෙසින්; සැලේ, චඤ්චලවෙයි.

130. සුරඅඟනන්සේ, දෙවඟනුන්ගේ සෙයින්; පැතුරුනු, ප්‍රසාරිතවූ; හෙවත් පැතිරීසිටියාවූ; තුනුපෑ, දෙහප්‍රභාඇති; ලේවට, රෙඛාවෘත්තියෙන්; හෙවත් මණ්ඩලාකාරයෙන්; රඟනා, නෘත්‍යකරන්නාවූ; නෙකනළුවන්ගේ, අනෙකනාටිකාවන්ගේ; නෙතලන්නේ, (දුටුවන්) නෙත්හි බනතලද්දවූ; රූ රුස, රූප කාන්තිනැමැති; සීලසයෙන්, සීතලජලයකරණකොටගෙන; මේ දුටුවන්ගේ, මේ දර්ශනයකළවුන්ට; තුටවේ තුටවේ, සන්තොෂවන්නේ මැයි.

---

* "උත් ගී මනමත්කරවනරායා"-හැම.

131 සැ ඳු සදෙව් යස සිරි පිරි සි ඳු සු ඳු
මු ඳු කුළුණු සිලිලෙන් සිලි ලි ඳු බ ඳු
මි ඳු ගිමන් වන්නව මේ ර ඳු රැ ඳු
ව ඳු සුරිඳු සඳ දිය සෙත යෙ ඳු උ ඳු

132 සිරිලක පවර හැඟ පුරඳර ගෙණ මුදු නී
සැදු තෙද දල උදුල සියපතසිය සෙසී නී
එසුරිඳු පැලඳි කිරුළය රන් මිණි ගිහි නි
සෙලඳුනැ සුදුල් වර සිහරද රැඳි වැ නි

133 නිල් උපු ලේ පැහැ සරහුනු නලල් තෙ ලේ
රැඳි නිම ලේ රත් පට නදන ඇම ක මල්
උදු සු නි ලේ දුල පැහැ සෙරෙන වල වෙ ලේ
කි ව විදු ලේ කිම දිලියෙනුද ඇමක ලේ

---

131. සුදු, අකලඞ්කවූ; සදෙව්, චන්ද්‍රයාසෙසින්; පිරිසිඳු, පරිසුද්ධවූ; යසසිරි, යසඃ ශ්‍රීන්; සැදු, සජ්ජිතවූද; මුදු, මෘදුවූ; කුළුණුසිල්ලෙන්, කරුණාභිධානජලයෙන්; හෙවත් කරුණා ජලප්‍රවේශයට; සිලිල් ඉඳුබඳු, සලිලෙන්ද්‍රයාවැනිවූද; (සමුද්‍රය බඳුවූද) ගිමන්මිඳු, ග්‍රීෂ්මාපහරණය කළාවූ; රුදු, මහත්වූ; නව මේරඳුවන්, අභිනවමේඝයෙක් බඳුවූද; දිය, ලෝකයට; උදු, සෘජුව; සෙතයෙදු, (දුඃඛාපහරණයෙන්) සෙත්ශාන්තිදානයකළාවූද; සුරිඳුසඳ, සුරේන්ද්‍රචන්ද්‍රයා; වඳු, (ශිෂ්ටාචාර හෙයින් සර්වවිඝ්නවිනිපාත සඞ්ඛ්‍යාත මඞ්ගලය පිණිස) නමස්කාරකරන්. *

132. පුරඳර, පුරන්දරයාගේ; හෙවත් ශක්‍රයාගේ; හැඟ, අධ්‍යාශය; හෙවත් වචනය; මුදුන, මස්තකයෙන්; ගෙණ, ග්‍රහණයකොට; පවර, උත්තමවූ; සිරිලක, ශ්‍රීලඞ්කාව; උදුල, උජ්ජ්වලිතවූ; සියපතසිය සෙසීනි, සූර්‍ය්‍යශ්‍රීසෙසින්; දල, දල්වෙන්නාවූ; තෙද, තේජඃකදම්බයෙන්; සැදු, අලඞ්කාරකළාවූ; එසුරිඳු, ඒ ශ්‍රීවිෂ්ණුදිව්‍යරාජයාවිසින්; පැලඳි, පිලන්ධිතවූ; රත්මිණිගිහිනි, සවර්ණමාණික්‍යයෙන්ගහනවූ; කිරුළය, කිරීටයතෙම; අඳුන්සෙලැ, අඤ්ජනශෛලයෙක්හි; රැඳි, රඤ්ජිතවූ; සුදුල්, මනාසේ ජ්වලිතවූ; වර, ශ්‍රේෂ්ඨවූ; සිහරදවැනි, සිංහරාජයෙක් වැන්නේය.

133. නිල්උපුලේ, නීලෝත්පලයක්හුගේ; පැහැසර, ප්‍රභාශ්වරය; හුනු, පතිතවූ; හෙවත් ග්‍රහණයකළාවූ; නලල්තෙලේ, ලලාට තලයෙහි; රැඳි, රඤ්ජිතවූ; නිමලේ, නිර්මලවූ; ඇමකලේ, සැමකල්හි;

---

* "වන්දනං ගුරුදෙවානං ග්‍රන්ථශාන්ති ප්‍රවර්ත්තනම්,
ග්‍රන්ථද්‍රව්‍යාවලෝකාන්ච මඞ්ගලං පරිචක්ෂතෙ.
නිත්‍යං පථ්‍යාශිනාං පුංසාං භිනත්ථාන නිවාසිනාම්,
මඞ්ගලාචරතාං විඝ්නෛත ප්‍රවිනිපාතො නවිද්‍යතෙ"-සමෘති.

134 දිලි රත්තෝඩු රිවි යුග මඩලෙකිවෙත ල
හිමි මුව තඹර නද ඇමකල සිරි දිසි ල
එත රිවි දුරිනි පුබුදන නෙක වන කම ල
සියපත් නොපත් නද නිති සිය ගුණෙන ස ල

135 අ න ත යු රේ* සිරි යදි යදි සතත් කෙ රේ
ඉ සු ර ත රේ දෙන බැලුමනිනි † නොවිත රේ
ව න න තු රේ සරනුවනතට එකයු රේ
ක ව ර ව රේ මේ සිරි දිසිද ඉඳුව රේ

---

නදන, (දුටුවන්) තුටුකරන්නාවූ; රන්පට, සෞවර්ණපට්ටයතෙම; (නලල්පට) උඳු, උදෙක්; සුනිලේ, අතිනීලවූ; දුල, ජ්වලිතවූ; පැහැ සෙරෙන්, ප්‍රභාශ්වරයෙන්; අවල, ආවෙෂ්ටිතවූ; වෙලෙ, වලාවෙක්හි; (දුලනාවූ) විදුළේ, විද්‍යුල්ලතාවක්වැනියයි; නිව, කථනය කළත්; කිම, කිමෙක්දෝ; ඇමකලේ, සැමකල්හි; දිලියෙනුද, (වලාවෙක්හි විද්‍යුල්ලතාතොමෝ) ජ්වලිතවේද?. (නිල්වලාවෙහි සැමකල්හිම විදුලිය නොරඳන හෙයින් විදුලියද මීට සමනොවෙයි යනු භාවයි)

134. දිලි, ජ්වලිතවූ; රත්තෝඩු, සෞවර්ණතාඩංකයුග්මයතෙම; හිමි, (මේ) ස්වාමීහුගේ; මුවතඹර, මුඛනැමැති තාමරසය; ඇමකල, රාත්‍රින්දිවයෙහි; නද, ආනන්දකරවූ; හෙවත් ප්‍රබොධකරන්නාවූ; දිසිල, දෘශ්‍යමානවූ; සිරි, ශ්‍රීවිභූතිඇති; වෙතල, අභ්‍යාසන්නවූ; රිවියුගමඬලෙකි, සූර්‍ය්‍යබිම්බමණ්ඩලවයෙකි; නෙක කමලවන, අනෙක පද්මවනයන්; දුරිනි, දූරස්ථව; පුබුදන, පොබොයන්නාවූ; රිවි, උදයසූර්‍ය්‍යයා; සිය ගුණෙන්, ශතසඞ්ඛ්‍යාතරශ්මියෙන්යුක්තව; අසල, (පද්මයන්ගේ) සමීපයට; එත. ආගමනයකරන්නේද; සියපත්, ශතපත්‍ර; නිති, නිත්‍ය යෙන්; හෙවත් රෑදවල්දෙක්හිම; නද, ආනන්දතාවට; නොපත්, අසම්ප්‍රාප්තවූයේ වෙයි. (ස්වාමීහුගේ තාඩංකයුග්මනැමැතිසූර්‍ය්‍යයා මුඛනැමැති පද්මය රෑ දවල් දෙක්හිම පොබොයවයි සූර්‍ය්‍යයා දවහල් මුත් රෑ කමලවන ප්‍රබොධය නොකරන හෙයින් තාඩංකයුග්මයට සමනොවෙයි යනු භාවයි)

135. සිරි, සම්පත්තීන්; යදියදි, යාච්ඤාකළ කළාවූ; අනතයුරේ, අනෙකප්‍රකාරවූ; සතන්කෙරේ, සත්වයන්ව; නොවිතරේ, ප්‍රමාණ නැතිසේ; තරේ, ස්ථිරවූහෝ මහත්වූ; ඉසුර, (ප්‍රාර්ථිත) සම්පත්තීන්; බැලුමනිනි, නිරීක්ෂණමාත්‍රයෙන්; දෙන, දානයකරන්නාවූ; සර, උත්තමවූ; නුවනතට, (මේ සුරෙන්ද්‍රයාගේ) නෙත්‍රයට, එකයුරේ;

---

* "අනතනුරේ"-කිසි. † "බැලුමනිසි"-ඇතැම්.

136 සුරඹ නෙ තා  බැඳි වන්නිලිපුලෙයි ග  තා*
දෙ බැම ල තා†  සිරි දූක උලෙල කැලුම  තා
සහස නෙ තා  සැව් සරිනොවන‡ විළි සි  තා
පෙණෙතඉතා  කලකින් නොදිසි ගිය අ  තා

137 ල ක ල්  කලුත් නරඹනනෙත් කැලුම්බ  ර
සි ලි ල්  නමනතුනු යටියට නැගි පව  ර
සු නි ල්  වසා ලියයට වට රැඳි නිතො  ර
වි ම ල්  සොඳුරු තෝ තැන්නෙක නැබ ගැඹු  ර

---

එක්වැනියක්; (උපමාවෙක්) වනනතුරේ, වර්ණනාකරනකල්හි; හෙවත් දර්ශනයකරනහොත්; මේ සිරි, (නෙත්‍රයාගේ විද්‍යමානවූ) මෙම ශ්‍රීවිලාසය; ඉඳුවරේ,, නීලොත්පලයෙක්හි; කවරවරේ, කිනම්කලෙක; දිසිද?, දෘශ්‍යමානද?.

136. සුරඹනෙතා, සුරාඞ්ගනාවන්ගේ නෙත්‍රයන්; බැඳි, (දර්ශනීයත්වයෙන්) බන්ධනය කළාවූද; නිලිපුලෙසිවන්, ඉන්දීවර වර්ණය; ගතා, ග්‍රහණයකළාවූද; (නීලවර්ණවූද යන අර්ථයි) උලෙල, උද්දීප්තවූද; කැලුමතා, කාන්තිමත්වූද; දෙබැමලතා, භ්‍රෑලතායුග්මයාගේ; සිරි, ශ්‍රීසෞන්දර්‍ය්‍යය; දූක, දර්ශනයකොට; සහසනෙතා, සහස්‍රනෙත්‍රයා; හෙවත් ශක්‍රයා විසින්; සරිනොවන, (දෙව්‍යාගේ භ්‍රෑලතාශ්‍රිය හා) තුල්‍යනොවන්නාවූ; සැව්, (තමාගේ) ඉන්ද්‍රචාපය; විළිසිතා, ව්‍රීඩාවිත්තයෙන්; නොදිසිගිය, සඟවාතබනලද්දවූ; අතා, දිශාව; ඉතා කලකින්, දීර්ඝකාලයෙකින්; පෙණෙන, දෘශ්‍යමාන වේ.

137. (එසුරිඳු, ඒ සුරේන්ද්‍රයාගේ;) ගැඹුර, ගම්භීරවූ; නැබ, නාභිය; ලකල්, ලීලාන්විතවූ; කලුත්, කාන්තාවන්ගේ; නරඹන, බැලුම්ලත්නාවූ; නෙත්, නෙත්‍රයන් සම්බන්ධවූ; කැලුම්බර, කාන්තිභාරනැමැති; සිලිල්, සලිලය; නමන, ප්‍රවෙශකරන්නාවූද; (වදින්නාවූද) තුනුයටි, දෙහනැමැති යෂ්ටියගේ; යට, අධඃප්‍රදෙශයෙහි; නැගි, සඤ්ජාතවූ; පවර, උත්තමවූ; සුනිල්, අතිනීලවර්ණවූ; වසා, රොමරාජිනැමැති; ලිය, ලතාවගේ; යට, අධඃප්‍රදෙශයෙහි හෙවත් මූලයෙහි; අවට, හාත්පසැ; නිතොර, නිත්‍යයෙන්; රැඳි, රජිතවූද; විමල්, නිර්මලවූද; සොඳුරු තෝතැන්නෙක, සුන්දරලවාලයෙක; හෙවත් දිය පාත්තියෙක.

---

* "සුරඹ නෙතාමින් ඇඳි බිළි පෙලෙව්ගතා"-හැමපොත්.
† "දෙමලකතා"-හැම.  ‡ "සරිනොවන"-ඇතැම්.

138 අ තු ල  කුළුණුදිය පිරි උරවිල * වත  ළ
ල ක ළ  දිමුතු මුතුවැලනම් තරඟ වැ  ල
අ ස ල  සුරඹ නරඹන ලොල්නුවන් පෙ  ල
ල ක ළ  මින් රැලය පෑසී කෙළන රල වැ  ල

139 යු ග බා  සුරිඳු විසිතුරු සිරි සුල  බා ය
සු ර ඹා  ගෙලෙහි පලඳන මන පොල  ඹා ය
සසො බා  සිනිඳු ඉඳුවරදම් පසු  බා ය
නොතබා  වණනහොත් අනතද කර  බා ය

140 සි රි ක ම ලේ  මෙන් රඳනුයෙනි නිතිලෙ  ලේ
ව ත වි පු ලේ  දෙන උරබිත බියෙන් ඇ  ලේ
ඉ ත් අ තු ලේ  නන් පද අත්දුරු ක  ලේ
හි මි අ තු ලේ  සිරි සරි කොද මෙලෝතු  ළේ

---

138. (එසුරිඳු, ඒ සුරෙන්ද්‍රයාගේ;) අතුල, අතුල්‍යවූ; කුළුණුදිය, කරුණානැමැති ජලයෙන්; පිරි, පරිපූර්ණවූ; උරවිල, වක්‍ෂස්ථාන යෙහි; වතළ, වැතිරගියාවූ; ලකළ, අලඞ්කෘතවූ; දිමුතු, දීප්තිමත්වූ; මුතුවැලනම්, මුක්තාවලීනැමැති; තරඟවැල, තරඞ්ගාවලීතොමෝ; අසල, ආසන්නයෙහිවූ; සුරඹ, දෙවඟනුන්ගේ; නරඹන, නිරීක්‍ෂණය කරන; ලොල්, ලොලවූ; නුවන් පෙල, නෙත්‍රපඞ්ක්තිනැමැති; ලකළ, හෙබියාවූ; මින්රැලය, මත්ස්‍යසමූහයා; කෙළන, ක්‍රීඩනයකරන; රල වැල, තරඞ්ගාවලියක්; පෑසී, ප්‍රකාශකළා.

139. සුරිඳු, (ඒ) සුරෙන්ද්‍රයාගේ; විසිතුරු, විචිත්‍රවූ; සිරි, ශ්‍රීවිලාසය; සුලබාය, සුලභ්‍යවූ; යුගබා, බාහුයුග්මයතෙම; සුරඹාගෙලෙහි, සුරාඞ්ගනාවන්ගේග්‍රීවායෙහි; මනපොලඹාය, මනඃප්‍රලොභයකොට; පලඳන, පිලඳනයකරනුලබන; සසොබා, ශොභාවත්වූ; සිනිඳු, සස්නිග්ධවූ; (මෘදුවූ) ඉඳුවරදම්, ඉන්දීවරදාමයන්; පසුබාය, ඉවතලන්නේය; නොතබා, ශෙෂනොකොට; වනතහොත්, (සුරෙන්ද්‍රයාගේ හස්තයුග්මශ්‍රිය) වර්ණනාකිරීමටසිතනහොත්; අනතද, (ජිහ්වාසහස්‍රයකින්යුක්තවූ) අනන්තනම්නාරජද; කරබාය, අධොමුඛවන්නේය; (වර්ණනාකර ගතනොහෙනුයෙන් ලජ්ජායුක්තව බිමබලා හිඳිසියේසි)

140. කමලේමෙන්, පද්මසදෘශවූ; සිරි, ශ්‍රීකදම්බය; රඳනුයෙනි, රඤ්ජමානවනහෙයින්; නිති, නිරන්තරයෙන්; ලෙල, ලලිතවන්නාවූද; (සත, සත්වයන්විසින්;) බියෙන්, භීතියෙන්; ඇලේ, ඇලුම්කොට; වත, වක්ත්‍රයන්; දෙන, දෘනයකරනුලබන්නාවූද; (බිය සහිතව ඇල්

---

* "උරබිත"-වැඩියක්.

141 දියසෙත නියුත හිමි උර බිත තුරේ ප ත
නිරතුරු උතුරු වන තුරු කුළුණු බරන ත
උසුලන බැවින් ලෙල සිඟු වලගෙහි සත ත
ගනරැලි සෙයින් තුන්විලි දිසිනෙය දිමු ත

142 පසිඳු සිඳුරුකර සිඳුරැසි දුර ම ත මා
සොඳුරු සිනිඳු රැසුදුල දඟ යුවල ෙ ත මා
උසස පෙදෙස සිහිනැයි යන අඬුව ත මා
මොනර කරය සරිවෙයි යත්තමක් ත මා

---

මෙන් බැලුම්ලන්නාවූද යනුභාවයි) විපුලේ, පුලුල්වූ; උරබිත, ප්‍රශස්ත වක්ෂස; ඉන්, එහෙයින්; අතුලේ (නිර්මලත්වයෙන්හෝ ශ්‍රෙෂ්ඨත්වයෙන්) අතුල්‍යවූ; නත්පදඅත්, නානාපදාර්ථයන්; දැරූකළේ, ධාරණයකළවිට; (දැරිමහෙතුකොටගෙන යනාඅර්ථයි) මෙතුන්නෙලේ, මේ ත්‍රිවිධලොක යෙහි; හිමි, ස්වාමීහුගේ; අතුලේ සිරි, අතුල්‍යවූ වක්ෂඃශ්‍රියට; සරි, සදෘශවූයේ; කොද?, කවරක්ද?.

141. දිය, සත්වයාට; සෙත නියුත, ශාන්තිදානයෙහි නියුක්තවූ; හිමි, (මේ) ස්වාමීහුගේ; උරබිතතුරේ, ප්‍රාශංස්‍යවක්ෂස්තරයට; පත, ප්‍රාප්තව; නිරතුරු, අතරනැතිව; උතුරුවන, ඉතිරියන්නාවූ; උතුරු, උත්තරවූ; හෙවත් (නිර්මලත්වයෙන්) ශ්‍රෙෂ්ඨවූ; කුළුණු, කරුණාවගේ; අනතබර, අනන්තභාරය; සතත, නිත්‍යයෙන්; උසු ලනබැවින්, උවහන්‍යකිරීම හෙතුකොටගෙන; සිඟු, කෘශවූ; වල ගෙහි, මධ්‍යප්‍රදෙශයෙහිවූ; ලෙල, ලලිතවත්නාවූ; තුන්විලි, ත්‍රිවලීහු; දිමුන, දීප්තිමත්වූ; ගනරැලිසෙයින්, මෙඝවජටාව්‍යාජයෙන්; දිසිනෙය, දෘශ්‍යමානයහ.

142. (මෙහිමි, මේස්වාමීහුගේ;) තෙමා, ප්‍රශස්තවූ; රැස්උදුල, රශ්මි ව්‍යාප්තවූ; දඟයුවල, ජඞ්ඝායුග්මයාගේ; සොඳුරු, සුන්දරවූ; සිනිඳු, ස්නිග්ධත්වයට; හෙවත් මොලකැටිබවට; පසිඳු, (කවිසමයෙහි) ප්‍රසිද්ධවූ; සිඳුරුකර, හස්තිශුණ්ඩය; සිඳුරැසි; ජිඳුත්විතයයි; තමා, තෙමේ; දුරම, (උපමා සන්දර්ශනයට ආසන්නනොව) දූරස්ථවන්නේය; තමා, තමාගේ; (ජඞ්ඝාවගේ) උසස පෙදෙස, උන්නත ප්‍රදෙශයෙහි; සිහිනැයි යන, සිහින්‍ය කියන; අඬුව, ඌනත්වයට; මොනරකරය, මයූරග්‍රීවාතෙමෝ; තමා, තෙමේම; යත්තමක්, ලෙශමාත්‍රයක්; සරි වෙයි, සදෘශවන්නේය.

143. සිරිකත මත නුමුත මලිගියමල් සෙසී නී
පැහැරල පහරනැගිතුනු සිඳු මුතු ලෙසී නී*
දූඩියෙන් අසුරයන් යස ඇලුනා සෙසී නී
නෙවුනෙය සතත සරණත නියකැන් සිරි නී

144 වි ස් මයකර දුටුවන් † නොම ඇරෙන ලො බා
නො ස් වඩමින් රූසිරි ‡ සමුදුරෙසී ප බා
ඇ ස් පිල්පෙල § දිටුතට නොකළ කල බ ඹා
ඇ ස් දෙකකින් නැරඹිය හැකිද ඇති සු බා

---

143. සිරිකත, ලක්‍ෂ්මියගේ; මත, ශීර්ෂයෙහි; (පිළන්ධිතවූ) නුමුත, සුගන්ධමුක්තනුවූ; මලිගියමල් සෙසිනි, දූසමන්පුෂ්පසෙයින්ද; තුනු සිඳු, (මේ සුරෙන්ද්‍රයාගේ) දෙහශ්‍රීසමුද්‍රයෙහිවූ; පැහැ, ප්‍රභානැමැති; රලපහර, තරඞ්ග ප්‍රහාරයෙන්; නැගි, ලඞ්ඝිතවූ; (උද්ගතවූ) මුතු ලෙසිනි, මුක්තාව්‍යාජයෙන්ද; අසුරයන්, (චරණාරවින්දප්‍රණාමනත් පරවූ) දානවයන්ගේ; යස, කීර්තිය; දූඹියෙන්, ඝනබවව; ඇලුනා සෙසිනි, ආලිප්තවූවාක්මෙන්ද; සරණත, (ස්වාමීහුගේ) චරණතල යෙහි; නියකැන්, නඛකාන්තීහුමෝ; සතත, නිරන්තරයෙන්; සිරිනි, ශොභාසම්පන්නව; නෙවුනෙය, විරාජිතවූවා.

144. විස්මයකර, විස්මයපත්කිරීමෙන්; දුටුවන්, දර්ශනයකළවුන් ගේ; ලොබා, දර්ශනාභිලාෂය; නොමඇරෙන, පහනොවන්නාවූම; (වර්ධනයකරන්නාවූම යනු අදිසි) රූසිරි, (ඒ සුරෙන්ද්‍රයාගේ) රූපශ්‍රී නැමැති; සමුදුරෙසී, සමුද්‍රයෙහි; පබා, ප්‍රභාව; නොස්වඩමින්, ප්‍රමෝදවර්ධනය කෙරෙමින්; තට, යුෂ්මන්හුගේ; පිල්ඇස්පෙල, පිච්ඡාක්‍ෂිපඞ්ක්තියෙහි; දිටු, දෘෂ්ටිමණ්ඩලය; හෙවත් දර්ශනශක්තිය; බඹා, බ්‍රහ්මයා; නොකළකල, විද්‍යමානනොකළවිට; (ඔබගේ පිල් ඇස්පෙලින් බැලීමට බ්‍රහ්මයා නොසැලැස්වූකල යනු භාවයි) ඇති සුබා, සාත්වූපරිද්දෙන්; ඇස්දෙකකින්, (විද්‍යමානතෙල) නෙත්‍ර වයෙන්; (පමණක්) නැරඹීඝහැකිද, නිරීක්‍ෂණයකළ හැක්කේද. (නොහැක්කේ මැයි)

---

* "මුතුවෙසිනි"-කිසි. † "දුටුසඳ"-ඇතැම්.
‡ "රූරස"-වැඩියක්. § "පිල්පල"-නිරවද්‍ය පාඨයක්.

145 සුරනිඳු කුළුණු සඳ යදි සෙත දෙ න් නේ ය
සිහිකල සඳමඇම සිරි පමුණ න් නේ ය
සිහිනෙන් දුටෙව් පිරිපත දුර ල න් නේ ය
යස තෙද නැන සැපත් ආසිරි දෙ න් නේ ය

146 සිතුමිණි සුරබි ලඟ නොමවත කිවද කෙ සේ
සිතුයුරු අයැදි සත සිරිසැපදෙන එක සේ*

147 කු ළි න් කුළසුනෙර තුඟු හිම ගිරි මුදු න
මු ලි න් මුල නඳුනුයන කප්රුක් සර න
තෙරෙ න් තෙරෙහි සුරගඟ සුරඟන රඳ න
තෙනෙන් තෙන කියති නිති † යස ගී නදි න

---

145. කුළුණුසඳ, කරුණාසහගත සිත්ඇත්තාවූ; සුරනිඳු, (මේ) සුරේන්ද්‍රතෙම; යදි, (සත්ත්වයන් විසින්) අභියාචිතවූ; සෙත, ශාන්තිය; දෙන්නේය, දානයකරයි; සිහිකල සඳම, සමරණයකලකෙණෙහිම; ඇමසිරි, සමස්ත සම්පත්හින්; පමුණන්නේය, ප්‍රාප්තකරන්නේය; (සලසාදෙන්නේය) පිරිපත, ප්‍රත්‍යුහයන්; හෙවත් උපද්‍රවයන්; සිහිනෙන්දුටු එව්, ස්වප්නයෙන් දුටුදූසෙයින්; දුරලන්නේය, ධ්වංශනය කරයි; යස, කීර්තිය; තෙද, ප්‍රතාපය; නැන, ඥානය; සැපත්, සම්පත්තිය; ආ, දීර්ඝායුෂය; සිරි, ශ්‍රියනාමනොක්දූ; දෙන්නේය, (යාච්ඤාකළවුන්ට) දානයකරයි.

146. සත, සත්වයාවිසින්; සිතුයුරු, කැමැත්තතියායෙන්; අයැදි, ආයාචිතවූ, සිරිසැප, ශ්‍රීසම්පත්තීන්; එකයේ, එකාන්තයෙන්; දෙන, ප්‍රදානය කරන්නාවූ; සිතුමිණි, චින්තාමාණික්‍යයද; සුරබි, සුරභි ධේනුවද; කෙසේ කිවද, (මේ සුරේන්ද්‍රයාට සමකොට) කිසිලෙසකින් වර්ණනාකලත්; ලඟනොමවත, ලංනොවන්නාහුමය; හෙවත් සදෘශ නොවෙත් මැයි.

147. තුඟු, ප්‍රාංශුවූ; සුනෙර, මේරුපර්වතය; හිමගිර්, හිමාලයාද්‍රිය යනාමොවුන්ගේ; මුදුන, මස්තකයෙහි; කුළින්කුළ, කූටයෙන්කූටයට; සරණ, සඤ්චරණයකරන්නාවූද; නඳුන්උයන, නන්දනොද්‍යාන යෙහිවූ; කප්රුක්, දෙවද්‍රැමයන්ගේ; මුලින් මුල, මූලයෙන් මූලයට;

---

* "සිතුපුරු ඉසුරු සිමදින ඒ ද මෙලෙසේ"-සම්භාව්‍ය පාඨයක්.

† "ඉනි කියති"-වැඩියක්.

148 සෙත යදිසක් හට දෙන දිගුබිතෙසී සෑ රී
පිරිමුලු සක් වළ පුල්වන් සුරිඳු සි රී*
ලෙසවෙසෙසක් කර න තනා හටත් ස රී†
වත දහසක් නව ලදුවත් වණනු බැ රී

149 ද න්වා රදුන් කිරුළඟ මිණිකැන් සෙයි නී
පෙ න්වා පැවති නිති තෙදිනුදුලදලම් නී
ද න්වා දහම්ලක රුකි සුරිඳුට බැති නී
ද න්වා ලන්න ගියකටයුතු තතු ලෙසි නී

---

සරණ, ප්‍රයාණයකරන්නාවූද; සුරගඟ, සවණීදියගේ; තෙරෙන් තෙරෙහි, තීරයෙන් තීරයෙහි; රඳන, රඤ්ජමානවූද; සුරගන, දිව්‍යාප්සරාවෝ; නිති, අවිරතයෙන්; තෙනෙන් තෙන, තත්හි තත්හි; යසගී, (මේ සුරේන්ද්‍රයාසම්බන්ධව සුවර්ණ්‍යවූ) යශොගීතයන්; නදින, ආනන්දනායුක්තව; කියති, කථනය කෙරෙත්.

148. යදිසක්හට, යාචකසමූහයාට; හෙවත් ශාන්තිඉල්වා පැමිණියවුන්ට; දිගුබිතෙසී, දිශාභිජාතියෙහි; සෑරී, සඤ්ජරිතව; සෙත දෙන, ශාන්තිදානයකරන්නාවූ; මුලුසක්වළ, සමස්තචක්‍රවාටයෙහි; පිරී, පරිපූර්ණ (වසිටියා) වූ; උපුල්වන්, උත්පලවර්ණවත්වූ; සුරිඳු, සුරේන්ද්‍රයාගේ; හෙවත් ශ්‍රීවිෂ්ණුදිව්‍යරාජයාගේ; සිරි, ශ්‍රීසෞභාග්‍යය; වෙසෙසක්ලෙසකර, විශෙෂවිලාසනිපදවා; සරි, (විද්‍යමානමුඛසහස්‍රයටම) සදෘශවූ; නවවනදහසක්, අන්‍යවක්ත්‍රසහස්‍රයෙක්; ලදුවත්, ලද්දේනමුදු; වණනු, (තත්වූපරිද්දෙන්) වර්ණනාකිරීම; තතනාහටත්, අනන්තනාම්නාරජ්ජුහටත්; බැරි, භාරයි. (නොහැකියිසේයි)

149. දන්වාරදුන්, දානවරාජයන්ගේ; කිරුළඟ, මකුටමස්තකයෙහි; මිණිකැන්සෙයිනි, මාණික්‍යකාන්තියෙන් මෙන්; නිතිදලම්නි, නිත්‍යොරදල්වෙමින්; පෙන්වා, දර්ශනයකරවා; පැවති, ප්‍රවෘත්තවූ; තෙදිනි, තෙජසින්; උදුල, උජ්ජ්වලිතවූද; දහම්දන්වා, ධර්ම්ය දූත; ලකරුකි, ලඞ්කාසංරක්ෂණය කළාවූද; සුරිඳුට, උත්පලවර්ණසුරේන්ද්‍රයාට; ගියකටයුතු, (අයමතුන්සඳහා යුෂ්මතුන්) ගියකායයිය; තතු ලෙසිනි, තත්වූපරිද්දෙන්; හෙවත් අප කර්තව්‍ය කරනසැටියෙන්ම; බැතිනි, භක්තියුක්තව (සිට) දන්වාලන්න, විඥාපනය කරත්.

---

* "පුල්සුරිඳුගසි සිරි-පුල්සුරිඳු යසසිරී"-වැඩියක්. † "බැරී"-හැම.

150 රිවිසඳසෙ තෙදයස *—රැඳි දිරිනි රන්ගිරි සරු †
සයුරක් සේ නෑර තියු ගී නදින් සෑ ඳු
අලගක් කෝ නාර හිමි සිරි සඳ වැල ඳු
සතපා උපාගුරු—ඈපාහිමිඳු පින්ස රු
දෙව් තුරුමෙන් ලෙව් රුතිඳුන් න ඳුන් යුත
දෙව් හිමිසඳ ස ව් සැපතින් මු ඳුන් පත
පී නා නා මෙලක තුන් බෑ මෙහිමි වෙ ත
මා නා නා ලෙව්සුරු දෙවමින් සත ත
දී නා නා ලෙසින් තෙද දිවනා දිග ත
දී නා නා වික්‍රම් දුනමැනවි දිය සෙ ත

150. (මෙසේ ශිෂ්ටසම්මත පූර්වකෘත්‍යසඳශීනයට අනන්තරව දෙවෙන්ද්‍රයාවෙත විඥප්‍යවූ ප්‍රතිනියත කර්තව්‍යණීනාත්මක සන්දේශාඞ්ගය මේ ප්‍රකාරයෙන් කිවමැනවයි දක්වන කවිවරයෝ "රිවිසඳසෙ" යනාදිය කියති) රිවිසඳසෙ, සූය්‍ය්‍යචන්ද්‍රදෙදෙනාට බඳුවූ; තෙදයස, තෙජස්යසස්දෙකින්හා; රන්ගිරිසරු, ස්වණීපර්වතයසේස්ථිරවූ; දිරිනි, ධෛය්‍ය්‍යයෙන්; රැඳි, රඤ්ජිතවූද–නෑර, ශෙෂනොකොට; සයුරක්සේ, සාගරයසේ විස්තෘතවූ හෝ ගම්භීරවූ; තියුගීනදින්, සත්‍යත්‍යාත්මක ගීතධ්වනියෙන්; සෑඳු, අලඞ්කෘතවූද; සිරිසඳ, ශ්‍රීදෙවීන් විසින්; වැලඳු, ආලිඞ්ගිතවූද (දූවටුනාවූද); අලගක්කෝනාරහිමි, අලකෙශ්වර ප්‍රභූන්ට හා– සතපා, තෙජෝයුක්තවූද; උපාගුරු, (සාමදානාදි චතුර්විධ) උපායයොජනයට උපදෙශකවූද; පින්සරු, පුණ්‍ය සාරවූද; ඈපාහිමිඳු, ආදිපාදස්වාමීන්ට හා– දෙව්තුරුමෙන්, කල්ප වෘක්ෂසෙයින්; ලෙව්, ලොකයාට; රුති, රිසියෙනඳූ; නඳුන්යුත, ආනන්දනා යුක්තව; ඳුන්, ප්‍රදානයකලාවූ; සව්සැපතින්, සමස්ත සම්පතින්; මුඳුන්පත, ශ්‍රෙෂ්ඨභාවයෙහි සිටියාවූ; දෙව්හිමිසඳ !, දිව්‍යරාජොත්තමයානෙනි!; මෙලක, මේ ශ්‍රීලඞ්කාව; පිනානා, (දශ රාජධර්මයෙන්) ප්‍රීණනයකරන්නාවූ; මෙහිමි, මේ නරෙන්ද්‍රයාගේ; තුන්බෑවෙත, බෑණන්තෙදෙනාටද; හෙවත් තුන්සොහොයුරන්ටද; ලෙව්, ලොවඇතිතාක්; නානා, අනෙකප්‍රකාරවූ; මාඉසුරු, මහ දෛශ්වය්‍ය්‍යය; සතත, අනවරතයෙන්; දෙවමින්, දානය කෙරෙමින්; දිගත, දිගන්තරයෙහි; දිවනා තෙද, ධාවනය කරන්නාවූ (පැතිර යන්නාවූ) තෙජස; නානාලෙසින්, අනෙකප්‍රකාරයෙන්; දී, ප්‍රදානයකොට; නානාවික්‍රම්, අනෙක පරාක්‍රමය; දී, ප්‍රදානයකර; දියසෙන, (මේ ආකාර) විජයශාන්තිය; ඳුනමැනවි, ප්‍රදානයකල යෙහෙකි.

* "යසතෙද"–සෑම. † "සිරිපුරු"–පාඨාන්තරයක්.

151 රවිකුල කිරි මුහුද—ඔද දෙන සුපුන් සඳසු        රූ
අ ල් ප සි තා  නොසිතා වත දෙමි  න්   ශ්‍රී  තා
ක ල් ප ල තා  සරණඝ වන ලෙව   න්   වෙ තා
පිරි සිරි සඳ ලෙසින්—ඇම සඳ පිය සිරින්*   සො ඳ

සැ දූ  ස දු න්  වැනි යස දිගඟන   න්   ග  තා
ර  දූ  ස දු න්  කුලරූ ගුණ මුදු    න්   ප  තා

දි  ලී  කග අවියතුට කරන රණ කෙ          ළී†
ඇ  ලී  සිරිත් සිරිසඳ රඳන ‡ ඇදගි          ලී
ලො ලී  වෙමින් නිති තම රැකි ඇසුරු ක      ළී
කු  ලී  සෙනග ලංකළමැනවි පිය බ          ලී

---

, 151. සුපුන්සඳසුරූ, පූර්ණචන්ද්‍රාකාරයෙන්; රවිකුල, සූර්‍ය්‍යවංශ නැමැති; කිරිමුහුද, ක්ෂීරාර්ණවයට, ඔද දෙන, ඔජෝදානයකරන්නාවූද- අල්පසිතානොසිතා, ලාමකචින්තොත්පාදනයනොකොට; කල්ප ලතා, කප්ලියක් සෙයින්; ශ්‍රිතා, හිතවත්ව හෝ අධිකලෙස; වත දෙමින්, වස්ත්‍ර ප්‍රදානයකෙරෙමින්; ලෙවන් වෙතා, ලොකයාහට; සරණයවන, ප්‍රතිශ්‍රාවන්නාවූද; පිරිසිරි, ශ්‍රීපරිපූර්ණවූ; සඳලෙසින්, නිශාකරා කාරයෙන්; ඇමසඳ, සැමකල්හි; පිය, ප්‍රියභාවයෙන් හා; සිරින්, ශ්‍රීවිලාසයෙන්; සොඳ, ශොභනවූද; සඳුන්වැනි, චන්දනා කාරවූ; යස, කීර්තිය; දිගඟනන් ගතා, දිග්ලක්ෂණවනිතාවන්ගේ ගාත්‍රයෙහි; සැදූ, සජ්ජිතකළාවූද; කුල, කුලචාරිත්‍රය; නොහොත් කුල, ප්‍රාශංසාවංශය; රූ, රූපසෞන්දර්‍ය්‍යය; ගුණ, (සෞජන්‍යාදි) ගුණ යනමෙතෙක්දෙයින්; මුදුන්පතා, මස්තකප්‍රාප්තවූද; රදූසඳුන්, උත්තමරාජදුහිතෘන් හා- කගඅවිය, ඛඩ්ගායුධයෙන්; දිලි, ජ්වලිතව; තුට, තුෂ්ටියෙන් (යෙදී); රණකෙළිකරන, සංග්‍රාමක්‍රීඩනය කරන්නාවූ; සිරිත්, මනාචාරිත්‍රහෙතුකොටගෙන; සිරිසඳ, ලක්ෂ්මීදෙවිය; ඇදගිලි, සම්භාවනයෙන්; ඇලී, ඇල්මකොට; රඳන, වාසයකරනු ලබන්නාවූ; ලොලීවෙමින්, ලෞල්‍යයුක්තවෙමින්; නිති, නිරන්තර යෙන්; තමරැකි, තමාආරක්ෂාකළාවූ; (එහෙයින්ම) ඇසුරුකළ, ආශ්‍රය ප්‍රාප්තවූ; පිය, ප්‍රියවූ; බලී, අධික හෝ ප්‍රශස්ත බලඇත්තාවූ; කුලීසෙනඟ, ස්වීයවංශාගතවූ සෙනාඞ්ගයද; ලංකළමැනවි, (අපගේ ලඞ්කෙශ්වරයානන්ට) ආසන්නකොට දුනමනාය.

---

* "ජයසිරින්"-යි ද පෙළෙක්.   † "දිලීනාගවියකුතට කරනරණකෙලී"-හැම.
‡ "ඉඳින"-වැඩියක්.

152 සුසැදු බුදුසාසන—සිරින් සුලකළ ඇමස ද
පැහැසර දහම් කොත් ජයකොත් කළ දිග ත*
පැනසර දහම් කිත් මාහිමි සඳු සහි ත†
මහගුණ මහතෙර—සුලුතෙර පවර හිමිහු ද

උබය ලොවට කළ සරු පින්කෙත් තැන්ම
උබය වාසයේ මහසඟ ඇම තැන්ම

තොස් වා ගුණ නුවන ආසිරිදී දිග ට
වස් වා එක්ව කිරබෙව් ලෙව් සතුටු කො ට
පස් වා දහස් දම්රකිනුව දෙව් රජු ට
අස් වා කියන් මෙවදන් අස්න නමකො ට්

---

152. සුසැදු, සුසජ්ජිතවූ; හෙවත් යාපත්යේ පවත්වනලද; බුදු සාසන සිරින්, සම්බුද්ධශාසනශ්‍රීයෙන්; ඇමසඳ, සැමකල්හි; සුලකළ, අත්‍යලඞ්කෘතවූ; (සම්බුද්ධශාසනශ්‍රීභාරධාරිවූ යන අර්ථයි)-පැහැසර, ප්‍රභාශ්වරවූ; දහම්කොත්, සද්ධර්මපතාකය; දිගත, දිශාන්තයෙහි; ජයකොත්කළ, විජයධ්වජයක් කළාවූ; පැනසර, ප්‍රඥාසාරවූ; දහම් කිත් මාහිමිසඳුසහිත, ධර්මකීර්ති මහාස්වාමිපාදයන්හා සමගින්:- මහගුණ, ප්‍රශස්ත හෝ පූජ්‍යගුණඇත්තාවූ; මහතෙර, මාලුවරුන් වහන්දෑය; පවර, ශ්‍රේෂ්ඨවූ; සුලුතෙරහිමිහුද, අනුතෙරවරුන් වහන්දෑ අවසන්කොට ඇත්තන්ය යන; (මේකර්තෘවූ) උබයලොවට; උභය ලොකයට; සරු, සපිරංශවූ; පින්කෙත්තැන්මකළ, පුණ්‍යක්ෂෙත්‍ර ස්ථානයක්ම කළාවූ; හෙවත් පින්කෙතක්වමසිටියාවූ; උබයවාසයේ මහසඟ, උභයවාසයෙහි මහාසඞ්ඝයා; ඇමතැන්ම, සැමදෙනාවහන් දෑම; තොස්වා, සන්තොෂ කරවා; ගුණ, ගුණද; නුවන, ප්‍රඥාවද; ආ, ආයුෂද; සිරි, සම්පත්ද; දිගට, දීර්ඝකාලයකට; දී, දානයකොට; කිරබෙව්, කිරිමුහුදියක්සේ; එක්ව, සමග්‍රව; ලෙව්සතුටුකොට; ලොකයා සන්තුෂ්ටකර; වස්වා, වාසයකරවා; නොහොත් වර්ෂනයකරවා; පස්වාදහස්, පන්දහසක් හවුරුදු මුලුද; දහම් රකිනුව, ධර්මය රැක දෙනු පිණිස; දෙව්රජුට, ශ්‍රීවිෂ්ණු දිව්‍යරාජයානන්ට; අස්වා, ශ්‍රවණයකරවා; නමකොට, නමස්කාරකර; මෙවදන් අස්න, මේ වාක්‍යසන්දේශය; කියන්, කථනයකරන්.

---

* "දිසඳ"-ඇ.තැ.ම. † "සමිත-සමිද"-හැ.ඉ.

153 වි කු ම් දැඩිදපය බිඳ රුදු රුපු න් ග නා
තර ම් වැඩි පදවිනන් නියු සිරි න් යු තා
අ ද ම් අද නොකළ ලක * අණ සකි න් ග නා
අ ග ම් පඩි සෙනග වෙත යලි සිත න් සෙනා

154 අ ත් ත ල උ දු ල අවිරුපු කැල කර සස ල
ග ත් නි ල අ ස ල කළ † විකුමන් පෑ අතු ල
ව ත් ත ල මෙබල වෙත සලසා ජයමඟු ල
සෙ ත් බ ල සි ය ල සිරිදුන මැනවි සුවිපු ල

153. දැඩිවිකුම්, ප්‍රෞඪවික්‍රමයෙන්; රුදු, රෞද්‍රවූ; රුපුන්, ශත්‍රූන්ගේ; දපය බිඳ, දර්පභග්නකොට; ගනා, (ජීවග්‍රාහයෙන්) ග්‍රහණය කළාවූද; නන්පදවි, නා නා (ස්ථානාන්තර) පදවිසම්බන්ධවූ; වැඩි තරම්, අධිකප්‍රමාණවූ; නියුසිරින්, සත්‍යාත්මක ශ්‍රීසම්පත්තියෙන්; නොහොත් සත්‍රුතිප්‍රකාශයෙන් හා ශ්‍රීසම්පත්තියෙන්; යුතා, යුක්තාවූද; අද, හෘදයෙහි; අදම්, අධර්මයෙක්; නොකළ, නොකළාවූද; (සිතෙහි යහපත්ධර්මයක්ම ධාරණයකළාවූ යනුභාවයි) ලක, ශ්‍රීලඞ්කාව; අණසකින්, ආඥාචක්‍රයෙන්; ගනා, (සංරක්ෂණය පිණිස තමා හස්තයට) ග්‍රහණයකළාවූද; අගම්පඩිසෙනගවෙත, (යුද්ධාඞ්ගනාසෙහිලත් විජය ශ්‍රී දෙවීන් වැලඳගත් සූවිසිලක්‍ෂපස්විසි දහසක් පමණවූ) අගම්පඩි නම් මහාසේනාධිපය කෙරෙහි; යලි, පසුව; සෙනා, (විජය) ශාන්තිය; සිතන්, චින්තනය කරන්; හෙවත් දෙවියාකෙරෙන් යාච්ඤා කරන්.

154. අත්තල, හස්තතලයෙහි; උදුල, ලෙලදෙන්නාවූ; අවි, යුධා යුධයෙන්; රුපුකැල, ශත්‍රුසමූහයා; සසලකර, (භයින්) වෙව්ලවා; අතුල, අසදෘශවූ; විකුමන්, වික්‍රමය; පෑ, ප්‍රකාශකර; අනිල අසල කළ, චණ්ඩමාරුතයක් හා සමව; ගත්, ග්‍රහණයකළාවූ; (දුරුකළාවූ යනු භාවයි) වත්තල, වත්තලනම් ග්‍රාමයෙහි; (නිත්‍ය රක්‍ෂිතවූ) මෙබලවෙත. (සඞ්ග්‍රාමමණ්ඩලයෙහි අසදෘශ වික්‍රමයෙන් භ්‍රාජිතවූ අලෙසන්ගමුනූනාත් නරුනාමිකප්‍රියයාගේ) මේමහාසෙනාව කෙරෙහිද; ජයමඟුල, විජයමඞ්ගල්‍යය; සලසා, සලස්වා; සෙත්බල, ශාන්තිබලයද; සියලසිරි, සකලසම්පත්ද; සුවිපුල, අතිමහත්කොට; දුනමැනවි, ප්‍රදානයකළයෙහෙති.

* "නොකල කළ"-හැම. † "කර"-ඇතැම්.

155 ජ ය ර ම් පුරයවන් පුර රදනා සක ස
ම න ර ම් සිරින් සිරිකතවන් පියුම් රැ ස
කෙත ර ම් ඉසුරු වුව දෙනෑයදි අයැදි ලෙ ස
න ග ර ම් සිටුතුමන් දුටුවන් කරන තො ස*

156 වි නා නො වී නා නා සිරි සර වනි නා
ද නා ම නා නා සව් සිරිනි වොරද නා
ම නා මෙසේ නා නා යක මැහින් ම නා
මෙ නා දි නා නා බලදුන මැනවි ම නා

157 වෙ ත් හ ස් කරන විකුමෙන් මන් වෙමින් ත රු
ම ත් හ ස් කරන දස දම් මිණි නිදන් ව රු
ර ත් හ ස් වරන වැනි † සිරිලක සරෙයි ස රු
ස ත් හ ස් ඇමති කැමිදුන් මන් සිරින් පු රු

---

155. ජය, විජයභූමිවූ; රම්පුරයවන්, රම්‍යපුරයවැනිවූ; පුර, මේපුරයෙහි; සකස, සාපත්ව; රදනා, රඤ්ජමානවූද; සිරිකතවන්, ශ්‍රීදේවීන් ප්‍රවිෂ්ටවූ; පියුම්රැස, පද්ම ශ්‍රියටබඳු; සිරින්, දේහශ්‍රීයෙන්; මනරම්, මනෝරම්‍යවූද; කෙතරම්ඉසුරුවුව, කොපමණඓශ්වර්‍ය්‍යවූවත්; යදි, යාචකයන්ට; අයැදිලෙස, ඉල්වූනියායෙන්; දෙන, දානයකරන්නාවූද; දුටුවන්, දර්ශනයකළවුන්; තොසකරන, සන්තුෂ්ටකරන්නාවූද; නගරම්සිටුතුමන්, නගරම්සිටුතුමා යන අපරනාමධෙයයක් ඇති:-

156. නානා, නෛකවිධවූ; සිරිසර, ශ්‍රීසාරය; වනිනා, වස්තුයයනා මෙයින්; විනානොවී, වියෝනොව; (අනන්තසම්පත්තියෙන් යුක්ත වම යන අර්ථයි) සව්සිරිනි, සමස්තසම්පත්තියෙන්; නාදනා, අනේකජනයන්ගේ; මනා, චිත්තය; වොරදනා, අවරඤ්ජනය කරන්නාවූ; මනා, යහපත්වූ; මෙසේ නානායකමැහින්, මේ සේනා නායකමන්ත්‍රීන්ට; මනා මෙනා, මනොනුකූලපරිච්ඡේදන්; දිනා, ජය ග්‍රහණයට හෙතුවූ; අනාබල, අනන්තවූ හෝ පෙරනොලද්වූබල යෙක්; මනා, යාපත්කොට; දුනමැනවි, ප්‍රදානයකළසේක.

157. තරුමන්වෙමින්, උදාරබ්‍යාසඇතිව; විකුමෙන්, වික්‍රමයෙන්; වෙත්, ත්‍රිවික්‍රමයා; හෙවත් ශ්‍රීවිෂ්ණුදිව්‍යරාජයා; හස්කරන, සන්තුෂ්ට කරන්නාවූ; වරු, ශ්‍රේෂ්ඨවූ; දසදම්, දශරාජධර්මනැමැති; මිණිනිදන්,

---

* "සිටුතුමන් යදු කරනු මත්තොස"-වැකියක්. † "මැනි"-නැම.

158 සෙතකර බැබලි කිහිරැලි දෙවිදු වෙත ප ත
විසිතුරු මිතුරු යුරු දුකැදුරු දුරු කර . ත
ලකතුරු අඳුරු නොවතුරු නිසයුරු සෙසි ත
සතාමින් අමින් රැකා මෙත් සිත් සයුර මෙ ත

159 මෙ හ සු න් පඬුරදී සිරිදෙන විපු ල් ව ත
කා ර ම් න් මිතුරු කොඳ නද ගුණ ලක ල් ව ත
සියො තු න් සියොව සියනෑ යස විපු. ල් ව ත
ය ස සි න් පවතු මොනරිඳු සඳ! උදු ල් ව ත

---

මාණික්‍යනිධානය; මත්, විතානයෙහි; හස්කරන, සර්වතෘප්තකරන්නාවූ; (නැත්පත්කොට තබන්නාවූ) සිරිලක, ශ්‍රීලඞ්කානාමැති; සෙරසී, නඩාහගෙහි; සරා, සංග්‍රහණය කරන්නාවූ; රත්හස්වරනවැනි, සවර්ණාසරාජසදෘශවූ; සත්හස් ඇමිනි කැම්ඳුන්, (රාජකීය සන්දේශ ලිපිකිරීමෙහි ශ්‍රෙෂ්ඨපදවිලද්දාවූ) සත්හස් ලේඛකමන්ත්‍රීන්ගේ; මත්, විතානාභිලාෂය; සිරින්, සකලසම්පත්තීන්; පුරා, සම්පූර්ණකර.

158.—159. (මෙසේ සන්දේශ පරිසමාප්තියකොට තදනන්තරව කාව්‍යාන්තයෙහි සෙත්ශාන්තිකිරීම සමස්ත ශිෂ්ටාචාර * හෙයින් සව්කායසී තත්පරවූ මයුර පක්ෂියාහට ශුභාශංසනාය කොට ඔහු ප්‍රෙරණයකටැව්වූ කවිවරයෝ **"සෙතකර"** යනාදිය දක්වන්නාහ) පත, පලින්තිය්‍යුත්තෙක් ඇති; දුකැදුරු, දුඃඛාන්ධකාරය; විසිතුරු, (රශ්මියෙන්) අලඞ්කෘතවූ; මිතුරුයුරු, සහශ්‍රරශ්මිහුසෙසින්ද; ලක, ලඞ්කාවෙහි; අතුරු, අන්තරායයන් නැමැති; අඳුරු, අන්ධකාරය; නිසයුරුසෙසින, නිශානාථයා සෙසින්ද; අතුරුනොවදුරුකරන, නිඃශේෂවබැහැරලන්නාවූ; අමින්සත, අප්‍රමේය සත්ව සමූදාය; අමින් රැකි, නෛකවිධියෙන් සංරක්ෂණයකලාවූ; (එහෙයින්ම) සයුරමෙන, සාගරෝපම්වූ; මෙත්සිත්, මෛත්‍රීසහගතචිත්තයෙන්; සෙතකර, ශාන්ත්‍යකොට; බැබිලි, භ්‍රාජිතවූ; කිහිරැලි දෙවිදු වෙත, (ඛදිරදෙහලීවංශොද්භූත) ශ්‍රිවිෂ්ණු දිව්‍යරාජයන් කෙරෙහි-විපුල්වන සිරි, උදාර තර ශ්‍රීසම්පත්තීන්; දෙන, ප්‍රදානයකරන්නාවූ; මෙහසුන් පඬුර, මේ සන්දේශ ප්‍රාභෘතය; දී, දානයකොට; ගුණලකල්වන, ගුණයෙන් අලඞ්කෘතවූ; මිතුරු, මිත්‍රයන් නැමති; කොඳ, කුමුදයන්; නදකරමින්, ප්‍රබොධකෙරෙමින්; යස, කීර්තියෙන්; විපුල්වන, උදාරවන්නාවූ; සියනෑ, සජ්ඣාතිවූ; සියොතුන් සියොවැ, මයුරපක්ෂීන් හා සමග; මොනරිඳුසඳ!, මයුරෙන්ද්‍ර චන්ද්‍රය; උදුල්වන, උජ්ජ්වලවන්නාවූ; යසසින්, කීර්තියෙන්යුක්තව; පවතු, ප්‍රවෘත්තා වන්නෙනි වා.

---

* "අනෙනන කාව්‍යස්‍ය නිත්‍යාද්‍යා ශාස්ත්‍රාදශිෂ ශ්‍රිතාමමම,
සම්ප්‍ර ව්‍යාපෘතෙන මිවාත් නැගෙසෙවජා නුරු පිණිම්"-කාරසමතාලඞ්කාර.

160 කි වි සු රු මත කිරුළු පුරු රැඳි නැනිති ස රු
ගුණ සු රු ගුරුළු ගැමි * ඇඳුරිඳුව මුනුබු රු
කි වි සු රු කිවි පුවල කිපිරස බස මහ රු
මෙ මි යු රු මියුරු සඳෙසය කළ රස සපි රු

---

260. කිවිසුරු, උත්තමකවීන්ගේ; මත, උත්තමාඞ්ගයෙහි; කිරුළුපුරු, කිරීටාකාරයෙන්; රැඳි, රඤ්ජිතවූද; සරු, ස්ථිරවූ; හෙවත් නිශ්චලවූ; නැණිති, ප්‍රඥාවන්තා; ගුණ, ගුණයෙන්; සරු, ශ්‍රෙෂ්ඨවූද; ගුරුළු ගැමි ඇඳුරිඳුව, ගුරුළුගොමිනම් ආචාර්‍ය්‍යස්ථානත්ව; මුනුබුරු, නප්තෘවූද; කිවි, කවීන්ගේ; මහරු, මහාහීවූ; රසබස, රසාත්මක වාක්‍ය රචනායෙහි; (රසවත් කාව්‍යනිර්මාණයෙහි යන අදහසි) පුවල, ප්‍රසිද්ධවූ හෝ ප්‍රාවීණ්‍යයුක්තවූ; කිවිසුරු කිවි, කවීශ්වරනම් කිවිඳු විසින්; රසසපිරු, කාව්‍යරසපරිපූර්ණවූ; මියුරු, මාධුර්‍ය්‍යගුණ යුක්තවූ; මෙ මියුරුසඳෙසය, මේ මයූරසන්දේශය; කළ, කරනලද්දේයි.

---

* "ගුරුළුදූමි"-පැම.

ආචාර්‍ය්‍ය වැලිපටන්විල

දීපඞ්කර තෙර සාමින්වහන්සේ වදාළ

මයූරසන්දේශ සන්න පොතයි.

---

VIDYASAGARA PRINTING WORKS, COLOMBO.

**1. ස ත පා   ගිරිඳු නඳ නෙද සර පිණ්   පා ස**
**ස ස පා   කරන තුනු සිංසර සර   පා ස**
**ස ත පා   සුරැකි සහ දුදනො ද කර   පා ස**
**නෙද පා   සැරද කඳ කුමරිඳු! නොව   පා ස**

---

2. සිරිගත සසුනඹර—පුන්සිසි සිරිනි දුල්   නා
තෙවළා   රුවනකර   නැනමහිනි සිතුයු   රු
අ ල ලා   සතව පදරුත් මිණි දෙන මහ   රු
පුවතර යසවතුරු—උතුරු සත කැල කෙළ   නා

ගොවි දු න්   ල දුන් මිණි නිහි ඔරැඳි උරත   ලී
වි සි දු න්   මු දුන් මිණි මූවරඳන දුලි දු   ලී

තු ල් සොඳ කිරුල් ව න දු ල් පඬිදනත් දූ   රු
දු ල් න   ද වි ම ල් ව න ක ල් සර ගුණෙන් සරු
සි ල් ක ඳ උ දු ල් ව න **සි ල් කඳ අප ඇඳු   රු**
දු ල් ප ද කම ල් ව න ක ල් නමදිම් මහ   රු

---

3. ර හ තු න්   නිමලගුණ රැඳි ලද පදපහ   ස
නි රි දු න්   කිරුළුමිණිමිණිනු දුල සොඳ ලෙ   ස
කි වි දු න්   ඔරැඳි සරසවි වැලඳි සිතු ලෙ   ස
ද න කැ න්   සපිරි දිනිසුරු පුරවර විල   ස

4. සි රි ස ර   සපිරි පරසිඳු රුහුණු පුරව   ර
පි ය ත ර   **වැලිපටන්විල** පියස සිරිස   ර
පු ව ත ර   වෙද සතර මිණිමිතුරු දුලත   ර
ප ර පු ර   පඬිතුලෙක ලද උපත ගුණ ස   ර

5. සි ය බ ස   සකුමගද ඇ සොඳ නෙකබ   ස ය
න තු ලෙ ස   හසළ **දීපඞ්කර** තෙර තො   ස ය
දෙ ද හ ස   සියුරුසිය දෙපණිස් බුදුව   ස ය
න තු ලෙ ස   මෙවියකත කළ මියුරු සඳෙ   ස ය

---

**ශු භ ම ස්තු   ස ඞ් ජ ග තඃ.**

# ශොධන පත්‍රය.

| පිට. | පෙල. | අශුඬ. | ශුඬ. |
|---|---|---|---|
| 1 | 2 | කැළ්මින් *, | කැලුම්න් |
| 1 | 18 | උපන්‍යාශ. | උපන්‍යාස. |
| 2 | 32 | නියමා, | නියම, |
| 3 | 22 | කියනුකිම, | කියනුකිමා, |
| 4 | 26 | නිරතුරු, | නිතොර, |
| ,, | 29 | දනු, | මොහර !, මයූරය !;<br>දනු, |
| 5 | 23 | අවතිණ්ණුයැයි. | අවතිණ්ණියයි. |
| 6 | 29 | කූටාගාරයෙක් (ඇති). | කූටාගාරප්‍රාසාදයෙක් (ඇති). |
| 7 | 23 | නිති, | නිතොර: |
| ,, | 31 | නරෙන්‍ද්‍රය (නුබවහන්සේ) | නරෙන්‍ද්‍රයන්වහන්සේ. |
| ,, | 33 | කරත්තෙහිවා. | කෙරෙයි. |
| 9 | 12 | අනගිම්ණිඅබරණ,<br>අනඝිවූමාණිකාභරණයන්. | අනගිඅබරණ,<br>අනඝාභරණයන්. |
| 10 | 20 | ආදිපාදසවාමිය ! යුශ්මත්තෙම;<br>දූත, ජයග්‍රහණයකරත්තෙහිවා. | ආදිපාදසවාම්තෙම;<br>දූත, ජයග්‍රහණයකරයි. |
| 12 | 30 | පිඤ්ජාක්ෂිත් * | පිච්ඡාක්ෂින්; |
| 13 | 22 | වෙලා, | වෙල, |
| 14 | 27 | හාම්දු, | හම්දුව, |
| ,, | 33 | ඕපත්ඇල්ලේය,. | ඕපත්ඇල්ලේ, |
| 15 | 33 | වතළදුල- | වතලදල- |
| 16 | 9 | ලිලාමත්, * | ලීලාවත් |
| ,, | 34 | සබමැද, | සබමැදව, |
| 18 | 6 | පියත්, | සියත්, |
| ,, | 11 | ශොභාමත්, * | ශොභාවත් |
| ,, | 25 | ආලොකාමත් * | ආලොක |
| 19 | 26 | මාගීයෙන් (ම) | මාගීයෙන් (ම); බැස, ඉවත්ව; |
| 21 | 28 | ඉගිල, ඉගිලි; | ඉපිල, ඉපිලි; |
| ,, | 34 | මෙහිම්, මේසවාමිහු විසින්; | හිමිසඳ, සවාමිඋත්තමයා විසින්; |
| 23 | 9 | ඒ පිළිම්ණිබිතෙනි, | ඒ මිණිබිතෙනි, |
| 24 | 4 | නොකරනුය | නොකරනුව |
| 33 | 14 | පිත්කිරිමෙන්; | පිත්කිරිම හේතුකොටගෙන; |
| 46 | 3 | වෙව්ලා | වෙවුලා |
| 57 | 30 | දියපාත්තියක. | මහාදියපාත්තියෙක. |
| 58 | 29 | ශ්‍රීකදම්බය; | ශ්‍රීකදම්බය; තොහොත් සිරිලක්ෂම් (වනිකාව; හාම්ලේමෙන්; පද්මයෙහිමෙන්; |
| 59 | 31 | තෙමෝ; | තොමෝ; |
| 61 | 15 | සඤ්ජරිතව; | සඤ්චරිතව; |

* මෙවැනි සෙසුතැන්ද මෙසේම සලකත්වා